2017 නොවැම්බර් 09 දින
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**2017 நவம்பர் 09 ஆந் திகதி**
**இலங்கை பாராளுமன்றம்**

**09th November, 2017**
**Parliament of Sri Lanka**

පටුන


| | ඡේද අංක |
|---|---|
| **පූර්විකාව** | **01-13** |
| අප රජයේ පෙර අයවැය කථා | 05 |
| 2015 වර්ෂයේ දැවන්ත ආර්ථික අභියෝගය | 06 |
| රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ තීරණාත්මක හැරවුම | 07-08 |
| ආර්ථික වර්ධන හිතකාමී ප්‍රතිසංස්කරණ | 09-11 |
| නීල හරිත අයවැය : එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා | 12-13 |
| **ලිහිල්කරණය වේගවත් කිරීම** | **14-65** |
| නීල-හරිත ආර්ථිකය | 15-38 |
| නීල ආර්ථිකය | 39-47 |
| තිරසාර කෘෂි හා ධීවර ව්‍යවසායන් දිරිගැන්වීම | 48-65 |
| **එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා** | 66-156 |
| ඉදිරි පරපුරේ දේශීය ව්‍යවසායකයින් | 74-84 |
| දේශීය ව්‍යවසායකයින් ගෝලීය නායකයින් කරා | 85-124 |
| සංචාරක කර්මාන්තය දිරිමත් කිරීම | 125-143 |
| සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම | 144-150 |
| තරුණ ව්‍යාවසායකයන් දිරිමත් කිරීම | 151-156 |
| **සමාජ යටිතල පහසුකම්** | **157-226** |
| 13 වසරක අධ්‍යාපනය | 158-170 |
| ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය | 171-184 |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් | 185-194 |
| සෞඛ්‍ය සම්පන්න ජාතියක් | 195-214 |

| | |
|---|---|
| **නිවාසලාභී සමාජයක් සහ නාගරික කේන්ද්‍ර** | **215-226** |
| **සැමට ආරක්ෂාව** | **227-231** |
| **නීති ප්‍රතිසංස්කරණ** | **232-237** |
| **ප්‍රාග්ධන වෙළඳපල ශක්තිමත් කිරීම** | **238-239** |
| **උරුමය හා සංස්කෘතිය** | **240-248** |
| **රාජ්‍ය අංශය** | **249-261** |
| **සංහිඳියාව** | **262-282** |
| **ජීවන වියදම සඳහා සහාය** | **283-285** |
| **ණය ආපසු ගෙවීමේ විශේෂ බද්ද** | **286** |
| **ආදායම් පරිපාලනය** | **287-296** |
| **රේගුව** | **287-291** |
| **දේශීය ආදායම්** | **292** |
| **සුරාබදු** | **293-295** |
| **කෙටි පණිවිඩ මගින් සිදුකරන ප්‍රචාරණය මත බදු** | **296** |

ඇමුණුම්

| | |
|---|---|
| ඇමුණුම I - ආදායම් යෝජනා 2018 | 38 |
| ඇමුණුම ii- වියදම් යෝජනා 2018 | 39-48 |
| ඇමුණුම iii -දළ ණය ගැනීමේ අවශ්‍යතාවය 2018 | 49 |
| ඇමුණුම iv -අයවැය සාරාංශය (2014-2018) | 50 |
| ඇමුණුම v - කාර්තුමය අයවැය ඇස්තමේන්තුව | 51 |
| ඇමුණුම vi- බදු වියදම් ප්‍රකාශය | 52-54 |
| ඇමුණුම vii-රාජ්‍ය ව්‍යවසායයන්හි ඇස්තමේන්තුගත වාණිජ නොවන බැඳීම් | 55-56 |
| ඇමුණුම viii-තාක්ෂණික සටහන් | 57-75 |
| ඇමුණුම ix-රාජ්‍ය මූල්‍ය අංශයේ මෑත කාලීන වර්ධනයන් සහ ඉදිරි දැක්ම | 76-80 |

ජාතික අයවැය 2018

1 කොටස

## පූර්විකාව

1. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව ස්වකීය 70 වන ජාතික නිදහස සමරන 2018 අප සැමට ඉතා සුවිශේෂී වසරකි. එම ඓතිහාසික මොහොත අභිමුව සිට 2018 වසර සඳහා ජාතික අයවැය ඉදිරිපත් කිරීමට මා හට අවස්ථාව ලැබීම ගෞරවයක් වශයෙන් සලකනවා. මෙය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් මා විසින් ඉදිරිපත් කරන ප්‍රථම ජාතික අයවැයයි. එමෙන්ම, මෙය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ලාගේ මූලිකත්වයෙන් යුත් අපේ යහපාලන ජාතික ආණ්ඩුවේ සිව්වන වසර සඳහා වන අයවැයයි.

2. ගරු කථානායකතුමනි, දීර්ඝ කාලයක් පුරා විදේශ බලවතුන්ට යටත්ව තිබූ අපේ පුංචි දිවයින 1948 පෙබරවාරි 4 වෙනිදා නිදහස හිමිකර ගත්තා. ඒ අවස්ථාවේ දී ශ්‍රී ලාංකිකයන්ට පමණක් නොව මුලු ලෝකයටම අපේ දිවයින පිළිබඳ විශාල බලාපොරොත්තුවක් මෙන්ම විශ්වාසයක් තිබුණා. සිංගප්පූරුවේ හිටපු අග්‍රාමාත්‍ය ලී ක්වාන් යූ මහතාගේ මතක සටහන් තුළ ශ්‍රී ලංකාව ගැන සඳහන් කරන්නේ, නිදහස ලබන විට ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් අතර තිබූ ආදර්ශමත්ම රට හැටියටයි. එපමණක් නොව නිදහස ලැබූ අවස්ථාවේ එංගලන්තයේ ඇතැම් පුවත්පත් පවා ශ්‍රී ලංකාවේ ඇති මිනිස් සම්පත වගේම ස්වභාවික සම්පත් නිසා ඉදිරියේ දී 'පෙරදිග ලෝකයේ ස්විට්සර්ලන්තය' බවට පත්වන බව අනාවැකි පළ කළා. එදා ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය අනුව ආසියාකරයේ අපේ රට දෙවැනි වූයේ ජපානයට පමණි. ඒ අනුව, අනෙකුත් ආසියාතික රටවල් සිටියේ අපට පසුපසිනි.

3. කෙසේ වෙතත්, නිදහස ලබා ගත් දින සිටම එක්ව රට ගොඩනගනවා වෙනුවට අප දේශපාලන මතවාද වශයෙන් බෙදී කුළල් කා ගත්තා. ජාති වශයෙන් බෙදී ගහමරා ගත්තා. ආගම් වශයෙන් බෙදී එකිනෙකාට වෛර කරන්න ගත්තා. ඊටත් වඩා පහත් තත්ත්වයට වැටෙමින් කුල වශයෙන් පවා බෙදභින්න වූවා. මේ නිසාම අවුලෙන් අවුලට ගමන් කළ අපේ රටට පසුගිය වසර 70 තුළ දී බිහිසුණු තරුණ කැරළි දෙකකටත්, දශක තුනක් පුරා දිවුණු දරුණු යුද්ධයකටත් මුහුණ දෙන්න සිද්ධ වුණා. 2009 මැයි මාසයේ දී යුද්ධය අවසන් කිරීමත් සමඟ පරණ වැරදි හදාගෙන, දෙමළ ජනතාවගේ ද හොඳ හිත දිනාගෙන, විවිධත්වය ගරු කරන, නව ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේ අලුත් ගමනක් යෑමට කදිම අවස්ථාවක් උදාවී තිබුණා. එහෙත්, එවකට සිටි පාලකයන් එම ඓතිහාසික අවස්ථාව ස්වකීය ගජමිතුරු චෞර ආර්ථිකය වඩාත් තහවුරු කර ගැනීම පිණිස උපයෝගී කර ගත්තා.

4. 2015 ජනවාරි මස 08 වනිදා, සියළු බාධක මැද අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දුන්නා. භීෂණයෙන් වෙලාගත්තා වූත්, දූෂණයෙන් පිරී ඉතිරී ගියා වූත්, ගසා කෑම ආර්ථික දැක්ම කරගත්තා වූත් ඒ නිසාම ජාත්‍යන්තර වශයෙන් හුදකලා වූත්, මීතොටමුල්ල කුණු කන්දටත් වඩා විශාල ණය කන්දකට උරුමකම් කියනු ලබන රටක් බවට ඒ වන විට ශ්‍රී ලංකාව පත්ව තිබුණා.

## අප රජයේ පෙර අයවැය කථා

5. ගරු කථානායකතුමනි, නව රජයක් ලෙස අපට මුහුණ දීමට සිදු වූ අභියෝගය වුයේ, 2015 වසරට පෙර තිබූ තත්ත්වයන් හමුවේ අප ආර්ථිකය ඉතා කෙටිකාලීන වශයෙන් මුහුණ දුන් අවදානම් තත්ත්වයන් සමනය කිරීමය. ප්‍රජාතන්ත්‍රවාදයේ හා සංහිදියාවේ කුළුණු මත අප විසින් ආර්ථිකයට ස්ථිරසාර පදනමක් දැමූ අතර, නවෝත්පාදන (Innovation) තුළින් මෙහෙයවන සමාජ වෙළඳපල ආර්ථිකයන් ගොඩනැගීමටත් ඒ තුළින් සාධාරණ හා සමානාත්මතා පිළිවෙත් මත ආර්ථික වර්ධනය වේගවත් කිරීමත්

ආරම්භ කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මා මෙහි දී විශේෂයෙන්ම කැමතියි මීට ප්‍රථම මුදල් අමාත්‍ය ධූරය දැරූ ගරු රවී කරුණානායක මැතිතුමා අගය කිරීමට. මක්නිසාද යත්, එතුමා විසින් ගනු ලැබූ කාලෝචිත සහ ඍජු ක්‍රියාමාර්ග නිසා එවකට ආගාධයකට පත්ව තිබූ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ තත්ත්වයන්ගෙන් රට මුදවා ගැනීමට සමත් වූවා. එමෙන්ම ඔහුගේ ක්‍රියාමාර්ගවලින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය යහපත් දිශානතියකට (right track) යොමු වුනා.

## 2015 වර්ෂයේ දුෂ්කර ආර්ථික අභියෝගය

6. ගරු කථානායකතුමනි, අපට මුහුණ දීමට සිදු වූ ප්‍රධානතම ගැටළුව වූයේ ඉතා සීඝ්‍රයෙන් සහ අඛණ්ඩව පහළ යමින් පැවති රාජ්‍ය ආදායම් තත්ත්වය සහ ඉතා අධික වූ රාජ්‍ය ණයබරතාවයයි. එමෙන්ම, වෙනස්වන කාලගුණ තත්ත්වය, විශේෂයෙන් පසුගිය වසරේ අග භාගයේ සිට පැවති දරුණු නියඟ තත්ත්වය ද, වරින් වර ඇති වූ ගංවතුර සහ නායයෑම් වැනි අභියෝගවලට ද අපට මුහුණ දීමට සිදු වුනා. එවැනි අවාසිදායක කාලගුණික තත්ත්වයන්ගේ ආර්ථික බලපෑමේ ප්‍රමාණය 2017 වසරේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 ක් පමණ වෙතැයි ඇස්තමේන්තු කර තිබෙනවා. ඊට අමතරව, ඉල්ලුම් අංශයේ පීඩනයන් උත්සන්න වීමත් සමග ගෙවුම් ශේෂයේ ගැටලුකාරී තත්ත්වයක් ද මතු වුනා.

## රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ තීරණාත්මක හැරවුම

7. ගරු කථානායකතුමනි, එවැනි අභියෝග රාශියක් හමුවේ වුවද, අප විසින් ක්‍රියාත්මක කළ විචක්ෂණශීලී (prudent) ආර්ථික කළමනාකරණ ප්‍රතිපත්තීන්වල යම් සාධනීය ප්‍රතිඵල මේ වන විටත් අපට දැක ගැනීමට ලැබෙනවා. ඉතා කෙටිකාලයක් තුළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අංශයේ තීරණාත්මක හැරවුමක් සනිටුහන් කිරීමට නව රජයක් ලෙස අපට හැකියාව ලැබුණා. රාජ්‍ය ආදායම ශක්තිමත් කිරීම පිණිස ප්‍රතිසංස්කරණ අප හඳුන්වා දුන් අතරම, ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සමඟ ඵලදායී ලෙස සහයෝගයෙන් කටයුතු කිරීමත් සමග ශ්‍රී ලංකාව කෙරෙහි නැති වී තිබූ විශ්වාසය නැවත ඇති කර ගැනීමට අප සමත් වුනා. එවැනි ක්‍රියාමාර්ග නිසා, දශක ගණනාවක් පුරා පහළ යමින් පැවති රාජ්‍ය ආදායම, 2014 වසරේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11.5 මට්ටමේ සිට 2016 වසරේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 14.2 ක මට්ටමකට නංවාලීමටත්, ඒ හරහා රාජ්‍ය ආදායමේ සියයට 41 ක වර්ධනයක් අත් කර ගැනීමට ද හැකි වුණා. 2017 වසරේ දී රාජ්‍ය ආදායම, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15 මට්ටම කරා ළඟා වනු ඇතැයි මා විශ්වාස කරනවා. එය 2016 වසර හා සැසඳීමේ දී රාජ්‍ය ආදායමේ සියයට 13 ක පමණ වර්ධනයකි. තවද, අප මේ වන විට රාජ්‍ය ආදායම සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණ රාශියක් ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඊට, දේශීය ආදායම්, රේගු ආදායම් සහ සුරා බදු ආදායම් ආදී ක්ෂේත්‍රයන් රාශියක් ඇතුළත් වෙනවා. එමඟින්, රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20 මට්ටමක් මධ්‍ය කාලීන වශයෙන් අත්කර ගැනීමට අප බලාපොරොත්තු වෙනවා. එලෙස රාජ්‍ය ආදායම ඉහළ නංවාලමින්, රාජ්‍ය වියදම මනා ලෙස ඉලක්ක ගතව සහ යථාවත් කිරීමත් සමඟ, සමස්ත අයවැය පරතරය 2020 වසර වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.5 ක මට්ටමකට අඩු වනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

8. සමස්තයක් ලෙස ආර්ථික වර්ධනය 2017 වසරේ සියයට 4.5 ක් පමණ වෙතැයි අපේක්ෂා කරන අතර, එය 2020 වන විට සියයට 6 ක් තරම් ඉහළ මට්ටමකට ක්‍රමානුකූලව වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර තිබෙනවා. ඒ සමඟම, විරැකියා අනුපාතය සියයට 4 මට්ටමේ පවත්වා ගැනීමට අපේක්ෂා කරනවා. නිල විදේශ විනිමය සංචිත වර්ධනය කර ගැනීමට අප මේ වන විටත් පියවර ගෙන තිබෙනවා. එමෙන්ම, මෑත මාස කිහිපය තුළ දී දක්නට ලැබුණු සාපේක්ෂ වශයෙන් ඉහළ ගිය උද්ධමනය, සැපයුම් අංශයේ දක්නට ලැබුණු අහිතකර තත්ත්වයන්ගේ බලපෑම සමනය වීමත් සමග, පහළ යනු ඇතැයි අපේක්ෂා කරනවා. ඒ අනුව, මූර්ත පොළී

අනුපාතය සහ සඵල විනිමය අනුපාතය මැදි කාලීන වශයෙන් සමතුලිත තත්ත්වයක් කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කරනවා.

## ආර්ථික වර්ධන හිතකාමී ප්‍රතිසංස්කරණ

9. ගරු කථානායකතුමනි, සාර්ව ආර්ථික ස්ථාවරභාවය වඩා තිරසාර ලෙස ළඟා කර ගැනීමට අඛණ්ඩ ප්‍රයත්නයන් දැරීම අවශ්‍යයි. අප රජයේ *'Vision 2025'* ප්‍රකාශනය ප්‍රකාර ආර්ථික ප්‍රතිසංස්කරණ රැසක් නිෂ්පාදන සාධක වෙළඳපල තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනවා. එහි දී වෙළඳපොළ මූලධර්ම අනුව කටයුතු කරමින් නිෂ්පාදන සාධක මිලකරණයේ පවතින විෂමතා මඟ හරවා ගැනීමත්, දේපළ අයිතීන් තහවුරු කිරීමත් මගින්, කඩිනම් සහ තිරසාර ආර්ථික වර්ධනයක් අපේක්ෂා කරනවා. මැදි කාලීනව සහ ඉන් ඔබ්බට කඩිනම් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට නම් ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රතිසංස්කරණ මගින් එම ක්ෂේත්‍රයේ පූර්ණ විභවතාවය මතු කර ගැනීම අත්‍යවශ්‍ය වේ. ඉඩම් හා දේපළ සම්බන්ධයෙන් මනා හිමිකාරීත්වයක් නොමැතිව කිසිම රටකට කඩිනම් ආර්ථික වර්ධනයක් අත්කර ගත නොහැකිය. සැමට සෞභාග්‍යය අත් කර ගත නොහැකිය. මෙහි දී අප රට තුළ ඉඩම් හා දේපළ හිමිකාරීත්වය පිළිබඳව පවත්නා ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කර ගැනීම සඳහා විමර්ශනයක් මෙන්ම කඩිනම් ඇගයීමක් ද අවශ්‍ය වෙනවා. ආර්ථිකයේ ඵලදායී සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා, කම්කරු නීති ද ඇතුලත් වන පරිදි, ශ්‍රම වෙළඳපල පිළිබඳව අධ්‍යයනය කළ යුතු වෙනවා. රටේ ශ්‍රම ඉල්ලුමේ අවශ්‍යතාවයට ගැලපෙන ශ්‍රම සැපයුම පිළිබඳව පවත්නා ගැටළු සමීප අධ්‍යනයකට නතු කළ යුතුයි.

10. ගරු කථානායකතුමනි, 2025 වන විට අප ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත් වීමට නම් ශ්‍රී ලංකාවට බාධාවලින් තොර සීඝ්‍ර ආර්ථික වර්ධනයක් අවශ්‍ය වෙනවා. මෙහි දී ආර්ථික ලිහිල්කරණය සහ ගෝලීයකරණය යන දෙඅංශය වැදගත් වෙනවා. ශ්‍රී ලංකාවට සැබැවින්ම හිමි විය යුතු වෙළඳ හා වාණිජ කේන්ද්‍රස්ථානීය තත්ත්වය අත් කර ගැනීමට නම් රටෙන් වියැකී ගිය තරඟකාරී විභවතා යළි ප්‍රබෝධමත් කළ යුතුය. දැඩි ආරක්ෂණවාදී මෙන්ම අභ්‍යන්තරයට නැඹුරු වූ ආර්ථික පිළිවෙත් වලින් ශ්‍රී ලංකාව ඉවත් විය යුතුය. වඩා ඉලක්කගතව සහ හඳුනාගත් කාල රාමුවක් තුළ ජාත්‍යන්තර වෙළඳාමේ සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ මත පදනම් වෙමින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම පූර්ණ වෙනසකට ලක් කළ යුතුය. එමෙන්ම, රටේ වර්ධනය දිරිමත් වන ආකාරයට මෙම ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුය. ජාත්‍යන්තර වශයෙන් හුවමාරු කළ නොහැකි භාණ්ඩ නිෂ්පාදන මත අධික ලෙස රඳා පැවතීම නිසා ඉදිරි දශකයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ප්‍රවණතා අභියෝගයට ලක් විය හැකිය.

11. ගරු කථානායකතුමනි, 2015 සැප්තැම්බරයේ පැවති එක්සත් ජාතීන්ගේ 70 වැනි මහා මණ්ඩල රැස්වීමේ දී, 2015 න් පසුව ක්‍රියාත්මක තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට සහ තිරසාර සංවර්ධන ඉලක්කයන් අත් කර ගැනීමට ශ්‍රී ලංකාව පූර්ණ වශයෙන් කැපවී සිටින බවට අතිගරු ජනාධිපතිතුමා සහතික වුණා. මවිසින් අද දින ඉදිරිපත් කරන අයවැය මෙම තිරසාර සංවර්ධන මූලධර්ම මත පදනම් වී ඇති බව සඳහන් කළ යුතුය.

## නීල හරිත අයවැය : එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා

12. ගරු කථානායකතුමනි, **'නීල හරිත අයවැය : එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' යන්න** 2018 වසර සඳහා මාගේ අයවැයේ තේමාවයි. සමුද්‍ර ආශ්‍රිත සියළුම ක්‍රියාකාරකම්හි පූර්ණ ආර්ථික විභවතාවන් (potential) එකතුකර සමස්ත වර්ධන ක්‍රමෝපායන් මත **'නීල'** ආර්ථිකයක් ගොඩනගනවා. පරිසරාත්මක වශයෙන් තිරසාර ක්‍රමෝපායන් මත පදනම් වන **'හරිත'** ක්‍රියාකාරකම් ද සමස්ත වර්ධන ක්‍රමෝපායට ඇතුලත් වෙනවා. අපගේ අතීත මුතුන් මිත්තන් සතුව තිබූ ව්‍යවසායික හැකියාවන් 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා'

වැඩසටහන යටතේ යළි ප්‍රබෝධමත් කරනවා. එමගින් ශ්‍රී ලංකාව ඉතා ආකර්ෂණීය වෙළඳ කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කරනු ලබනවා. සෞභාග්‍යමත් රටක පාර්ශවකරුවන් බවට සියළු ශ්‍රී ලාංකිකයන් පත් කරනු ලබනවා.

13. මධ්‍යකාලීන වශයෙන් ඉලක්කගතව ඒකපුද්ගල ආදායම ඩොලර් 5,000 ක්ද, රැකියා දස ලක්ෂයක් ද, සෘජු විදේශ ආයෝජන ඩොලර් බිලියන 5 ක් ද, අපනයනය දෙගුණ කර ඩොලර් බිලියන 20 ක් අත් කර ගැනීමට ද 2018 අයවැයෙන් පිටුබලයක් සපයනු ලබනවා. 2018 වර්ෂයේ දී ආර්ථික වර්ධනය සියයට 5 ක් දක්වා ඉහළ නැංවීමට ද, උද්ධමනය සියයට 6 ක මට්ටමකට පවත්වා ගැනීමට ද අපේක්ෂා කරනවා. දශක හයක පමණ කාලයකට පසුව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 ක තරම් ප්‍රමාණයක ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් ප්‍රථම වතාවට අත්කර ගැනීමට අපේක්ෂා කරනවා. 2018 සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.5 ක මට්ටමක පවත්වා ගැනීමට ද අපේක්ෂා කරනවා.

II කොටස

## ලිහිල්කරණය වේගවත් කිරීම

14. 1977 වසරේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති අප විසින් හඳුන්වා දුන් අතර පසුගිය දශකයේ දී එහි ගාමක බලය හීන වී ගොස් විවෘත ආර්ථික ප්‍රතිපත්ති ආපසු හැරවීමේ දිශාවකට යොමු වුනා. අපගේ බොහෝ නීති ඉතා පැරණි හා පසුගාමී ඒවායි. රේගු ආඥා පනත ප්‍රථමයෙන්ම හඳුන්වා දී ඇත්තේ 1869 වසරේදීය. සුරාබදු ආඥා පනත 1912 දී ද, අධ්‍යාපන ආඥා පනත 1939 දී ද හඳුන්වා දී තිබෙනවා. මෙම පාර්ලිමේන්තුව මෑතදී නව දේශීය ආදායම් පනත සම්මත කරනු ලැබුවා. එසේ වුවත්, තවත් බොහෝ ප්‍රතිසංස්කරණ කළ යුතුව ඇත. උදාහරණයක් ලෙස, නිවාස අයිතිය හා කුළිය සීමා කරන 1972 අංක 7 දරන කුලී පනත සඳහා සංශෝධන සිදු කළ යුතුය. විවිධ බෝග වගා කිරීමට ඉඩ සැලසෙන පරිදි 1958 අංක 1 දරන කුඹුරු පනත සහ 1973 අංක 42 දරන කෘෂි කාර්මික ඉඩම් පනත සංශෝධනය කරනු ඇත. සේවකයන්ට ස්වකීය අභිමතය අනුව වැඩ කරන පැය ගණන තෝරා ගැනීමට ඉඩ සලසා දීම පිණිස 1954 අංක 15 දරන සාප්පු සහ කාර්යාල පනත සංශෝධනය කරනු ඇත. බුන්වත් (bankruptcy) නීති වඩා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය සංශෝධනයන්ද සිදු කරනු ඇත. වඩා ආකර්ෂණීය හා ගතික වෙළඳ ආර්ථිකයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම පිණිස මෙම යෝජිත සංශෝධන ඉවහල් වන බව මාගේ විශ්වාසයයි. (අලුතින් හඳුන්වා දීමට, අවලංගු කිරීමට හා සංශෝධනය කිරීමට අපේක්ෂිත නීති තාක්ෂණික සටහන්වල ඇතුලත් කර ඇත.)

## නීල-හරිත ආර්ථිකය

15. ගරු කථානායකතුමනි, 2016 ජනවාරියේ මස දී නීල-හරිත සංවර්ධන ක්‍රමෝපාය අප විසින් ඉදිරිපත් කළා. මෙම ක්‍රමෝපාය 2030 දී තිරසාර ඉලක්ක 17 අත් කර ගැනීමට එකඟවූ හෝ 2015 දී පැරීසියේ දී පැවති පාර්ශවකරුවන්ගේ සමුළුවේ දී එකඟවූ තිරසාර සංවර්ධනය පිළිබඳව අපගේ බැඳීම් ඉටු කිරීමට පමණක්ම නොවේ. එය අපගේ පරම්පරාව වෙනුවෙන් පමණක් නොව අපගේ ඉදිරි පරම්පරාව සඳහා ද අප ඉටු කරනු ලබන වඩාත් සාධනීය වගකීමක් ද වනවා. අප ඉදිරිපත් කරනු ලබන නීල-හරිත ආර්ථික වැඩසටහන මගින් දැනට ඌන උපයෝජිත (under-utilized) අපගේ සාගර සම්පත් යොදා ගනිමින් ඉහළ ආර්ථික වර්ධනයක් අත්පත් කරගත හැකි වෙනවා. විශේෂයෙන්, කෘෂිකාර්මික, ධීවර, නිෂ්පාදන අංශයන්හි අලුත් හා තිරසාර තාක්ෂණයන් යොදා ගැනීමෙන් අපගේ ආර්ථික විවිධාංගීකරණ කටයුතු පහසු කරනු ලබනවා. එමගින් පාරිසරික අවදානමත් පාරිසරික තුලනයත් පිළිබඳ පවතින ගැටළු අවම කරනු ලබනවා. ඒ වෙනුවෙන් මා පහත යෝජනා ඉදිරිපත් කරනවා.

16. වාහන ප්‍රතිපත්තිය පිළිබදව දැන් සලකා බලමු. පසුගිය කාලය පුරාවට අපගේ වාහන ප්‍රතිපත්තියේ පවිත්‍ර බවක් හෝ හරිත බවක් තිබුණේ නැහැ. රටේ තිබෙන සියලුම වාහන 2040 වන විට ඛනිජ තෙල් නොවන වෙනත් බලශක්ති මගින් ධාවනය වන වාහන බවට පත් කිරීමට අප යෝජනා කරනවා. මේ අරමුණු ඉටු කර ගැනීම පිණිස රජයේ සියලුම වාහන 2025 වන විට දෙමුහුන් හෝ විදුලියෙන් ධාවනය වන වාහන බවට පරිවර්ථනය කරනු ලබනවා.

17. මේ සන්දර්භය ප්‍රකාරව, ප්‍රමාණවත් දිරි ගැන්වීම් ව්‍යුහයක් හඳුන්වා දෙනු ලබනවා. විදුලි ත්‍රීරෝද රථ සහ බස් රථ ඇතුලුව, විදුලි බලයෙන් ක්‍රියාත්මක වාහන ආනයනය සඳහා ආනයනික බදු අඩු කරනු ලබන අතර, ඛනිජමය ඉන්ධන මගින් ධාවනය වන වාහනවල ආනයන බදු යථාවත් කරනු ලබනවා. එන්ජින් ධාරිතාවය මත පදනම් වූ ආනයනික බදු සූත්‍රයක් හඳුන්වා දෙනවා. මෙමගින් ආනයන ආදායමේ සිදුවන කාන්දුවීම් ද අවම කරනවා.

- ගරු කථානායකතුමනි, විදුලියෙන් ධාවනය වන කාර් සඳහා වන ආනයන බදු අවම වශයෙන් රුපියල් ලක්ෂ 10 කින් අඩුවන අතර ඛනිජමය ඉන්ධන මගින් ධාවනය වන අති සුඛෝපභෝගී කාර් සඳහා වන බදු දළ වශයෙන් රුපියල් ලක්ෂ 25 කින් වැඩි වනු ඇත.
- එන්ජින් ධාරිතාව 2,500 කට වැඩි අධි සුඛෝපභෝගී වාහන සඳහා අප විසින් විශේෂ බද්දක් පනවනවා.
- ඒ සමගම, පරිසර හිතකාමී විදුලි ත්‍රීරෝද රථ භාවිතය දිරිමත් කිරීම පිණිස ඩීසල් මගින් ධාවනය වන ත්‍රීරෝද රථ සඳහා වන ආනයන බදු රුපියල් 50,000 කින් පමණ ඉහළ දමනවා.

18. විදුලි බස් රථ සහ ත්‍රීරෝද රථ ආනයනය සඳහා වටිනාකමට ණය අනුපාතය 90/10 ලෙස සංශෝධනය කරනවා. දේශීය වශයෙන් එකලස් කරන විදුලි කාර් රථ සහ විදුලි බස් රථ සඳහා ද මෙම පහසුකම ලබා දෙනවා.

19. වාහන ආනයනයේ දී, නැව්ගත කිරීමට අවශ්‍ය වන්නා වූ පෙර සහතිකවල කොන්දේසි සංශෝධනය කරන අතරම, විමෝචන සහ ආරක්ෂණ ප්‍රමිතීන් හඳුන්වා දෙනවා.

20. ශ්‍රී ලංගම බස්රථ ඇනියට විදුලි බස් රථ 50 ක් හඳුන්වා දීමෙන් පොදු ප්‍රවාහන පද්ධතිය, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන තත්ත්වයට පරිවර්තනය කිරීමේ ප්‍රමුඛයා බවට පත් කරනවා. පෞද්ගලික බස් හිමියන්ට ද විදුලි බස් රථ යෙදවීම වෙනුවෙන් සානුබල සපයනු ලබනවා. — රු. මිලි. 500

21. ජාතික විදුලි පද්ධතියෙන් බැහැරව සූර්ය බලයෙන් ක්‍රියාත්මක විදුලි ආරෝපන මධ්‍යස්ථාන පිහිටුවීම දිරිමත් කිරීමට සානුබල සපයනවා. මෙම සානුබලයන් කෘෂිකර්මාන්තයට මෙන්ම බිඳිති ජල සම්පාදනය, කුකුළු පාලනය, ටින් කිරීම (canning), වැව්ලි ඇතුලු කෘෂි සැකසුම් කර්මාන්තවලට ද හෝටල් කර්මාන්තයට ද ලබා දෙනවා. — රු. මිලි. 5,300

22. කාබන් බද්දක් හඳුන්වා දීමටත් මා යෝජනා කරනවා. මෝටර් බයිසිකල්, කාර් සහ මගී බස් රථ සඳහා අනු පිළිවෙලින් දිනකට ශත 17 ක්, රුපියල් 1.78 ක් සහ රුපියල් 2.74 ක් වශයෙන් මෙම අනුපාතයන් අදාළ වනවා. මෙම අරමුදල් පරිසරය ආරක්ෂා කිරීම සඳහා යොදවනවා.

23. පොලිතීන් සහ ප්ලාස්ටික් නිෂ්පාදන අධෛර්යමත් කිරීම සඳහා ප්ලාස්ටික් අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් එකකට රුපියල් 10 ක නිෂ්පාදන බද්දක් පනවනවා. කෙසෙල් පට්ටා, තාල වර්ගයේ පත්‍ර, කොහු, උණ බම්බු වැනි දිරාපත්වන අමු ද්‍රව්‍ය භාවිතා කරමින් මලු සහ ඇසුරුම් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා වන පරිසර හිතකාමී විකල්පවලට පරිවර්තනය කිරීම පිණිස පෞද්ගලික අංශය දිරිමත් කරනවා. — රු. මිලි. 75

24. දිරාපත්වන ඇසුරුම් ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන සියලුම යන්ත්‍ර සූත්‍ර උපකරණ, අමුද්‍රව්‍ය සහ අතරමැදි භාණ්ඩ සඳහා වන තීරු බදු ඉවත් කරනවා.

25. ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළුව සඳහා තව දුරටත් අවධානය යොමු කරනවා ඒ අනුවඃ

26. අරුවක්කාලු අපද්‍රව්‍ය බැහැර කිරීම හා කළමනාකරණය කිරීමේ පරිශ්‍රය කඩිනමින් ස්ථාපිත කරනවා. — රු. මිලි. 3,000

27. ප්‍රාදේශීය ප්‍රජාව සහ පෞද්ගලික අංශය සමග එක්ව ඝන අපද්‍රව්‍ය ගැටලුව විසඳීම සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය සහාය ලබා දෙනවා. — රු. මිලි. 50

28. ගංවතුර, නියඟය සහ නායයෑම් වැනි අහිතකර කාලගුණ විපර්යාසවලට අප නිරන්තරයෙන්ම මුහුණ දෙමින් සිටිනවා. අපේ ගං ඉවුරු සහ ගංගා පතුල් විනාශයට ගොදුරු වෙමින් තිබෙනවා. එබැවින්:

29. නාගරික ගංවතුර පාලනය ද ඉලක්ක කරමින් දූනට ක්‍රියාත්මක කාලගුණික තත්ත්වයට ඔරොත්තු දීමේ වැඩසටහන පුළුල් කිරීමේ අවශ්‍යතාවය කැලණි ගංගා ද්‍රෝණියෙන් පෙන්නුම් කරනවා. කෙටිකාලීන පියවරක් වශයෙන් ගංවතුර පාලනය කිරීම පිණිස ආරක්ෂණ බැම්මක් ඒ වෙනුවෙන් ඉදිකරනු ලබනවා. ඒ සඳහා වන දීර්ඝකාලීන පියවරක් වශයෙන් වී ඔය, නාවත, හොලොම්බුව සහ රූකාසල් වැනි ඉහළ ගංගාධාර ප්‍රදේශවල ජලය රඳවාගැනීමේ ධාරිතාව වැඩි කිරීම පිණිස නව බහුකාර්ය ජලාශ ඉදිකරනු ලබනවා. කළු ගඟ, නිල්වලා ගඟ සහ ගිං ගඟ වැනි ගංගාවලද මෙවැනි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය යොමු කරනවා.

රු. මිලි. 4,900

30. පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් රජය සමඟ එකතුවී මේ සඳහා හවුලේ දරනු ලබන වියදම්, සුදුසුකම් ලබන වියදම් වශයෙන් සලකනු ලබනවා.

31. මල්වතු ඔය, කුඹුක්කන් ඔය සහ මාදුරු ඔය යන හඳුනාගත් ගංගා ද්‍රෝණි 3 ආවරණය වන පරිදි භූගත ජල මාපක උපකරණ ස්ථාපනය කිරීම ද ඇතුළත්ව දිස්ත්‍රික් 8 ක් ආවරණය වන පරිදි භූගත ජල මැනුම් 2018 වසරේ දී ද ක්‍රියාත්මක කරනවා. ජල සම්පතෙහි පිරිසිදුභාවය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය අත්‍යවශ්‍ය වනවා.

රු. මිලි. 1,500

32. අපගේ සමහර ජල මාර්ගවල ජල දූෂණ මට්ටම පෙර නොවූ විරූ මට්ටමකට ළඟා වී තිබෙනවා. එය පිටු දැකීමට 'පවිත්‍ර ගංගා ව්‍යාපෘතිය' ක්‍රියාත්මක කරනවා. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් කල්යත්ම කර්මාන්තශාලාවලින් ගංගාවලට නිකුත් කරන අපද්‍රව්‍ය මුළුමනින්ම නවතාලීමට හැකි වෙනවා. කැලණි ගඟට අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කම්හල්වලට පරිසර හිතකාමී ආකාරයට අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීමට පළමුව අවුරුදු පහක කාලයක් ලබා දෙනු ලබනවා. ඔවුන්ට මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සහනදායී ණය පහසුකම් ලබා දෙනවා.

රු. මිලි. 750

33. මනස, ශරීරය සහ අධ්‍යාත්මය යන ත්‍රිත්වයේ සමබරතාවය පවත්වාගෙන යාම අතීතයේ දී පැවති ඇතිනියානු සංකල්පයකි. ඒ අනුව යමින් සෑම ප්‍රාදේශීය සභාවකම ශරීර සුවතා මන්තීරු සහිත හරිත උද්‍යාන (පරිසර හිතකාමී උද්‍යාන) ස්ථාපිත කරනවා. පුස්තකාලයක්, ව්‍යායාම් මධ්‍යස්ථානයක් සහ යෝග භාවනා හා අනෙකුත් අධ්‍යාත්මික කටයුතු කිරීමට හැකි වනු පිණිස විවෘත පියසක් ද මෙම වැඩසටහනට ඇතුලත් වනවා.

රු. මිලි. 1,500

34. මේ සඳහා මාතර නිල්වලා ගඟේ වම් ඉවුරෙහි 'නිල්වලා එළිය' නම් වූ ආදර්ශ උද්‍යානයක් සහ සුවිසල් කලාපයක් ස්ථාපිත කරනු ලබනවා.

රු. මිලි. 1,500

35. අපගේ දෙහිවල සත්වෝද්‍යානයේ පවත්වාගෙන යන 'කුඩු කළ සතුන්' නම් වූ සංකල්පයෙන් බැහැරව, 'විවෘත කුඩු' සංකල්පයට සත්වෝද්‍යාන පරිවර්තනය කිරීමට අවශ්‍ය බැව් සඳහන් කිරීමට කැමතියි. 'නිදහසේ ඉපිද නිදහසේ ජීවත්වන' පරිසරයක් සැකසෙන පරිදි පින්නවල අලි අනාථාගාරය ප්‍රතිසංවිධානය කරනවා.

රු. මිලි. 75

අපගේ අලි ඇතුන් සහ අනෙකුත් සතුන් ඉදිරියේ දී කුඩු නොකර ජාත්‍යන්තරව පිළිගත් උසස් භාවිතයන්ට අනුකූල වෙමින් ඔවුන්ට නිදහසේ ඔබ මොබ යමින් ජීවත්වීමට හැකි පරිසරයක් නිර්මාණය කරනවා.

රු. මිලි. 75

36. පින්නවල සිටින අලි ඇතුන් සඳහා පර්යේෂණ ආයතනයක් අප ස්ථාපිත කරනවා. වන ජීවී සංරක්ෂණ අරමුදල යොදා ගනිමින් ඇත්ගොව්වන් පුහුණු කිරීමේ වැඩසටහනක් පින්නවල ආරම්භ කරනවා.

37. වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති උනහපුළුවා, හඳුන් දිවියා, කැබැල්ලෑවා වැනි අප රටට ආවේනික සතුන් වනජීවී සංරක්ෂණ අරමුදල යොදා ගනිමින් සංරක්ෂණය කරනවා. | රු. මිලි. 20

38. ජංගම දුරකථන කුළුණු සංඛ්‍යාව ඉහළයාමෙන් පාරිසරික මෙන්ම සෞඛ්‍ය උවදුරු ද ඇති කරනවා. එබැවින් මෙවැනි කුළුණු ව්‍යාප්තිය අධෛර්යමත් කිරීම පිණිස එක් කුළුණකට එක් මාසයක් සඳහා රුපියල් ලක්ෂ 2 ක ගාස්තුවක් පනවනු ලබනවා.

## නීල ආර්ථිකය

39. ගරු කථානායකතුමනි, අපට අයත් සාගර පතුල අපේ භූමි ප්‍රමාණය මෙන් 26 ගුණයක් පමණ වෙනවා. එමෙන්ම, සාගර භූමිය සම්පත් අතින් ද ඉහලයි. නීල ආර්ථිකය ප්‍රවර්ධනය පිණිස වූ රජයේ උපාය මාර්ගය බහුවිධ ස්වරූපයක් ගන්නවා. ආයතනික රාමුව ගොඩනැගීමත් පවත්නා ක්‍රියාකාරකම් නංවාලීමටත් වගේම පාරිසරික සමබරතාවයට (ecological balance) හානි නොවන පරිදි සාගර සම්පත් විවිධාංගීකරණය (diversification) ද ඊට ඇතුලත් වෙනවා.

40. සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහිතව ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ යාන්ත්‍රණයක් සකස් කරනවා. | රු. මිලි. 25

41. සංචාරක කර්මාන්තය, ධීවර, ප්‍රවාහන වැනි ක්ෂේත්‍රයන්ට සෘණාත්මක බලපෑමක් ඇති කරනු ලබන වෙරළ ඛාදනය (erosion) හා වෙරළ දූෂණය පිළිබඳ අවදානමට අපේ වෙරළ තීරය ද මුහුණ පා සිටිනවා. ඒ අනුව:

42. සංචාරක සහ ධීවර ක්ෂේත්‍රයන්ට තව දුරටත් අයෝජන අවස්ථා ඇති කිරීමට ඉඩ සලසමින් ගල්කිස්සේ සිට රත්මලාන දක්වා වෙරළ ප්‍රතිශ්ඨාපනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජනා කරනවා. | රු. මිලි. 400

43. වෙරළ ආරක්ෂණ බැම්මක් ඉදිකිරීම, වෙරළ පිරිසිදු කිරීම සහ කඩොලාන නැවත වගා කිරීම ද ඇතුලත්ව මීගමුවේ සිට මාරවිල දක්වා වෙරළ තීරය ආරක්ෂා කිරීම පිණිස ආයෝජන ව්‍යාපෘතියක් අරඹනවා. | රු. මිලි. 800

44. ගරු කථානායකතුමනි, අප රටේ කලපු හා මෝයවල් 116 ක් තිබෙනවා. දේශගුණික බලපෑම් අවම කිරීමටත්, ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමටත්, සංරක්ෂණයට සහාය දැක්වීමටත්, කලපුවලටම ආවේනික වූ පාරිසරික පද්ධතීන් ආරක්ෂා කළ යුතු වනවා. එබැවින්, 2018 දී මීගමුව, රැකව, පුත්තලම, යාපනය, මඩකලපුව, නන්දිකඩාල්, නයාරු, හලාවත, මුන්දලම, ආන්දිකුලම යන කලපු 10 සඳහා රජය විසින් අයෝජනය කරනවා. කලපු පිරිසිදු කිරීම, ධීවරයින්ගේ ජීවනෝපායට සහාය වීම සහ පර්යේෂණ සහ, සංවර්ධනයන් යන කාර්යයන් සඳහා මෙම ආයෝජන යොදවනවා. | රු. මිලි. 1,000

45. හෝටල් සහ අනෙකුත් කර්මාන්තශාලාවලින් කලපුවලට බැහැර කරන අපද්‍රව්‍ය ශූන්‍ය කිරීම තහවුරු කිරීම සඳහා වන තාක්ෂණයන් වෙනුවෙන් ආයෝජනය කිරීමට සහාය වන බවට මා මෙහි දී සඳහන් කරන්න කැමතියි. | රු. මිලි. 250

46. සමුද්‍රාශ්‍රිත වර්ධන උපාය මාර්ගයට අනුකුලව මහාද්වීපික තටකය (continental shelf) පුළුල් කිරීම සඳහා අපේ රජය කටයුතු කරනවා. මෙම පියවර තහවුරු කිරීම පිණිස සියලු පහසුකම් සහිත ස්ථිර ලේකම් කාර්යාලයක් ඒ වෙනුවෙන් ස්ථාපිත කරනු ලබනවා. | රු. මිලි. 25

47. නීල හරිත ප්‍රවේශය වැඩසටහන් නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම සඳහා විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ නාමික මට්ටමෙන් (virtual) නීල හරිත ආයතනයක් ස්ථාපිත කරනු ලබනවා. රු. මිලි. 25

**තිරසාර කෘෂි හා ධීවර ව්‍යවසායන් දිරිගැන්වීම**

48. ගරු කථානායකතුමනි, තිරසාර නොවූ කෘෂිකාර්මික භාවිතයන් කාලයක් තිස්සේ යෙදවීමේ ප්‍රතිඵලයක් ලෙස අඩු ඵලදායීතාවයත් පාංශු භායනයත් (soil degradation) දක්නට ලැබෙනවා. එමෙන්ම, ජලයේ ගුණාත්මකභාවය අඩුවීමෙන් සහ ජල මූලාශ්‍රයන් අභියෝගයට ලක් වීමත් එහි අතුරු ප්‍රතිඵලයි. වඩාත් පරිසර හිතකාමී කෘෂිකර්ම භාවිතයන්ට අනුගත වීමේ දී පැහැදිළිවම ව්‍යුහාත්මක පරිවර්තනයක් අවශ්‍ය වෙනවා. මෙමගින් අපේ පරිසරයට ප්‍රතිලාභ ලැබෙනවා පමණක් නොව නව අපනයන වෙළඳපලවල් ද විවෘත වනවා. පරිසරහිතකාමී ගොවිතැන සහ පරිසර හිතකාමී භාවිතයන් යටතේ සිදුවන නිෂ්පාදනයන්ට ඉහළ මිලක් ගෙවීමට ද දියුණු රටවල් සූදානම්. ඒ සඳහා නිසි දැනුවත් කිරීමක් අවශ්‍යයි. ඒ අනුව, පහත කරුණු යෝජනා කරනවා.

49. අපනයන වෙළඳපල ප්‍රවේශයට පහසුකම් සැලසීම පිණිස පරිසර සහතික වැඩසටහන් ශක්තිමත් කිරීම අවශ්‍ය වනු ඇත. රු. මිලි. 25

50. අතිගරු ජනාධිපතිතුමා සඳහන් කළ පරිදි, වැසි ජලය ක්‍රමවත් ආකාරයට රැස් කිරීම පිණිස කුඩා සහ මධ්‍ය පරිමාණ වැව්වල රොන්මඩ ඉවත් කිරීම සිදු කරනවා. මෙම ව්‍යාපෘති, ප්‍රධාන වශයෙන් වයඹ, උතුර සහ උතුරු මැද පළාත් තුළ ආරම්භ කරනවා. රු. මිලි. 1,000

51. පොලොන්නරුව, කිලිනොච්චිය හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි කෘෂි නිෂ්පාදනයන් රැස් කිරීම සඳහා ඉදිකරනු ලබන ගබඩා 3 හි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමටද, ගුදම් කුවිතාන්සි පදනම මත දැනට ක්‍රියාත්මක වන ගබඩාවල ගුණාත්මකභාවය ඉහළ දැමීම සඳහා ද, දැනට වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන තව දුරටත් වැඩි කරනවා. ගොවියාගේ ආදායම ස්ථායීකරණය (stabilization) තහවුරු කරන බැවින් ගුදම් කුවිතාන්සි ක්‍රමය මත පදනම්ව ගබඩා පවත්වාගෙන යාම ගොවියාට වාසි දායක වනවා. රු. මිලි. 250

52. දේශගුණික හා කාලගුණික සාධක මත ගොවීන් දිගින් දිගටම යැපුනත් සෑම අවස්ථාවකම ඔවුන්ට මුහුණ දීමට සිදු වූ නියඟ හා ගංවතුර තත්ත්වයන්හි දී පැවති රජයන්, කිසිවෙකුටත් අසාධාරණයක් නොවන පරිදි මූල්‍ය ආධාර ලබා දෙනු ලැබුවා. මෙම වාතාවරණය යටතේ කාලගුණ දර්ශක පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයක් සැලසුම් කරනු ලබනවා. මෙම රක්ෂණය මගින් වී, සහ බඩඉරිඟු, සෝයා, ලොකු ළූණු, අල සහ මිරිස් යන භෝග වර්ග 5 ක් ද ඇතුලත් වන පරිදි භෝග වර්ග 6 ක් සඳහා අක්කරයකට රුපියල් 40,000 ක උපරිම ආවරණයක් ලබා දීමට කටයුතු කරනවා. ගොවියා සහ රජය යන දෙපාර්ශවයම දායක වන ආකාරයෙන් මෙම දායකත්ව රක්ෂණ ක්‍රමය සැකසෙනවා. 2018 දී රජය විසින් රුපියල් මිලියන 3,000 ක් මේ සඳහා ආයෝජනය කරනු ලබනවා. රු. මිලි. 3,000

53. එමෙන්ම, නවීන තාක්ෂණ හඳුන්වා දෙමින්ද කාර්ය මණ්ඩලයේ ධාරිතාවය ඉහළ නංවමින් ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව උසස් මට්ටමට පත් කරනවා. දෙපාර්තමේන්තුව විසින් එකතු කරනු ලබන මූලික දත්ත 2018 ජනවාරි පළමුවැනිදා සිට මහජනතාවට නොමිලයේ ලබා දීමට කටයුතු කරනවා. රු. මිලි. 200

54. ඵලදායීතාවය නැංවීමේ දී පාංශු භායනය (soil degradation) ප්‍රධාන ගැටලුවක් වී තිබෙනවා. එබැවින්, ඛාදනය වූ පස නැවත යථා තත්ත්වයට පත් කිරීම සහ පස සාරවත් කිරීමට උදව් වන පොහොර වර්ගයන් වැඩි දියුණු කිරීමට සහ පාංශු රු. මිලි. 50

කළමනාකරණ භාවිතයන් වැනි ක්ෂේත්‍රයන්ට මැදිහත්වීමට ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයට (SLINTEC), කාර්මික තාක්ෂණ ආයතනයට (ITI) සහ ජාතික විද්‍යා පදනමට (NSF) තව දුරටත් අවශ්‍ය සහාය ලබා දෙනවා.

55. ඉහළ තාක්ෂණික කෘෂි භාවිතයන් නංවාලන හරිතාගාර තාක්ෂණය ද ඇතුලත් වන පරිදි තෝරාගත් උපකරණ ආනයනයට ගැනෙන ජාතිය ගොඩනැගීමේ බදු ඉවත් කරනවා.

56. කෘෂිකර්මාන්තයට අදාල පසු සබඳතා කටයුතු වෙනුවෙන් (backward Integrated Activities) සියයට 14 ක සහනදායී ආදායම් බදු අනුපාතයක් හඳුන්වා දෙනවා.

57. ධීවර කර්මාන්තය සඳහා වන යෝජනා මෙසේය:

58. බහුදින යාත්‍රාවල පසු අස්වනු හානි අවම කිරීම පිණිස යොදා ගනු ලබන ශීතාගාර ගබඩා තාක්ෂණය ආදිය වෙනුවෙන් කරනු ලබන වියදමින් සියයට 50 ක් රජය විසින් දරනවා. රු. මිලි. 175

59. ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම දිරිමත් කිරීම පිණිස අඩි 55 ට වඩා දිග බහු දින යාත්‍රාවලට ගැනෙන පිරිවැයෙන් සියයට 50 ක් රජය විසින් දරනවා. රු. මිලි. 400

60. හලාවත, මිරිස්ස, කරෛයිනගර් සහ පුරාණවැල්ල ධීවර වරායන් වැඩි දියුණු කිරීමට ආයෝජනය කරන අතරම, ධීවර වරායන්ගේ නැංගුරම්පලවල් සහ ගොඩබසින ස්ථාන දියුණු කරනවා. රු. මිලි. 1,750

61. වෙල්ලමන්කර නව ධීවර වරායක් ගොඩනගන අතර ගන්දර ධීවර වරායද සංවර්ධනය කරනවා. රු. මිලි. 200

62. 2017 දී ආරම්භ කරන ලද වෙරළ ප්‍රදේශවල ධීවර ගම්මාන වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කරන අතර, 'වැවක් සහිත ගමක්' වැඩ සටහන තවදුරටත් ක්‍රියාත්මක කරනවා. රු. මිලි. 450

63. මිල්ක් ෆිෂ් සහ විසිතුරු මසුන් අභිජනන (hatchery) මධ්‍යස්ථානයක් බංගදෙනියේ ස්ථාපිත කරනවා. රු. මිලි. 100

64. කිලෝ ග්‍රෑමයකට ඇමෙරිකන් ඩොලර් 1,000 ක් පමණ ඉපයීමට හැකි, සකසන ලද මුහුදු කුඩැල්ලන් සඳහා අපනයන වෙළඳපලේ විශාල ඉල්ලුමක් පවතිනවා. එබැවින් මුහුදු කුඩැල්ලන් ඇල්ලීම සහ සැකසීම සඳහා කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පූනකරීහි විශේෂිත නිෂ්පාදන කලාපයක් ස්ථාපිත කරනු ලබනවා. ඒ සඳහා පෞද්ගලික අංශයට අවශ්‍ය වන ඉඩම් ලබා දෙනවා.

65. මඩකලපුව දිස්ත්‍රික්කයේ ආදර්ශ ජලජීවී කර්මාන්ත උද්‍යානයේ යටිතල පහසුකම් සම්පූර්ණ කරනු ලබනවා. මන්නාරම සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි ද මේ හා සමාන උද්‍යාන ස්ථාපිත කරනවා. රු. මිලි. 250

### එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා

66. ශ්‍රී ලංකාව කාලාන්තරයක් තිස්සේ ලෝකය සමග ගනුදෙනු කරන වාණිජ කටයුතුවල නිරත ජාතියක් වූ අතර සුප්‍රසිද්ධ දේශීය ව්‍යාපාරිකයන්, ව්‍යාවසායකයන් සහ ධනවතුන් ඉන් බිහිවුණා. ඉතිහාසගත වාර්තා හෙළිදරව් කරන සාක්ෂි අනුව අප රට චීනය, උතුරු අප්‍රිකාව බටහිර ආසියාව සහ යුරෝපීය රටවල් සමග මුහුදු මාර්ග ඔස්සේ වෙළඳ ගනුදෙනු සිදු කර තිබෙනවා.

67. අනුරාධපුර, පොළොන්නරුව, මන්නාරම සහ යාපනය සහ දකුණු ප්‍රදේශවල කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම්වලදී බුරුමය, චීනය, ඊජිප්තුව, රෝමය සහ වැනීසිය

යනාදියෙන් ගෙනෙන ලද කාසි හමු වී ඇත. දීර්ඝ කාලයක් තිස්සේ පෙරදිග සහ අපරදිග සමග වාණිජ කටයුතු පැවති බව එම සාක්ෂිවලින් සනාථ වෙනවා.

68. ධනවත් ශ්‍රී ලාංකිකයින් වඩාත් මිල අධික අශ්වයන් අලෙක්සැන්ඩ්‍රියාවෙන් මිල දී ගෙන ඇති බවට ඓතිහාසික වාර්තාවල වැඩි දුරටත් සඳහන් වෙනවා. ශ්‍රී ලංකාවේ මුතු මැණික්, ඇත්දළ සහ කුළු බඩු සඳහා චීනයෙන් පමණක් නොව රෝමානු අධිරාජ්‍යයෙන් ද, ඊජිප්තු පාරාවෝවරුන්ගෙන් ද, විශාල ඉල්ලුමක් පැවති බවට සාක්ෂි පවතිනවා. ඉහත සාක්ෂි මගින් පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයක්ව පැවති බවයි.

69. එබැවින්, අපේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකිකයින් සතුව ඓතිහාසිකව පැවති සහජ ව්‍යාපාරික නිපුණතාවයන් ප්‍රයෝජනයට ගෙන 'ව්‍යවසායකත්ව පාරාදීසයක්' නැවත ගොඩනැගීමයි. ශ්‍රී ලංකාවේ මෙම ඉදිරි ගමන සාර්ථක වන්නට නම් පෞද්ගලික අංශයේ සහයෝගය ප්‍රමාණවත් නොවේ. සියලුම ශ්‍රී ලාංකිකයින් 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' ප්‍රවේශයේ පාර්ශවකරුවන් වීම අත්‍යවශ්‍ය වෙනවා.

70. රජයේ වගකීම ව්‍යාපාරික කටයුතුවල නියැළීම නොව සැමට සාධාරණ හා සමානව කටයුතු කිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කර දීමෙන් සියලු පුරවැසියන්ට සාර්ථක වීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දීමයි.

71. දැනටමත් ව්‍යාපාර කටයුතුවල නිරත විශාල පෞද්ගලික ව්‍යාපාරවලට පමණක්ම නොව, අපගේ ආර්ථික ව්‍යුහයේ වර්ධන යාන්ත්‍රණය වන සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ටත්, ස්වයං රැකියාවල නියුතු වූවන්ටත්, ත්‍රිරෝද රථ ධාවකයින්ටත්, සිල්ලර වෙළඳාමේ යෙදන කඩහිමියන්, සුළු ව්‍යාපාර පවත්වාගෙන යන කාන්තාවන්ටත්, තොරතුරු තාක්ෂණය පදනම් කරගත් තරුණයන්ගේ ව්‍යාපාරවලටත් අවශ්‍ය පහසුකම් 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' වැඩසටහනින් සපයනවා.

72. තරගකාරී වෙළඳපල පරිසරය තුළ මේ සැම දෙනාම සාර්ථක වන්නේ නැහැ. එසේ වුවත් ඒ අය නොසලකා හැරිය නොහැක. රජය විසින් සමාජ ආරක්ෂණ ජාල යාන්ත්‍රණයක් තුළින් අවදානම් දරන ව්‍යවසායකයින් රැක බලා ගත යුතුයි.

73. අන් කවරදාකටත් වඩා නව තාක්ෂණය භාවිත කිරීම මගින් සාර්ථක වීම සඳහා ඉතා විශාල ඉඩ ප්‍රස්ථා වර්තමානයේ පවතිනවා. අප දන්නා පරිදි අවශ්‍ය දැනුම, තාක්ෂණය සහ සැලසුම් පමණක් නොව උත්සාහය සහ ධෛර්යයත් අපගේ තරුණයින් සතුයි. රට සංවර්ධනය කිරීමේ දැක්මක් ඇති රජයක් වශයෙන් මහජනතාවට මාළු කුරියෙක් දී කුසගිනි නිවා ආර්ථික වශයෙන් අකර්මන්‍ය කර රජය මත යැපීමේ තත්ත්වයට පත් කිරීම අපගේ අපේක්ෂාව නොවේ. ඔවුන්ට බිලී පිත්තක් දී ආර්ථිකය සරුකරගෙන යහපත් ජීවිතයක් ගත කිරීමේ වටපිටාවක් සකස් කර දීම රජයේ අපේක්ෂාවයි. එසේම, රටක ජනතාවට ආඩම්බර විය හැකි සාර්ථක ගමනක් වෙනුවෙන් රජයක් උදව් කළ යුතුයි. මේ අනුව අපගේ ක්‍රමෝපායන් පහත දැක්වෙනවා.

## ඉදිරි පරපුරේ දේශීය ව්‍යවසායකයින්

74. අප ආර්ථිකයේ කොඳු නාරටිය විය යුත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික අංශයයි. කෙසේ වෙතත්, ප්‍රාග්ධන හිඟකම හෝ ප්‍රාග්ධනය ලබා ගැනීමට ඇති දුෂ්කරතා එනම්, අධිකතර ප්‍රාග්ධන පිරිවැය ද, ඇප ලබා දීමේ ගැටළුව ද හේතුකොටගෙන මෙම අළුතින් බිහිවන ව්‍යාපාර මෙන්ම කුඩා හා මධ්‍යම මට්ටමේ ව්‍යාපාර දියුණු වන්නේ නැහැ. අපගේ අරමුණ වන්නේ, කිසිම ව්‍යාපාරිකයෙකුට ඇප තැබීමට නොහැකි වීම හේතුවෙන් ණය පහසුකම් සැලසීම ප්‍රතික්ෂේප වීමට ඉඩ නොතැබීමයි. ව්‍යාපෘති යෝජනාවන් හි ශක්‍යතාව සැලකිල්ලට ගෙන ඔවුන්ට අවශ්‍ය

රු. මිලි. 10,000

දිගු කාලීන මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඉඩකඩ වැඩි කිරීමයි. සැබවින්ම, යහපත් ව්‍යාපාරික අදහසකට ඊට හිමි අභිමානය සහ ස්ථානය ලබා දිය යුතුයි. මේ සඳහා ආනයන අපනයන අංශයක් ද සහිත සංවර්ධන බැංකුවක් ස්ථාපිත කරනවා. එයින් පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින්හට දැඩි අවශ්‍යතාවයක්ව පවතින දිගුකාලීන ණය පහසුකම් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. මෙම බැංකුව ස්ථාපිත කරන තුරු දැනට පවතින ණය යෝජනා ක්‍රම ඉලක්කගතව ක්‍රියාත්මක කරනු ඇත.

75. සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යවසායකයින්ට උපකාර කිරීම සඳහා ඉතා අඩු පොළී ණය යෝජනා ක්‍රම 8 ක් 2017 වර්ෂයේ දී හඳුන්වා දී ඇත. රු. මිලියන 15,000 ක් පමණ යොදවමින් මෙම ණය යෝජනා ක්‍රම ශක්තිමත්ව තව දුරටත් පවත්වාගෙන යනු ලබනවා. මෙම ණය යෝජනා ක්‍රම සහ රජයේ සහාය ලබා ක්‍රියාත්මකවන වෙනත් ණය යෝජනා ක්‍රම සියල්ල එකතුකොට 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය' සකස් කරනු ලබනවා. මෙම යෝජනා ක්‍රම සඳහා වන පොළී සහනාධාරය රජය විසින් දරනු ඇත. රු. මිලි. 750

76. මෙම පසුබිම යටතේ, ජාතික දිළිඳුකම සහ විරැකියාව තුරන් කිරීමේ වැඩසටහනේ අංශයක් වන අතිගරු ජනාධිපතිතුමාගේ ග්‍රාමශක්ති වැඩපිළිවෙලට අනුකූලව දැනටමත් කුඩා ව්‍යාපාරවල නියැළි පුද්ගලයන්ට, ගොවීන්ට, ධීවරයින්ට, තරුණ තරුණියන්ට හා කාන්තාවන්ට, තනි තනිව හෝ ප්‍රජා කණ්ඩායම් ලෙස හෝ ක්‍රියාත්මක වැඩසටහන් සඳහා සහන සලසනවා. ඔවුන්ගේ ව්‍යාපාරික කුසලතා දියුණු කර ගැනීම සඳහා රජය විසින් දෙනු ලබන ආධාර තව දුරටත් ව්‍යාප්ත කරනවා. මේ සමඟම ප්‍රාදේශීයව පවතින ගැටළු නිරාකරණය සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් හඳුන්වා දී ඇති සංවර්ධන වැඩසටහන් තව දුරටත් ශක්තිමත් කරනු ලබනවා. රු. මිලි. 2,200

77. 2018-2020 කාලය තුළ, අප විසින් කෘෂි හා ධීවර සමාගම් 50 ක්, කාන්තාවන්ට වැඩි අයිතියක් හිමි සමාගම් 25 ක් සහ තරුණ කේන්ද්‍රගත නව ව්‍යාපාර 150 ක් ආරම්භ කිරීමට සහාය වනවා. මෙම සමාගම්, අවම වශයෙන් කොටස්කරුවන් 10 දෙනෙකුගෙන් වත් සමන්විත විය යුතු අතර සෑම කොටස්කරුවෙක්ම රුපියල් 10,000 ක අවම ප්‍රාග්ධනයක් ආයෝජනය කළ යුතු වෙනවා. 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය' මගින් මෙම සමාගම්වලට ප්‍රදාන සහ ණය ලබා දෙනවා. එසේම, මූල්‍ය නොවන පහසුකම් ද ඇතුලත් පරිපූර්ණ වැඩසටහනක් මේ වෙනුවෙන් ක්‍රියාත්මක කරනවා. රු. මිලි. 500

78. 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය' මගින් කාන්තා ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා අන් අයට වඩා අවම වශයෙන් සියයට 10 කට වැඩි පොළී සහනයක් යටතේ ණය පහසුකම් සැලසීමට කටයුතු කරනු ලබනවා. රු. මිලි. 50

79. වෙනස් වූ හැකියාවන් සහිත (differently abled) අයට, අන් අයට වඩා වැඩිපුර සියයට 15 ක පොළී සහනාධාරයක් සමග ඔවුන්ගේ ව්‍යවසාය කුසලතා වැඩි දියුණු කර ගැනීම සඳහා 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය' ට පිවිසීමට අවස්ථාව ලබා දෙනවා. රු. මිලි. 15

80. අප විසින් කුඩා හා මධ්‍යම ව්‍යවසායකයින්ගේ ණය ලබා ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම පිණිස ඇපකර ලබා ගැනීමට හැකිවන පරිදි කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායක ඇපකර අරමුදලක් පිහිටුවනු ලබනවා. රු. මිලි. 500

81. නව ව්‍යාපාර අදහසක් සඳහා එක් පුද්ගලයෙකුට වර්ෂයකට රුපියල් මිලියන 1.5 බැගින් වූ භාණ්ඩාගාර ඇපකරයක් සහිත ණය පහසුකම් සලසා දෙමින් 'ඇරඹුම ණය යෝජනා ක්‍රමය' තවදුරටත් ක්‍රියාත්මක කරනු ලබනවා. රු. මිලි. 25

82. තොරතුරු තාක්ෂණය හා තොරතුරු තාක්ෂණයට සම්බන්ධ අංශවලට ඉදිරි වර්ෂ 5 තුළ ඇමෙරිකන් ඩොලර් බිලියන 5 ක අපනයන ආදායමක් උපයා ගත හැක. මේ අනුව, මෙම කර්මාන්තයට විශේෂයෙන්ම කුඩා හා මධ්‍යම පරිමාණයේ තොරතුරු තාක්ෂණ සමාගම්වලට උපකාර කිරීම පිණිස 'තොරතුරු තාක්ෂණ ඇරඹුම' ක්‍රියාත්මක කරනු ඇත. මේ සඳහා අරමුදලක් ස්ථාපනය කරනවා. මෙහි මූලාරම්භය අපනයන සංවර්ධන මණ්ඩලය තුළින් ක්‍රියාත්මක කරන අතර ඉදිරි වර්ෂ 5 තුළ රුපියල් බිලියන 3 ක් අයෝජනය කරමින් පහත සඳහන් ක්ෂේත්‍රවලට සහාය වනවා. රු. මිලි. 300

- දේශීය නව ව්‍යාපාර සහ විදේශ නව ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීමට
- සුළු හා මධ්‍යම පරිමාණයේ තොරතුරු තාක්ෂණ සමාගම් වෙත
- දනුම හා කුසලතා නංවාලීමට සහාය වෙමින් ද, නව ව්‍යාපාර ප්‍රවර්ධන ද ඇතුලත් වන පරිදි ව්‍යාපාර සංවර්ධනය සඳහා යෝග්‍ය පරිසරයක් සැකසීම තුළින් ආරම්භක අවස්ථාවේ පවත්නා තොරතුරු තාක්ෂණ කර්මාන්ත රැක ගැනීමේ ඒකක දේශීය විශ්වවිද්‍යාලවල ආධාරයෙන් ආරම්භ කිරීම.

83. තොරතුරු තාක්ෂණ ඇරඹුම යටතේ ව්‍යාපෘති සඳහා ආරම්භයේදීම පහත සඳහන් ආකාරයෙන් මූල්‍ය පහසුකම් සලසනු ඇත.

- නව ව්‍යාපාර (Hatch Incubators) ආරම්භයේ සිට මාස 24 ක් දක්වා කුලී වියදමෙන් සියයට 50 ක සහනයක් ලබා දීම. ඕනෑම පෞද්ගලික ව්‍යවසායයෙකුට එවැනිම සහනයක් අනාගතයේ දී ලබා දීම
- කොළඹ සහ මොරටුව විශ්වවිද්‍යාලයන් හා SLIIT ආයතනය විසින් තොරතුරු තාක්ෂණ ව්‍යාපාර සමඟ ඒකාබද්ධව කෘතිම බුද්ධිය, (artificial intelligence) රොබෝ තාක්ෂණය, දත්ත විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව, පරිගණක භාෂා සංවර්ධනය ආදී පුහුණු පාඨමාලාවන් පවත්වනවා ඇත. මෙම පාඨමාලාවන් සාර්ථකව නිම කරන අයට රැකියා අවස්ථා ලබාදීම පෞද්ගලික අංශය මගින් සහතික කෙරෙනවා. මෙම පාඨමාලා සඳහා වන වියදම කර්මාන්තය සහ යෝජිත 'තොරතුරු තාක්ෂණ ඇරඹුම' වැඩසටහන මගින් දරනු ලබනවා.

84. සහාය අපේක්ෂා කරන අපනයනකරුවන්ට හා 'තොරතුරු තාක්ෂණ ඇරඹුම' යටතේ ක්‍රියාත්මක ව්‍යාපාරවලට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් සඳහා වූ ඇපකර අරමුදල මගින් සහාය වනු ඇත.

**දේශීය ව්‍යවසායකයින් ගෝලීය නායකයින් කරා**

85. ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර වෙළඳපොලට පිවිස ඇති අප පෞද්ගලික අංශයේ ව්‍යාපාර අගය කරන අතර මේ වෙනුවෙන් තව දුරටත් අපට කළ හැකි බොහෝ දේ තිබෙනවා. තීරු බදු මගින් දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම ඇතුලුව අප විසින් නොයෙකුත් උපාය මාර්ග අත්හදා බලා ඇත. විදේශ ආයෝජකයින් තෝරාගත් අංශවලට ප්‍රවේශවීම වළකාලන නීතිරීති අප රටෙහි තිබෙනවා. දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ තරඟකාරීත්වය වළක්වාලමින්, විදේශ ව්‍යාපාර රටතුලට පැමිණීමට බාධා ගෙනදෙන ව්‍යාකුල කම්කරු නීති තිබෙනවා. නිලධාරීවාදය හරහා ද විදේශ ආයෝජනවලට බාධා පැමිනෙනවා. වෙළඳ ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණයන් ජාතික තරඟකාරීත්වය සඳහා අත්‍යවශ්‍ය අංශයක්. වෙනත් වචනවලින් කිවහොත් තරඟකාරීත්වය විසින් සාර්ථකත්වය ජනිත කරනු ලබනවා. අපගේ රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාර නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීම සහ රේගු බදු

නොවන ආනයන බදු ඉවත් කිරීම දේශීය කර්මාන්තවලට තර්ජනයක් ලෙස නොදැකිය යුතු බව දේශීය පෞද්ගලික අංශයට ප්‍රකාශ කිරීමට කැමතියි.

- ආර්ථික ලිහිල්කරණ හා ගෝලීයකරණ ප්‍රතිපත්තියට අනුකූලව දැනට තීරු බදු අය නොකරන භාණ්ඩ ලැයිස්තුවට අදාළ තීරු බදු නොවන ආනයන බදු ඊළඟ වසර 3 තුළ දී අහෝසි කිරීමට කටයුතු කරනු ඇත.
- භාණ්ඩ වර්ග 100 කට අදාළ රේගු නොවන බදු පසුගිය වසරේ ඉවත් කළ අතර තවත් භාණ්ඩ 1200 ක මෙවැනි බදු ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. ( මෙම ලැයිස්තුව තාක්ෂණික සටහන්වල දක්වා ඇත.) කෙසේ වෙතත්, රේගු බදු නොවන ආනයන බදු ඉවත් කිරීම අදියර කිහිපයකදී කිරීමට බලාපොරොත්තු වනවා. මෙය ලෝක වෙළඳ සංවිධානය සමඟ ඇති බැඳීම්වලට අනුව අප විසින් ඉටු කළ යුතු කරුණුවලට අනුකූල වේ. නව ක්‍රමයට අනුගත වීම සඳහා දේශීය පෞද්ගලික අංශයට සහන සහ ආධාර ලබා දීම පිණිස අන්තර්කාලීන ගැලපුම් වැඩසටහනක් හඳුන්වා දෙනු ලබනවා.
- වෙළඳපල තුළ ශක්තිමත් ප්‍රතාපන හා ප්‍රතිතෝලන නීති (Anti Dumping and Counterveling Laws)සමඟ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ නීති හඳුන්වා දෙනවා. භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය තහවුරු කිරීමට පියවර ගන්නවා.

86. මේ සමඟම පෞද්ගලික අංශය පරිමාණයෙන් වර්ධනය වීමට සහ ඔවුන්ට සමාන තත්ත්වයෙන් කටයුතු කිරීමටත් එමගින් කර්මාන්තවල වර්ධනය සහ පාරිභෝගිකයින්ගේ අයිතිය ආරක්ෂා කිරීමට ඉවහල් වන පරිද්දෙන් සමාගම් ඒකාබද්ධ වීම මෙන්ම ඒකාධිකාරී ලෙස කටයුතු කිරීම වළක්වාලීමට අවශ්‍ය තරඟ විරෝධී චර්යාවන් පිළිබඳ නීති රීති හඳුන්වා දෙනු ලබනවා.

87. පුද්ගලික අංශය දිරිමත් කිරීමේ අංගයක් ලෙස ජාතික අපනයන ක්‍රමෝපාය තුළ හඳුනාගත් වර්ධන ප්‍රවනතා ඇති කර්මාන්ත නංවාලීමට කටයුතු කරනවා. ඒ අනුව, ජාත්‍යන්තර වෙළඳපලට දැනටමත් ප්‍රවේශ වී ඇති කර්මාන්ත තවත් නංවාලීමට ආධාර කරනවා. එමෙන්ම, හැකියාව ඇති එහෙත් මෙතෙක් ජාත්‍යන්තර වෙළඳපලට ප්‍රවේශ වී නොමැති කර්මාන්තවලට ද ජාත්‍යන්තර වෙළඳපලට ඇතුලුවීමට උදව් කරනු ලබනවා.

88. වෙළඳ ගැලපුම් වැඩසටහනේ කොටසක් ලෙස අප විසින් අපනයන වෙළඳපල පිවිසුම් සහායක වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. එමගින් දැනටමත් වර්ෂයකට ඇමරිකන් ඩොලර් මිලියන 10 කට වඩා අඩු අපනයන වටිනාකමක් සහිත දේශීය සමාගම්වලට ද ගෝලීය වෙළඳ දාමයට පහසුවෙන් බැඳීමට හැකි විදේශ වෙළඳපලට අලුතින් පිවිසෙන අයට ද පහසුකම් සැලසෙනු ඇත. මෙම වැඩසටහන මඟින් පහසුකම් සැලසෙන්නේ,

89. නොමිලේ ලබා දෙන වෙළඳ සාම්පල්වල පිරිවැය, බුද්ධිමය දේපල ලියාපදිංචි කිරීම, පිටරට දී දරණ රක්ෂණ සහ වෙළඳ ප්‍රවර්ධන ආදිය වෙනුවෙන් දරන පිරිවැය පියවීමට පහසුකම් සලසනවා.

90. සාප්පු හෝ රාක්ක ඉඩකඩ සඳහා විදේශවලදී කුලී මුදල් ගෙවිය යුතු දේශීය සන්නාම සහිත භාණ්ඩ විදේශ වෙළඳපලට පිවිසෙන විට, මාස 36 ක කුලී මුදල් සහනයක් ලෙස ලබා දීම. මේ වෙනුවෙන් රුපියල් මිලියන 800 ක් අපනයන වෙළඳපල ප්‍රවේශ වැඩසටහන යටතේ වෙන් කරනු ලබනවා. රු. මිලි. 800

91. තාක්ෂණය සහ දැනුම අපනයනකරුවන්ට ලබා දීම ඇතුළු අපනයනයකරුවන්ගේ භාණ්ඩ සංවර්ධන කටයුතු සඳහා 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය' මගින් පහසුකම් සලසනවා.

92. අපනයන හැකියාව ඇති එහෙත් මූල්‍ය පහසුකම් නොමැති, දැනටමත් ණය තොරතුරු කාර්යාංශයට (CRIB) වාර්තා වී ඇති කුඩා හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට කුඩා හා මධ්‍ය පරිමාණ ඊකවරණ අරමුදලේ සහායෙන් බැංකු මගින් මූල්‍ය පහසුකම් සලසනවා.

93. ජාත්‍යන්තර සහතික කරන ආයතනවලට අනුකූලවන පරිදි ජාතික තත්ත්ව පහසුකම් නංවාලීමේ අපගේ ප්‍රතිපත්තියට අනුගත වෙමින් කර්මාන්ත තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික ශාඛ හා සත්ව නිරෝධායන මධ්‍යස්ථානය සහ ජාතික ජලජ සම්පත් හා පර්යේෂණ ආයතනය ආදී ආයතනයන් පවත්වන පර්යේෂණ ඉහළ තත්ත්වයට පත් කරනු ලැබේ. අපගේ නිෂ්පාදන ගෝලීය වෙළඳපලවල පිළිගත හැකි මට්ටමකට පත් කිරීමත්, යෝජිත ආනයන පරීක්ෂණ සහ පහසුකම් සැලසීමත් මෙම යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරනු ඇත. රු. මිලි. 250

94. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය උසස් තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන අතර අවශ්‍ය පහසුකම් ද සලසනු ලබනවා. රු. මිලි. 25

95. ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා සහ ව්‍යාපාරිකයාගේ සිට පාරිභෝගිකයා දක්වා ගනුදෙනු ඉලෙක්ට්‍රොනික ක්‍රමවේද හරහා පහසු කිරීම (e-commerce) පිණිස ආයෝජන මණ්ඩලය සහ රේගු දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි 1 වන දින වන විට වැඩ පිළිවෙලක් හඳුන්වා දෙනු ඇත.

96. ඉතා ඉහළ වර්ධන හැකියා ඇති ඉදිරිපෙළ සේවා, පිවිසුම් වෙළඳාම, ගබඩා, විවිධ රටවල් සම්බන්ධ කරගනිමින් කරනු ලබන වෙළඳාම් සහ අක් වෙරළ ව්‍යාපාර, ඇතුලත් භාණ්ඩ හුවමාරු කේන්ද්‍රයක් ඇති කිරීම කෙරහි අවධානය යොමු කිරීමට කැමතියි (Logistics Hub) . කෙසේ වෙතත්, වර්ධන හැකියාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නම් අදාළ සමහර රෙගුලාසි සංශෝධන කළ යුතු වනවා. එවැනි සංශෝධනවලට කාරක ප්‍රාග්ධනය, නිශ්චිත කලාප දියුණු කිරීම සහ යාවත්කාලීන කරන ලද මාර්ගෝපදේශ හඳුන්වා දීම ද ඇතුලත්ව පවත්නා ආයෝජන ක්‍රමවේදය ලිහිල් කිරීම ද කළ යුතු වනවා.

97. නූතන භාණ්ඩ හුවමාරු සහ නාවික කර්මාන්තයේ ඉල්ලුමට මුහුණ දීම පිණිස 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරී පනත සහ 1971 අංක 52 දරන වෙළඳ හා නාවික පනත සංශෝධනය කරනු ඇත. වඩා හොඳ තරඟකාරීත්වයක් සහතික කිරීම සඳහා ස්වාධීන වරාය නියාමකයෙකු (Port Regulator) හඳුන්වා දෙනු ඇත. නාවික කටයුතු සහ භාණ්ඩ මෙහෙයුම් ආයතනවල විදේශ හිමිකාරීත්වය කෙරෙහි ඇති සීමාවන් ලිහිල් කරනු ඇත. මෙමගින් ජාත්‍යන්තර ප්‍රධාන නාවික සමාගම් සහ භාණ්ඩ හුවමාරු ක්‍රියාකරුවන්ට ශ්‍රී ලංකාවේ සිට මෙහෙයුම් කටයුතුවල නිරත වීමට උපකාරී වනු ඇත.

98. ගෝලීය විද්‍යුත් සහ විදුලි කාර්මික ආයතන රටතුළට ගෙන්වා ගැනීමට සහ එමගින් වටිනාකම් දාමයක් ඇති කිරීමට රජය කටයුතු කරනවා. ශ්‍රී ලංකාවේ විද්‍යුත් හා විදුලි කර්මාන්තකරුවන් සමඟ බද්ධ ව්‍යාපාර ඇති කිරීමට දායකවන පරිදි බහුජාතික සමාගම් සහභාගී කර ගත හැකි පරිපූර්ණ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබනවා. රු. මිලි. 25

99. මහා පරිමාණ ඖෂධ නිෂ්පාදන, කිරි කර්මාන්තය හා කසල කළමනාකරණ ව්‍යාපෘති සඳහා වන ආයෝජනවලට ගුදම් පහසුකම් ලබා දීම හරහා ආනයනික ප්‍රාග්ධන භාණ්ඩ සඳහා බදු සහන ලබා දීමට කටයුතු කරනු ඇත.

100. මෙමගින් වෙළඳාමට අදාළ දත්ත, රීති, ආනයන අපනයන ක්‍රියාපටිපාටි ආදිය ද ඇතුලත් තොරතුරු නියමිත වේලාවට හා විශ්වාසනීයත්වයෙන් ලබා ගත හැක. ශ්‍රී ලංකා රේගුව, වාණිජ දෙපාර්තමේන්තුව වැනි ආයතනවල සහායෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වෙළඳ තොරතුරු අංශයක් (ඉලෙක්ට්‍රොනික තොරතුරු වේදිකාවක්) ස්ථාපනය කරනු ඇත. රු. මිලි. 25

101. පර්යේෂණ ප්‍රතිඵල වාණිජ ව්‍යාපාරයන් බවට පරිවර්තනය කළ හැකි වන පරිදි විද්‍යාත්මක, තාක්ෂණික හා නව සොයාගැනීම් පිළිබඳ කමිටුව (COSTI) ජාතික විද්‍යාත්මක, තාක්ෂණික හා නව සොයා ගැනීම් සම්බන්ධීකරණ අධිකාරිය (NASTICA) බවට පරිවර්තනය කෙරෙනු ඇත. රු. මිලි. 25

102. අප නව නිපැයුම්කරුවන්ට (Innovators to Industry) කර්මාන්තයවලට (I2I) ප්‍රවේශවීමට අවස්ථා සලසා දෙනවා. මෙම ප්‍රවේශය මගින් හොඳම හා දක්ෂතම නිර්මාණශීලී අදහස් අපගේ කර්මාන්තවල යොදා ගැනීමට උපකාර කරනු ලබනවා. මෙම ක්‍රියාවලිය මගින් නව නිපැයුම්කරුවන්ටත් කර්මාන්තවලටත් ප්‍රතිලාභ ලැබෙනු ඇත. රු. මිලි. 25

103. පසුගිය වසරේ නිෂ්පාදන නිර්මාණ ශිල්පය (Product Design Engineering - PDE) සඳහා අරමුදලක් ඇති කිරීම මගින් ඒ සඳහා සහයෝගය දක්වා ඇත. දිගුකාලීන ණය පහසුකම්, සමජාතීය නිෂ්පාදන පරීක්ෂා කිරීමේ පහසුකම්,(Prototyping and Testing Facility), පුහුණුව හා ප්‍රමිතීන් පිළිබඳ හවුලේ සැපයෙන සහායක සේවා ඇතුලත් මෙකාට්‍රොනික් (Mechatronic) මගින් සවිමත් වූ ආර්ථික සංවර්ධන ප්‍රවේශය ඔස්සේ PDE වැඩසටහනට තව දුරටත් දායකත්වය ලබා දෙනවා. රු. මිලි. 350

104. නව නිපැයුම් සඳහා සහාය දක්වන අතරම රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානය තව දුරටත් ශක්තිමත් කෙරෙනු ඇත. රු. මිලි. 50

105. නාවික සංචාරක කර්මාන්තයට ද මඟ පාදමින් බෝට්ටු සෑදීමේ කර්මාන්තය දියුණු කළ හැකි අපනයන කර්මාන්තයක් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව, මෙම කර්මාන්තය දියුණු කිරීම සඳහා ප්‍රමිතිකරණය හා තත්ත්ව සහතික පිළිබඳ ක්‍රමවේදයක් ද ඇතුලත්ව අවශ්‍ය කරන රෙගුලාසි හඳුන්වා දෙනු ඇත. ත්‍රිකුණාමලය හා කොග්ගල ජල තීරයන්ට මුහුණ ලා ඒ කර්මාන්තයටම විශේෂිත වූ කර්මාන්තපුරයක් ද ඉදිකරනු ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති සමාගම් මගින් ආයෝජන මණ්ඩල අනුමැතිය සහිතව ක්‍රියාත්මක සමාගම්වලට කුඩා ප්‍රමාණයේ බෝට්ටු අලෙවි කිරීමේ දී අයකරන ජාතිය ගොඩනැගීමේ බද්ද හා වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද එකවර ගෙවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ඇත. රු. මිලි. 100

106. අප රට සතුව කුළුබඩු හා ආශ්‍රිත කර්මාන්තයන්ට තරඟකාරී වාසියක් තවමත් ඇත. ඒ සඳහා පහත සඳහන් පරිදි සහාය දක්වනවා.

107. ශ්‍රී ලාංකීය අනන්‍යතාව ආරක්ෂා කිරීම සඳහා ගුණාත්මක අතින් ඉහළ නිෂ්පාදනයන් සහතික කිරීමට අවශ්‍ය දැඩි නීති රීති හඳුන්වා දෙනු ඇත.

108. තවාන් 1,000 කට උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සහාය දැක්වීම තුළින් කුරුඳු හා ගම්මිරිස් කර්මාන්තයට අගය එකතු කිරීම හා නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගනු ලබනවා. රු. මිලි. 50

109. කුරුඳු කර්මාන්ත පුහුණු පාසලේ කාර්යයන් ශක්තිමත් කෙරෙනු ඇත. රු. මිලි. 50

110. තේ කර්මාන්තය සඳහා මධ්‍යකාලීන ආදායම් ආකෘතියක් ඉදිරිපත් කරනු ඇත.

111. ඵලදායීත්වය වර්ධනය කර ගැනීම සඳහා කුඩා තේ වතු හිමියන්ට සහාය වනු ඇත. රු. මිලි. 250

112. දේශීය පොල් නිෂ්පාදකයන් මුහුණ දෙන ගැටලු සැලකිල්ලට ගෙන දේශීය පොල්තෙල් සහ පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවලට අදාළ ජාතිය ගොඩනැගීමේ බද්ද වසරක කාලයක් සඳහා ඉවත් කරනු ඇත. එයට අමතරව එම කර්මාන්තය වෙනුවෙන් පහත සඳහන් දෑ යෝජනා කෙරේ.

113. පොල් මද ආශ්‍රිත සියලුම නිෂ්පාදනයන් සඳහා වන අන්තර්ජාතික ප්‍රමිතීන්වලට අනුකූල වන පරිදි ඇසුරුම් හා ලේබල් කිරීම හා ප්‍රමිතකරණය අනිවාර්ය කිරීමට අදාළ රෙගුලාසි හඳුන්වා දෙනු ඇත.

114. වගාකරුවන්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි දෙමුහුන් පොල්පැල නිෂ්පාදනය කිරීමට පොල් පර්යේෂණ ආයතනයට අවශ්‍ය සහාය ලබා දෙනු ඇත. රු. මිලි. 25

115. රබර් කර්මාන්තකරුවන්ගේ දායකත්වය සහිතව සකස්කර ඇති රබර් කර්මාන්ත මහා සැලැස්ම තුල ව්‍යාපෘති 22 ක් ඇතුලත්ව ඇත. එම සැලැස්මට අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ ව්‍යාපාර ඇතුලත්ය. මෙහි දී අලුත් භාණ්ඩ නිෂ්පාදනයටත් නව තාක්ෂණය යොදා ගැනීමටත් අවශ්‍ය සහාය ලබා දෙනවා. රු. මිලි. 50

116. කුකුළු පාලනය රටේ කෘෂි කාර්මීකරණ ක්‍රමෝපාය සැලසුමෙහි ප්‍රධාන කොටසකි. අනාගත හැකියාවන් ද එම කර්මාන්තය සතුය ඒ අනුව,

117. දේශීය බඩඉරිඟු නිෂ්පාදනයේ ඇතිවන අඩුව පිරවීම සඳහා පමණක් බඩඉරිඟු ආනයනය ලිහිල් කරනු ඇත.

118. කුකුළු ගහනය වාර්ෂිකව මිලියන 110 සිට මිලියන 500 දක්වා වැඩි කිරීමේ අරමුණින් ඌන උපයෝජිත රාජ්‍ය ගොවිපල හෝ ඉඩම් කුකුළු ගොවිපල පිහිටුවීම සඳහා බදු පදනම මත ලබා දීමට කටයුතු කරනවා.

119. යෝජිත නව නිදහස් වෙළඳ ගිවිසුම් මගින් කෙසෙල් හා අන්නාසි අපනයනය නංවාලීමට පුළුවන. මෙම පළතුරු සඳහා වන ඉල්ලුම සපුරාලනු පිණිස, හොරණ හා මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථාන සහ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයන්හි ඉහළ ඵලදාවක් සහිත පැල නිෂ්පාදනයට හා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය සහාය ලබා දෙනවා. ඉහළ ඵලදාවක් සහිත පැල නිපදවීමේ දී ක්ෂුද්‍ර ව්‍යාප්ති තාක්ෂණය යොදා ගන්වා. ඊට සමගාමීව වයඹ විශ්වවිද්‍යාලයේ කිරි කර්මාන්තය ඇතුලු විවිධ කර්මාන්ත මූලික කරගත් ආහාර, තාක්ෂණික, පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවනු ඇත. රු. මිලි. 125

120. ශ්‍රී ලංකාවේ මල් නිෂ්පාදන සඳහා විදේශ වෙළඳපොලෙහි වැඩි වෙමින් පවත්නා ඉල්ලුම සැලකිල්ලට ගෙන නව වෙළඳපොලවල් වලට ප්‍රවේශවීමට හැකිවන පරිදි මෙම කර්මාන්තයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට අප සහාය ලබා දෙනවා. මේ සඳහා Flower Council ආයතනය පිහිටුවනවා. රු. මිලි. 10

121. උසස් වර්ගයේ මැණික් පරිහරණය කරන පාරිභෝගිකයින් වෙනුවෙන් සේවා සපයන හොඳම මැණික් කැපීමේ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ මැණික් කැපීමේ කර්මාන්තය සැලකේ. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට වැඩිවන අපනයන ඉඩ ප්‍රස්ථා ඇත. ඒ අනුව කර්මාන්තය නගා සිටුවීම සඳහා;

122. කපා නැවත අපනයනය කිරීම පිණිස ගෙන්වනු ලබන මැණික් ගල් සඳහා වන ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කරනවා.

123. විද්‍යාගාර දියුණු කිරීම ද ඇතුලත් වන පරිදි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරයේ ව්‍යුහය හා ප්‍රතිපත්ති එම කර්මාන්තයේ වර්ධන අවශ්‍යතාවයට අනුකූලවන පරිදි ප්‍රතිනිර්මාණය කරනු ඇත.

124. දුව හා දුව ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා වන වර්ධන අවකාශය පුළුල් වුවත් එය ප්‍රමාණවත් පරිදි භාවිතයට ගෙන නොමැත. දුව හා දුව නිපැයුම් සඳහා නිර්මාණ සැලසුම් මධ්‍යස්ථානයක් මොරටුව විශ්වවිද්‍යාලය සමග එක්ව පිහිටුවනු ඇත. රු. මිලි. 25

## සංචාරක කර්මාන්තය දිරිමත් කිරීම

125. සංචාරක ව්‍යාපාරය වර්ධනය වන කර්මාන්තයකි. 2020 වර්ෂය වන විට සංචාරකයන්ගේ පැමිණීම මිලියන 4.5 දක්වා තුන්ගුණයකින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. අප රටේ ස්වභාවික සෞන්දර්යය, අපගේ උරුමයන්, ආහාරපාන හා සංස්කෘතිය වැනි සාධක මත මෙම කර්මාන්තය ප්‍රවර්ධනය කළ හැකිය. මේ අනුව, සංචාරක කර්මාන්තය සඳහා පහත දැක්වෙන පරිදි කටයුතු කරනවා.

126. සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයත් සමග දැනටමත් නිම කර ඇති හෝටල් කාමර හැරුණු විට තව දුරටත් කාමර ගණන වැඩි කිරීම අවශ්‍ය වනු ඇත. මෙම පසුබිම තුළ 'හෝම් ස්ටේ' (Home Stay) වැනි ක්‍රමයන් දිරිමත් කෙරෙනු ඇත. එවැනි පහසුකම් වැඩිදියුණු කිරීමට විශේෂ ණය පහසුකම් ලබා දෙනවා. රු. මිලි. 10

127. සංචාරක සේවා සපයන්නන් සඳහා සමාන අවස්ථා ඇති කිරීමේ තත්ත්වයක් නිර්මාණය කිරීම සඳහා විධිමත් හා අවිධිමත් දෙපාර්ශවයේම එවැනි සේවා සපයන්නන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමටත් අවිධිමත් අංශය පුළුල් බදු ජාලයට ගෙන ඒමටත් යෝජනා කරනවා. ශ්‍රී ලංකාවේ පදිංචි හා එසේ නොමැති මාර්ගගත ඒජන්තවරුන් (Online Travel Agents) ශ්‍රී ලංකාවේ සිදු කරන ව්‍යාපාරික කටයුතුවලින් උපයා ගන්නා ලද නැතහොත් රැස්කොට ගෙන ඇති කොමිස් මුදල්වලින් ගෝලීය ප්‍රමිතීන්ට අනුව යමින් සියයට 1 ක බද්දක් පැනවීමට යෝජනා කෙරේ.

128. සමහර ආනයනික ආහාර හා බීම වර්ග වෙනුවෙන් පනවා ඇති රේගු බදු නොවන අනෙකුත් ආනයනික බදු ඉවත් කෙරේ. ( මෙම ලේඛනය තාක්ෂණික සටහනෙහි දක්වා ඇත)

129. සුරාබදු බලපත්‍ර ගාස්තු ව්‍යුහය යථාවත් කරනු ඇත. බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නැවත සකස් කරනු ඇත. එමගින් ලැගුම්හල්, කුඩා හෝටල් (Boutique Hotels) ආදී ස්ථානයන්හි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. බදු ලිපිගොනු අංකයක් තිබීම මෙම බලපත්‍ර ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍යම සාධකයක් වනු ඇත.

130. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහායෙන් ආකර්ෂණීය සංචාරක ස්ථාන (anchor sites) කිහිපයක් වැඩි දියුණු කිරීම සඳහා අපගේ අවධානය යොමු කෙරෙනු ඇත. ඒ අනුව,

131. පුද්ගලික අංශය සහ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හා එක්ව මාතර, හම්බන්තොට, මඩකලපුව, ත්‍රිකුණාමල වරායේ පෝට් ෆෙඩ්රික්, මන්නාරම/ඩෝරික් හවුස් සහ කල්පිටිය යන පැරණි කොටු 6 ක් සංවර්ධනය කෙරෙනු ඇත. රු. මිලි. 250

132. නානු ඔය, කොළඹ කොටුව, ගාල්ල සහ ඇල්ල වැනි දුම්රිය ස්ථාන පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන ලෙස ප්‍රකාශයට පත් කොට පුද්ගලික අංශයේ සහාය ඇතිව ඒවායේ පෞරාණික අනන්‍යතාවය රැකෙන පරිදි මෙන්ම, සංචාරකයන්ට වඩා රු. මිලි. 75

හොඳ දුම්රිය ගමනාගමන අත්දැකීමක් ලබාගත හැකි ආකාරයට නවීකරණය කරනු ලැබේ.

133. රාජ්‍ය පෞද්ගලික සහභාගීත්වයෙන් සංචාරක ව්‍යාපාරයට සහායවීම සඳහා සීගිරිය, මඩකලපුව, චයිනා බේ සහ කොග්ගල යන ස්ථානවල අභ්‍යන්තර ගුවන්තොටුපලවල් සංවර්ධනය කෙරෙනු ඇත.

134. ගුවන් ක්‍රීඩා සඳහා සුදුසු ප්‍රදේශ හඳුනා ගනු ඇත. මේවා ත්‍රිමාණ මායිම් සහිතව 'ගුවන් ක්‍රීඩා සඳහා විවෘත අහස ' ලෙස සලකනු ඇත. මේවා අතර Aero Modeling, Air Racing, Hang Gliding, Ballooning වැනි ක්‍රීඩා හඳුන්වා දෙනු ඇත. මෙම උපකරණ ආනයනයට අදාළ ජාතිය ගොඩනැගීමේ බද්ද සහ වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද ඉවත් කරනු ඇත.

135. මාදුරු ඔය, හා ගල් ඔය ජාතික උද්‍යාන ඉහළ මට්ටමේ සෆාරි සංචාර සඳහා සංවර්ධනය කෙරෙනු ඇත. ආරක්ෂණ හා සංරක්ෂණ කටයුතු සඳහා පමණක් නොව සංචාරක කටයුතුවලට ද දායකත්වයක් දැක්විය හැකිවන පරිදි මෙම උද්‍යාන දියුණු කරනු ඇත. රු. මිලි. 75

136. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, වෙරළ ආශ්‍රිතව ජීවිතාරක්ෂක මධ්‍යස්ථාන 25 ක් ආරම්භ කරනු ඇත. ජනප්‍රිය සංචාරක ස්ථානවල සංචාරකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස ශ්‍රී ලංකා පොලීසිය විසින් සංචාරක පොලිස් ස්ථාන 20 ක් ස්ථාපනය කිරීමට පියවර ගනු ඇත. රු. මිලි. 30

137. වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද, යාන්ත්‍රික නොවන ජල ක්‍රීඩා උපකරණ එනම් kayaks, Canoes, Kite surfing ආදී උපකරණ සඳහා ඉවත් කෙරෙනු ඇත. විදුලිබලයෙන් ක්‍රියාකෙරෙන Off Road ක්‍රීඩා වාහන සඳහා ද අදාළ ආනයන බදු අඩු කිරීමට කටයුතු කෙරෙනු ඇත.

138. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 'ශ්‍රී ලාංකීය ආහාරපාන සන්නාමකරණ' සඳහා ආයෝජනය කරනු ඇත.

139. අපගේ 70 වැනි නිදහස් දින සැමරුම්වලට සමගාමීව ලොස් ඇන්ජලීස්, ලන්ඩන් හා මුම්බායි යන නගර තුනෙහි වීදි උත්සව හා ප්‍රදර්ශන පැවැත්වෙනු ඇත. මෙම කටයුතු පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් පවත්වනු ඇත. රු. මිලි. 50

140. ශ්‍රී ලංකාව වෙළඳ කේන්ද්‍රයක් කිරීමේ දැක්ම අරමුණු කරගෙන, විදේශ ගමන්බලපත්‍ර හිමියන් සඳහා වැට් බද්ද ආපසු ලබා දීමේ ක්‍රමවේදයක් ගුවන්තොටුපල හා වරායන්හි 2018 මැයි 1 දින සිට ආරම්භ කෙරනු ඇත.

141. ගරු කථානායකතුමනි, මිලියන 1.3 ක් වන ත්‍රිරෝද රථ රියදුරු ප්‍රජාව අපගේ දෛනික ජීවිතයේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මේ සඳහා සංචාරකයන්ගේ ආකර්ෂණය ද වැඩිවෙමින් පවතී. ඒ අනුව, ත්‍රීරෝද රථ විදුලි බලයෙන් ධාවනයට පත්කිරීම සඳහා මෙම අයවැයෙන් දිරිගන්වන අතර ත්‍රීරෝද රථ ව්‍යවසායකයින් බිහිකිරීමට ද අප සහාය වනවා.

142. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ' සංචාරකයන්ට හිතැති ටුක් ටුක් ' හඳුන්වා දීමට වැඩසටහනක් ආරම්භ කරනු ඇත. එහි දී ත්‍රිරෝද රථ රියදුරන් සංචාරක කර්මාන්තය සමග එක්ව සංචාරක මගපෙන්වන්නන් ලෙස පුහුණු කරනු ලබන අතර ඔවුන් කාර්යාංශයේ ලියාපදිංචි කරනු ඇත. මුදල් අයකිරීමෙන් තොරව ලබා දෙනු ලබන මෙම පුහුණුව අවසානයේ කාර්යාංශය විසින් ත්‍රිරෝද රථයේ ප්‍රදර්ශනය සඳහා විශේෂ ස්ටිකරයක් ලබා දෙනු ඇත. රු. මිලි. 50

143. අප විසින් ත්‍රිරෝද රථ නියාමන අධිකාරියක් පිහිටුවීමට කටයුතු කරනවා. සියලුම ත්‍රීරෝද රථ සඳහා මීටර් අනිවාර්ය කිරීමට අදාළ රෙගුලාසි දැනටමත් නිකුත් කර තිබෙනවා. රු. මිලි 25

**සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම**

144. ගරු කථානායකතුමනි, මැදි ආදායම්ලාභී රටක් ලෙස අපහට අසල්වාසී රාජ්‍යයන්ට ලැබෙන පරිමාණයෙන් සෘජු විදේශ ආයෝජන ලබාගත නොහැකි වී තිබෙනවා. මේ පිළිබඳව බොහෝ ගැටළු තිබෙනවා. එම නිසා අපගේ ක්‍රියාවලීන් දෙස නැවත විමසා බැලිය යුතු වන අතර හොඳම විකල්පයට ගැලපෙන පරිදි Benchmarking සකස්කර ගත යුතුය. ඒ අනුව පහත යෝජනා ඉදිරිපත් කරනවා.

145. ව්‍යාපාර කටයුතු නව්‍යකරන ක්‍රියාවලිය (re-engineering process) යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපාර ලියාපදිංචිය සඳහා සියලු පහසුකම් ලබා දෙන කාර්යාලයක් (One Stop Shop) ස්ථාපිත කෙරෙනු ඇත. එහි දී සිය අරමුදල් යොදවා හඳුනාගැනීම් පද්ධතියක් සැකසීම (Single Identification System) සහ ස්කෑන් කිරීම සහ සමාගම් වාර්තා ඉලෙක්ට්‍රොනිකව තබා ගැනීම, වෙළඳ සලකුණුවල දත්ත පද්ධතියක් සකස් කිරීම ආදිය සිදු කරනු ඇත.

146. ඉලෙක්ට්‍රොනික පළාත් පාලන ඉල්ලුම්පත් ක්‍රමයක්, ඉදිකිරීම් බලපත් ස්වයංක්‍රීයව නිකුත් කිරීමේ යාන්ත්‍රණයක්, ඒකාබද්ධ ඉඩම් ලේඛනගත කිරීමේ කාර්යාලයක්, ඩිජිටල්ගතකරණ ලද ඉඩම් නාමලේඛන 45 ක් සහ ආයතන 31 ක් රේගු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ කරන යාන්ත්‍රණයක් (Single Window) අප විසින් ස්ථාපිත කරනු ඇත. රු. මිලි. 500

147. මවිසින් දැනටමත් සඳහන් කර ඇති පරිදි, 4 වන මහලට පහල මහල් නිවාස විදේශිකයන්ට මිල දී ගැනීමට ඇති බාධා ඉවත් කරනවා. විදේශීය අයිතිය සහිත ලැයිස්තුගත සමාගම්වලට ඉඩම් හිමිකර ගැනීමේ අයිතිය පිළිබඳ ඇති බාධාවන් ද ඉවත් කිරීමට කටයුතු කරනවා.

148. තායිලන්තයේ රොජානා ඉන්ඩස්ට්‍රීස් විසින් මිල්ලනියෙහි එ.ජ. ඩොලර් මිලියන 500 ක අයෝජනයකින් කර්මාන්ත පුරයක් ස්ථාපිත කරනු ඇත. රජය දැනටමත් මේ සඳහා ඉඩම ලබා දී ඇති අතර අවශ්‍ය යටිතල පහසුකම්-විදුලිය, ජලය, හා ප්‍රවේශ මාර්ග සකස් කර දෙනු ඇත. මීට සමාන පහසුකම් බිංගිරිය හා වැලිගම Charlemont Estate සඳහා ද ලබා දෙනු ඇත. අයෝජන මණ්ඩලය රේඛීය ආයතන හා මාගේ අමාත්‍යාංශය විසින් මෑතක දී ආරම්භ කළ රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා ඒජන්සිය එවැනි ව්‍යාපාර සඳහා පහසුකම් සලසා දෙනු ලබනවා. රු. මිලි. 2,500

149. පිටිපන මහහේනවත්තෙහි අධි තාක්ෂණ නවෝත්පාදන උද්‍යානයක් (Hi Tech Innovation Park) ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත. ආරම්භයේ දී මෙම උද්‍යානය තුළ දී ජෛව ඖෂධ ක්ෂේත්‍රයට අදාළ කර්මාන්ත 6 කට පහසුකම් සලසන අතර තවත් කර්මාන්ත 15 ක් ඉන් අනතුරුව ස්ථාපිත කරනු ඇත. රු. මිලි. 100

150. ගරු කථානායකතුමනි, අයවැය සීමාවන් නිසා අපගේ ආයෝජන කළඹ (Portfolio) සීමාවී ඇත. ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් රජය විසින් පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, අපගේ යටිතල පහසුකම් සඳහා වූ ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය සුදුසු ක්‍රියා මාර්ගය වනු ඇත. ඒ අනුව, මගේ අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ඒජන්සිය මගින් අදාළ සියලුම පාර්ශවයන්ට පහසුකම් සැලසිය හැකි වන පරිදි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයන් නිර්මාණය කිරීමට හා ක්‍රියාත්මක කිරීම පිණිස කටයුතු කරනු ඇත. ඒ සඳහා අදාළ මාර්ගෝපදේශ ඉතා කෙටි කලකින් රු. මිලි. 50

නිකුත් කරනු ඇත. ඒ යටතේ ප්‍රවාහන, මහා මාර්ග, බලශක්ති, වරාය, ජල සැපයුම්, සෞඛ්‍ය ආරක්ෂණ, අධ්‍යාපන, නිවාස, කෘෂි ව්‍යාපාර, සිල්ලර වෙළඳාම සහ ඛනිජ ආශ්‍රිත ආදී පුළුල් පරාසයකට ගැනෙන රාජ්‍ය හා පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

**තරුණ ව්‍යාවසායකයන් දිරිමත් කිරීම**

151. 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' වැඩසටහන සාර්ථක කර ගැනීමට නම් මෙම ජාතික වැඩසටහනෙහි පාර්ශවකරුවන් ලෙස අප රටේ තරුණ තරුණියන් ඊට සහභාගී කරවීම අත්‍යවශ්‍ය වේ. කුමන සමාජ හා අධ්‍යාපන පසුබිමක පසු වුවද තම සහජ දක්ෂතාවයන් උපරිම ලෙස යොදා ගනිමින් සාර්ථකත්වයට ළඟා වීමට අපේ සියළු තරුණ ප්‍රජාවට සමාන අවස්ථා ලබා දීම සිදු කළ යුතුය. වාර්ෂිකව උසස්පෙළ විභාගය සඳහා ලක්ෂ 3 ක් පමණ පෙනී සිටින අතර ඔවුන්ගෙන් ජාතික විශ්වවිද්‍යාලවලට ඇතුලත් වන්නේ 30,000 ක් පමණි. ආර්ථික වශයෙන් සවිමත් පවුල්වල ළමයින් 10,000 ක් පමණ අධ්‍යාපනය සඳහා වාර්ෂිකව විදේශ ගත වෙනවා. තවත් 60,000 ක් පමණ රාජ්‍ය නොවන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුලත් වෙනවා. ඒ අනුව, අපේක්ෂා භංගත්වයටත්, කලකිරීමටත් පත් වුණු විවිධ කුසලතා හා හැකියාවන් ඇති 200,000 ක් පමණ අපට ඉතිරි වෙනවා. එසේ වුවද, අපගේ අධ්‍යාපන ක්‍රමයේ පවත්නා දැඩි බව සහ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට නොහැකිවීම මත සෑම සිසුවකු සතු අනන්‍ය හැකියාවන් හඳුනාගැනීමට හැකිවී නැත. පවත්නා ක්‍රමය අසමත් වී ඇති මුත් ශිෂ්‍යයා අසමත් වී නොමැත. රටේ සුභ සිද්ධිය සඳහා බොහෝ තරුණ තරුණියන්ගේ සහජ දක්ෂතාවයන් උපයෝගී කරගත හැකිය. එසේම, ඔවුන්ගේ අදහස් සහ ශක්තීන් ශ්‍රී ලංකාවේ සංවර්ධනය මෙහෙයවනු ලබන යාන්ත්‍රණය විය යුතුය. ඒ අනුව, රජයේ ක්‍රමෝපායන් පහත පරිදි වේ.

- 'වසර 13 ක අධ්‍යාපනය' - සාමාන්‍ය පෙළ විභාගයේ දී කුමන විෂය ධාරාවකින් අධ්‍යාපනය ලබා ප්‍රතිඵලය කුමක් වුවද, වෘත්තීය හා නිපුණතා පුහුණුවට අවධානය යොමු කරමින් තරුණ ප්‍රජාවට වසර 13 ක අධ්‍යාපනයක් ලබාදීම තහවුරු කිරීම පිණිස ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනය සඳහා ආයෝජනය කිරීම.

- 'ජාත්‍යන්තර තලයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය'- නවීන විෂය මාලා, පර්යේෂණ පහසුකම් සහ ප්‍රමිතකරණය පිළිබඳව අවධානය යොමු කරමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ආයෝජනය කිරීම.

- 'වෙළඳපලට යොමු වුන වෘත්තීය පුහුණුව' - වෙළඳපල ඉලක්ක කළ උසස් තත්ත්වයේ පුහුණු පාඨමාලාවන් නිර්මාණය කිරීම සඳහා වෘත්තීය පුහුණු ආයතන සංවර්ධනය කිරීමට ආයෝජනය කිරීම.

152. 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' දැක්ම තුළ අපගේ තුන් වැදෑරුම් ප්‍රවේශය මගින් කිසිඳු යෞවනයෙකු අත් නොහැරෙනු ඇත.

153. රැකියා වෙළඳපොල මගින් අපේක්ෂා කරන කුසලතා නොමැතිවීම හේතුවෙන් තරුණ පරපුරට රැකියාවන් සොයා ගැනීම අපහසු වෙනවා. එම නිසා, තරුණ කණ්ඩායම් තුළින් පෞද්ගලික අංශය අපේක්ෂා කරනු ලබන විශේෂිත කුසලතා ඇතුලත් වන පරිදි මාස 3 සිට 6 දක්වා කාලයක පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට යෝජනා කරනවා. ඒ සඳහා ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ලබන 'රැකියා සඳහා සූදානම් කිරීමේ අරමුදලක් ' මගින් පහත සඳහන් කාර්යයන් වෙනුවෙන් මූල්‍ය පහසුකම් අප විසින් සපයනු ඇත. රු. මිලි. 2,500

- ඉදිරියේ දී හඳුන්වා දීමට නියමිත මෙවැනි පුහුණු පාඨමාලා සඳහා වැයවන පිරිවැය

- පුහුණුව ලබන කාලය තුළ මසකට රුපියල් 3,500 බැගින් වූ යැපුම් දීමනාවක් ගෙවීම සඳහා වැයවන පිරිවැය
- මාසික දීමනාවේ කොටසක් ලෙස රුපියල් 6,000 ක් දක්වා මාස 6 ක කාලයකට අදාළ පිරිවැය රජය දරනු ඇත. හවුල්කාර සේවා නියුක්තිකයා විසින් තවත් රුපියල් 10,000 ක දීමනාවක් ගෙවනු ඇත.

154. දැනටමත් යොවුන් සේනාංක මගින් පවත්වාගෙන යනු ලබන නිපුණතා සංවර්ධන පාඨමාලාවන් තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා රුපියල් මිලියන 2,000 ක් වෙන් කරනු ලැබේ. රු. මිලි. 2,000

155. දැනටමත් රත්මලානේ හා කිලිනොච්චියේ පිහිටුවා ඇති සහ මාතර පිහිටුවීමට නියමිත ජර්මානු තාක්ෂණ විද්‍යාලයට අමතරව ස්විට්සර්ලන්ත සහ ජර්මන් රජයෙන් ලැබෙන තාක්ෂණික සහයෝගයෙන් මීලඟ වර්ෂ 3 ඇතුළත, තාක්ෂණික සහ වෘත්තීය පාසල් 5 ක් බදුල්ල, මහනුවර, ත්‍රිකුණාමලය, රත්නපුර හා අනුරාධපුර නගරවල පිහිටුවනු ලැබේ. මෙම තාක්ෂණික පාසැල් මගින් සත්කාරක කළමනාකරණය, සිවිල්, විද්‍යුත් හා මෝටර් කාර්මික ඉංජිනේරු ආදී ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවක් ලබාදෙනු ඇත. රු. මිලි. 1,000

156. තරුණ තරුණියන්ට උසස් පුහුණු අවස්ථා ඇතිකිරීම සඳහා විශ්වවිද්‍යාල කොලීජියක් කින්නියාහි පිහිටුවනු ඇත. රු. මිලි. 50

## සමාජ යටිතල පහසුකම්

157. ගරු කථානායකතුමනි, අපගේ රජය විසින් ඉතිහාසයේ පෙර නොවූ විරූ මට්ටමේ, සම්පත් ප්‍රමාණයක් තරුණයන් බලගැන්වීම, සෞඛ්‍යය, අධ්‍යාපනය ඇතුළු සමාජ යටිතල පහසුකම් සඳහා වෙන්කර ඇත. 2018 වර්ෂයේදී රු.බිලියන 325 කට වැඩි මුදලක් වෘත්තීය අධ්‍යාපනය, උසස් අධ්‍යාපන සහ අධ්‍යාපනය සඳහා පමණක් වෙන් කර ඇත. අපගේ උපාය මාර්ගය වනුයේ ඉදිකිරීම් සඳහා වන ආයෝජනයන්ගෙන් ඉවත් වී, වඩාත් ගුණාත්මක වර්ධනයක් ඇති, වැඩි ප්‍රතිලාභ ලබාගැනීමට ඉවහල්වන තිරසාර උපායමාර්ගවලට අවතීර්ණ වීමය. ඒ අනුව, මා පහත යෝජනා ඉදිරිපත් කරනවා.

## 13 වසරක අධ්‍යාපනය

158. ගරු කථානායකතුමනි, ආරම්භයේදී මා මෙසේ සඳහන් කරනවා. සිසු රක්ෂණ ක්‍රමය හඳුන්වාදීම සහ ශිෂ්‍යයන් සඳහා ටැබ්ලට් පරිගණක ලබාදීමෙන් අප විසින් දුන් පොරොන්දු ඉටුකර ඇත. අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැතිතුමා විවිධ අවස්ථාවලදී පැහැදිලිව ප්‍රකාශ කර ඇති පරිදි රටේ සංවර්ධන උපාය මාර්ගයන්හි ප්‍රධාන අංගයක් ලෙස අධ්‍යාපනය හඳුනාගෙන ඇත. එම නිසා කිසිඳු පැකිලීමකින් තොරව මේ සඳහා සම්පත් වෙන් කරනු ඇත. එම නිසා, වසර 13 ක අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණ ඇතිව අධ්‍යාපනය සඳහා වන අයවැය ප්‍රතිපාදන ව්‍යුහවගත කර ඇත. රට තුළ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය උපාධිධාරීන් බිහිකිරීමේ ප්‍රතිශතය එසේ නොවන පාඨමාලාවලට වඩා වැඩිකිරීමේ අරමුණ පෙරදැරි කොටගෙන එවැනි ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනු ඇත. රු. මිලි. 3,500

159. ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ඇති ප්‍රබල ඉල්ලුම සපුරාලීමේ පාර්ශවකරුවෙකු ලෙස ජාතික අධ්‍යාපන ආයතනය ප්‍රතිව්‍යුහගත කරනු ලැබේ. එම අරමුණු ගත ප්‍රතිසංස්කරණවලට පහත කරුණු ඇතුලත්ය.

160. විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු, වෛද්‍ය විෂයයන් ඉගැන්වීමේ ක්‍රමවේදය වෙනස් කිරීම

161. උසස් පෙළ විෂයය සංයුතියෙහි යෝජිත වෙනස්කම් මගින් තෝරාගන්නා උපාධි පාඨමාලාව තීරණය වන අතර එය විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු, වෛද්‍ය විෂයයන් සමඟ කලා විෂයයන් ඉගැන්වීමේ අදහස තහවුරු කරන ආකාරයට සකස් කරනු ඇත. මේ තුළින් ශිෂ්‍යයන් හට ගණිතය සමඟ සංගීතය, විද්‍යාව හා නාට්‍ය කලාව වැනි විෂයයන් ඉගෙනගැනීමේ අවස්ථාව සැලසෙනු ඇත. නූතන ඉල්ලුමට සරිලන ආකාරයට උසස් පෙළ ශිෂ්‍යයින් නිර්මාණය කිරීමේ හැකියාව මේ තුළින් ලැබෙනවා.

162. 13 වසරක අධ්‍යාපනය යන්නට ගැලපෙන පරිදි විභාග සහ ඇගයීම් ක්‍රමවේදය ද ප්‍රතිසංස්කරණය කරනවා .

163. අවශ්‍යතාවයට ගැලපෙන පරිදි විෂයමාලාව ප්‍රතිසංස්කරණය කරන අතර ගණිත කට්ටල සැපයීම සහ ගණිතාගාර වැඩි දියුණු කිරීමට කටයුතු කෙරේ.

164. ශිෂ්‍යයන්ගේ නිපුණතා හා දැනුම පරීක්ෂා කිරීම තුළින් අපගේ අධ්‍යාපන ක්‍රමය අන්තර්ජාතික ප්‍රමිතීන් හා සැසඳීමට හැකිවන පරිදි අන්තර්ජාතික ශිෂ්‍ය ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දෙනවා. රු. මිලි. 25

165. අනාගත රැකියා සඳහා අපගේ ශිෂ්‍යයන් සූදානම් කිරීම අරමුණු කර ගනිමින් පාසැල් විෂය මාලාව සඳහා ජාන විද්‍යාව, කේතකරණය, රොබෝ විද්‍යාව සහ නැනෝ තාක්ෂණය ඇතුලත් කරනවා.

166. ගුරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කරනු ලැබේ. රු. මිලි. 1,200

167. e පෙළපොත් සංවර්ධනයත් සමඟ ඩිජිටල්කරණයේ මෙහෙයුම තුළින් 'ස්මාර්ට් පංති කාමර' සංකල්පය තවදුරටත් ශක්තිමත් කෙරේ. රු. මිලි. 755

168. ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවරුන් පුහුණු කිරීම සඳහාම කැපවුනු මධ්‍යස්ථානයක් මහරගම ගුරු අධ්‍යාපන ආයතනය තුළ පිහිටවනු ඇත. ජාතික අධ්‍යාපන ආයතනය සතු සම්පත් මෙම යෝජිත ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා කැපවන මධ්‍යස්ථානය සඳහා ද යොදා ගැනීමට අපේක්ෂිතය. රු. මිලි. 50

169. විශේෂ අවශ්‍යතා ඇති ශිෂ්‍යයින් සඳහා වූ ගුරුවරුන් පුහුණු කිරීම තවදුරටත් ශක්තිමත් කෙරේ. මේ සඳහා හාපිටිගම හා අඩ්ඩාලච්චේන විද්‍යා පීඨවල විශේෂ අවශ්‍යතා පුහුණු පහසුකම් වැඩි දියුණු කෙරේ. රු. මිලි. 25

170. විද්‍යාපීඨ තුළ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සඳහා දිනට ගෙවනු ලබන මාසික දීමනාව රුපියල් 3,500 සිට රුපියල් 5,000 ක උපරිමයක් දක්වා වැඩි කෙරේ. රු. මිලි. 50

## ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය

171. ගරු කථානායකතුමනි, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා රජයේ ආයෝජනය දිගින් දිගටම වැඩි වුවද, විවිධ කඩාකප්පල්කාරී බලවේග විසින් අපගේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ දීප්තිමත් අනාගතය විනාශ කිරීමට කටයුතු කරනු ලැබීම කණගාටුවට කරුණකි. මා මෙය දකින්නේ අපගේ රටේ අනාගතය කප්පමක් ලෙස ගෙන කටයුතු කිරීමක් වශයෙනුයි. මෙම රජය අධිෂ්ඨාන කර තියෙනවා තරුණයන් සඳහා නව අවස්ථාවන් විවෘත කිරීමට. ඒ වෙනුවෙන් තාක්ෂණික, ඉංජිනේරු, වෛද්‍ය සහ තෝරාගත් කළමනාකරණ සහ සමාජවිද්‍යා උපාධි වැඩසටහන් සඳහා පසුගිය දෙවසර තුළ විශ්වවිද්‍යාලයට ඇතුලත් කරගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 20 කින් වැඩිකරනු ලැබ ඇත. එමෙන්ම විශ්වවිද්‍යාලවල භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ද කර ඇත. ඒ යටතේ

172. වයඹ, සබරගමුව සහ මොරටුව විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ බිහිකරමින් වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කෙරේ. — රු. මිලි. 1250

173. රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය වැඩිදියුණු කිරීමේ අරමුණින් කරාපිටිය රෝහල තුළ මහාචාර්ය ඒකකයක් පිහිටු වනවා. — රු. මිලි. 50

174. තාක්ෂණික උපාධි වැඩසටහන් පුළුල් කිරීම යටතේ රජරට, රුහුණු, සබරගමුව, කැළණිය, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර හා නිරිතදිග විශ්වවිද්‍යාල තුළ නව තාක්ෂණික පීඨ 7 ක් ඇති කර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය සහ ජෛව තාක්ෂණ පද්ධති තාක්ෂණය යන විෂයන් හඳුන්වා දෙනවා. — රු. මිලි. 5,000

175. නාවුක අධ්‍යයනය සහ නාවික ගමනාගමනය පිළිබඳ අධ්‍යයනය ඒකකයක් රුහුණු විශ්වවිද්‍යාලය තුළ පිහිටුවීමට කටයුතු කරනවා. — රු. මිලි. 250

176. කොළඹ විශ්වවිද්‍යාලය මගින් ආරම්භ කර ඇති කර්මාන්ත අවශ්‍යතා හා නව ව්‍යාපාර ධාරාවන්ට බද්ධවන නව විෂය ධාරාවන් - දත්ත විද්‍යාව, දත්ත විශ්ලේෂක, ආයුගණක අධ්‍යයන ව්‍යාපාර විශ්ලේෂණවලට අවශ්‍ය පහසුකම් ලබා දෙනවා. — රු. මිලි. 250

177. යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය ශක්තිමත් කිරීම සඳහා නවීන පහසුකම් සහිත පුස්තකාලයක් හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කරනවා. — රු. මිලි. 200

178. ප්‍රතීතනය හා නියාමනයට යටත්ව රාජ්‍ය විශ්වවිද්‍යාල ක්‍රියාත්මක කරන පාඨමාලා පෞද්ගලික ආයතන මගින් ලබා දෙමින් සම්ප්‍රදායික නොවන උපාධි පාඨමාලා ඇති කිරීමට පහසුකම් සලසනවා.

179. ස්වාධීන තත්ත්ව සහතික කිරීම් සහ ප්‍රතීතන යාන්ත්‍රණයක් උසස් අධ්‍යාපන ප්‍රමිතීන් සහ තත්ත්වය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය සඳහා ස්ථාපනය කරනවා. — රු. මිලි. 25

180. ජාත්‍යන්තර තරඟකාරීත්වය තුළින් ප්‍රමිතීන් තහවුරු කර ගැනීම සඳහා ප්‍රතීතනය සඳහා වූ Advance Collegiate Schools of Business (AACSB) ආයතනය මගින් ප්‍රතීතන පහසුකම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයට ලබා ගැනීමට සහාය ලබා දෙනවා. මා අනෙකුත් විශ්වවිද්‍යාලයන් ද මෙම ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමට දිරිමත් කරනවා. — රු. මිලි. 100

181. පේටන්ට් බලපත්‍ර සහ සමාගම්වල කොටස් අයිතිය ලබා ගැනීමටත් ඒවායේ වාසි අත්පත් කර ගැනීමටත් බාධාවක් වී ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ පාලනය වන විශ්ව විද්‍යාලවලට අදාල ව්‍යවස්ථාපිත අණපනත් සංශෝධනය කිරීමට යොමු කරනවා.

182. අප සතුව දියුණු දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබුණද, දැනට එය නොසලකා හැර තිබෙනවා. මේ තත්ත්වය වළකාලීමට දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයක් පිහිටුවීමට කටයුතු කරනවා. — රු. මිලි. 40

183. මහපොල ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය සඳහා තෝරාගැනීම් නිර්ණායකවලට ගැනෙන වාර්ෂික ආදායම රු. 300,000 සිට රු. 500,000 දක්වා වැඩි කරනවා. මෙම යෝජනාව තුළින් අමතර ශිෂ්‍යයන් 3,000 කට ප්‍රතිලාභ ලැබෙනවා. — රු. මිලි. 75

184. සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් සියළුම විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා හඳුන්වා දෙනවා. — රු. මිලි.100

## ක්‍රීඩා ක්‍රියාකාරකම්

185. ගරු කථානායකතුමනි, සමාජ ඒකාග්‍රතාවය හා සමාජ ප්‍රාග්ධනය ගොඩනැගීම යන ද්විත්ව ඵලයන් ක්‍රීඩාව තුළින් ලැබෙනවා. එමෙන්ම, අප රට ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ද ලක් වෙනවා.

186. අප විසින් ප්‍රජා ක්‍රීඩා ජනප්‍රිය කිරීමට අවශ්‍ය මූලික කටයුතු වශයෙන් ග්‍රාමීය ක්‍රීඩාංගන 100 ක් රට පුරා සංවර්ධනය කිරීමට කටයුතු කරනවා.

රු. මිලි. 100

187. සහජ දක්ෂතා හඳුනාගැනීම් වැඩසටහන් මගින් දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ යොවුන් මලල ක්‍රීඩා සංචිත ඇතිකිරීමත්, ඒ තුළින් ජාතික මට්ටමේ සංචිතය පෝෂණය කිරීමටත් හැකි වෙනවා. මේ සඳහා දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩාගාර සංවර්ධනය කිරීම සඳහා අප විසින් සැලසුම් කෙරේ. මේ සඳහා මූලික වශයෙන් දිගන ක්‍රීඩාගාරය, පොලොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩාගාරය සහ කල්මුනේ සන්දන්කර්නි ක්‍රීඩාගාර ඉදිරි වර්ෂ 2 තුළදී සංවර්ධනය කිරීමට නියමිතය. විනාශ වී ඇති මාතලේ හොකී ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කරනවා.

රු. මිලි. 400

188. 2020 දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ සත්කාරක රට ලෙස කටයුතු කිරීම ශ්‍රී ලංකාවට අභිමානයකි. මෙම ක්‍රීඩා උළෙල පැවැත්වෙන දියගම ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය උසස් කිරීමට හා වැඩිදියුණු කිරීමට කටයුතු කරනවා. ඒ සඳහා ධාවන පථ නැවත සකස් කිරීම, මලල ක්‍රීඩා ගම්මානය සංවර්ධනය කිරීම, විනෝදාත්මක ප්‍රදේශ, පේශී ශෛල්‍ය කර්ම ඒකක සකස් කිරීම ආදී කටයුතු කෙරේ. ජාතික තලයේ මලල ක්‍රීඩකයන් වැඩිදෙනෙකුට ප්‍රයෝජනයට ගත හැකි දියගම ක්‍රීඩා ඇකඩමියක් සහ ක්‍රීඩා පාසැලක් ඇරඹීමට කටයුතු කරනවා.

රු. මිලි. 1,500

189. රාජ්‍ය සහ පෞද්ගලික සහභාගීත්වයෙන් සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය නවීකරණය කොට කළමනාකරණය කරනු ඇත. මේ තුළින් ජාත්‍යන්තර ක්‍රීඩා සහ විනෝදාත්මක වැඩසටහන් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

රු. මිලි. 100

190. සුගතදාස බාහිර ක්‍රීඩාංගනයෙහි ප්‍රේක්ෂකාගාරය සහ ධාවන තීරු ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුව උසස් කරනවා.

රු. මිලි. 1,200

191. මානව ක්‍රියාකාරකම් විද්‍යාගාරය නවීනතම තාක්ෂණ පහසුකම්වලින් සම්පූර්ණ කරනවා.

රු. මිලි. 75

192. තහනම් උත්තේජක භාවිතා කිරීමේ ප්‍රවණතාවයක් රටෙහි ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ දක්නට ලැබේ. මෙය ලැජ්ජාවට කරුණකි. මෙම තත්ත්වය තුළ මත්ද්‍රව්‍ය විරෝධී ජාතික වැඩසටහන් හා මත්ද්‍රව්‍ය පරීක්ෂණ හා පර්යේෂණාගාරයක් ඇති කිරීම සඳහා ආධාර ලබා දෙනවා.

රු. මිලි. 25

193. තරඟකාරී ක්‍රීඩා සඳහා ගම්බද තරුණ පරපුර ඇදගැනීමේ ප්‍රධාන බාධකයක් ලෙස ක්‍රීඩා සපත්තුවල අධික වියදම බලපා ඇති බව මා තේරුම්ගෙන ඇත. ඒ අනුව, තීරුබදු නොවන ආනයන බදු ක්‍රීඩා සපත්තු ආනයනයේදී ඉවත් කිරීමට මා යෝජනා කරනවා.

194. ප්‍රවීනයන්ගේ ආසියාතික කුසලානයට හා පැරා ඔලිම්පික් වැනි ජාත්‍යන්තර තරඟ සඳහා මෙරට නියෝජනය කරන ප්‍රවීන හා වෙනස් වූ හැකියාවන් ඇති තරඟකරුවන්ට අවශ්‍ය සහාය ලබා දෙනවා.

රු. මිලි. 50

**සෞඛ්‍ය සම්පන්න ජාතියක්**

195. ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අංශය සඳහා අප රජය විසින් සිදු කරන අයෝජන සැලකිය යුතු මට්ටමකින් පවතී. පොරොන්දු වූ පරිදි ඖෂධ සාධාරණ මිලකට ලබාදී ඇත. සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීම සඳහා අප විසින් දැනටමත් රුපියල් බිලියන 200 ක් 2018 වර්ෂය සඳහා වෙන්කර ඇති අතර මෙම ප්‍රමාණයට වඩා වැඩි සම්පත් ප්‍රමාණයක් ලබා දෙමින් සෞඛ්‍ය අංශය තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

196. රට තුළ සියළුම දිස්ත්‍රික්කවල වැඩිවෙමින් පවතින වකුගඩු ආශ්‍රිත රෝග තත්ත්වය සැලකිල්ලට ගෙන වකුගඩු ඒකක 03 ක් සහ නවීන තාක්ෂණයෙන් යුතු Extra - Corporeal Shock Wave Lithotripsy (Eswl) යන්ත්‍ර 3 ක් පොලොන්නරුව, අනුරාධපුරය සහ යාපනය රෝහල්වල පිහිටුවීමට කටයුතු කෙරේ. රු. මිලි. 450

197. විශේෂයෙන්ම ළමයින් අතර වැඩිවෙමින් පවතින බෝ නොවන රෝග වැඩිවීමේ ප්‍රවණතාවය මර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශයේ කාර්යයන් ශක්තිමත් කෙරේ. ඒ අනුව, සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව බෝ නොවන රෝගවන, ළමා දියවැඩියාව, ඇදුම ආදී රෝග තත්ත්වයන්වලට විසඳුම් සෙවීම සඳහා කටයුතු කෙරේ. බෝ නොවන රෝග වන වකුගඩු, තැලිසීමියාව සහ එච්.අයි.වී. ඒඩ්ස් (HIV/AIDS) ආදිය මුල් අවස්ථාවේදීම හඳුනාගැනීමේ වැඩපිළිවෙල ද ශක්තිමත් කර ඇත. රු. මිලි. 100

198. විශේෂයෙන්ම ළමයින් අතර පවතින දියවැඩියාව සහ තරබාරුකම අඩුකිරීමේ අරමුණින් බීමවල අඩංගු සීනි ග්‍රෑම් 01 ක් සඳහා ශත 50 ක නිෂ්පාදන බද්දක් අද මධ්‍යම රාත්‍රියේ සිට පැනවීමට යෝජනා කෙරේ.

199. කරාපිටිය පිලිකා රෝග ඒකකය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරනු ඇත. ඒ හා සමගාමීව මඩකලපුව හා රත්නපුර රෝහල්වලද පිළිකා රෝග ඒකක ස්ථාපනය කිරීමට කටයුතු කෙරේ. රු. මිලි. 300

200. රජයේ බෙහෙත්ශාලා ජාලය ශක්තිමත් කිරීම මගින් ප්‍රාථමික සෞඛ්‍ය සේවා ජාලය ශක්තිමත් කෙරේ. රු. මිලි. 100

201. කාසල් වීදියේ කාන්තා රෝහලේ සාඵල්‍යතා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ උසස් තත්ත්වයේ විශේෂිත වූ ප්‍රසව මධ්‍යස්ථාන 03 ක් කොළඹ, මහනුවර සහ අනුරාධපුර නගරවල පිහිටුවීමට කටයුතු කරනවා. රු. මිලි. 275

202. මාතෘ සහ නොමේරූ ළදරු ඒකක සංකීර්ණයක් පොලොන්නරුව රෝහලේ පිහිටුවනු ඇත. රු. මිලි. 50

203. හෘදය රෝග අවදානම් සත්කාර සංකීර්ණයක් හා හෘද රෝග නිවාරන සංකීර්ණයක් රිජ්වේ ආර්යා ළමා රෝහලේ පිහිටුවීම සඳහා වැඩකටයුතු ආරම්භ කෙරේ. 'කුඩා හදවත් සංකල්පය' ආරම්භ කිරීමට උදව් කළ සැමට මා ස්තුති කිරීමට කැමතියි. රු. මිලි. 400

204. මොරටුව සහ දෙනියාය ප්‍රාදේශීය රෝහල් උත්ශ්‍රේණිගත කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ බේරුවල මූලික රෝහලෙහිද සුව කාරක ඒකකය, ලේ බැංකුව, රසායනාගාරය සහ මලාපවහන ඒකකය පිහිටුවීම හා වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කෙරේ. රු. මිලි. 375

205. වර්තමානයේදී අධික රෝගී තදබදයකින් යුතු මාතර දිස්ත්‍රික් රෝහලේ මාතෘ, ළමා රෝග, වෛද්‍ය හා පරිපාලන ඒකක කඹුරුගමුව රෝහලට ගෙන යාම තුළින් මාතර රෝහල වැඩි දියුණු කෙරේ. රු. මිලි. 150

206. පරිපූර්ණ සෞඛ්‍ය ආරක්ෂිත ආහාර සහ ආහාර සුරක්ෂිත පද්ධතියක් අදාළ රේඛීය ආයතනවල සහභාගීත්වයෙන් වැඩි දියුණු කරනවා. රු. මිලි. 25

207. හෙද පුහුණු පාසැල්වල යටිතල පහසුකම් වැඩි දියුණු කරනවා. රු. මිලි. 300

208. ගරු කථානායකතුමනි, සියළුම වයස් කාණ්ඩවල සියදිවි හානිකර ගැනීමේ සිදුවීම් සහ විවිධ සමාජ විරෝධී හැසිරීම් ප්‍රමාණය ප්‍රධාන ජනමාධ්‍ය මගින් දිනපතා වාර්තා රු. මිලි. 25

කරනු ලබයි. මෙම තත්ත්වය මත මානසික සෞඛ්‍ය වර්ධනය සඳහා කටයුතු කිරීමට ආධාර ලබා දෙනවා.

209. මහරගම දන්ත සෞඛ්‍ය ආයතනය සහ රත්නපුර මුඛ සෞඛ්‍ය ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීමට පියවර ගනු ලැබේ. රු. මිලි. 300

210. ලිංගාශ්‍රිත බෝවන රෝග සහ එච්.අයි.වී ඒඩ්ස් ඒකකයක් නවීන තාක්ෂණ පහසුකම්වලින් යුතුව කොළඹ ජාතික රෝහලෙහි පිහිටුවීමට කටයුතු කෙරේ. රු. මිලි. 25

211. සෞඛ්‍ය සේවය හා බද්ධ වූ කොටසක් බවට පත්ව ඇති සුවසැරිය හදිසි ගිලන් රථ සේවාවට සහාය ලබා දෙනු ඇත. රු. මිලි. 750

212. සෞඛ්‍ය හා සම්බන්ධ වූ පර්යේෂණ කිරීම සඳහා ජාතික විද්‍යා පදනම ශක්තිමත් කිරීම පිණිස අවශ්‍ය ආධාර ලබා දෙනවා. රු. මිලි. 75

213. තත්ත්වය හා ප්‍රමිතිය තහවුරුවන පරිදි ආනයනය කරනු ලබන සුවඳවිලවුන් සහ පෞද්ගලික සනීපාරක්ෂක ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වන නීති පැනවීමට කටයුතු කෙරේ.

214. මුළු මත්පැන් පාරිභෝජනයෙන් සියයට 49 ක් නීති විරෝධී මත්පැන් වන අතර සියයට 85 කට වැඩි ප්‍රමාණයක් සැර මත්පැන් වේ. කෙසේ වුවද බොහෝ රටවල් සිය බදු ව්‍යුහය සකසා ඇත්තේ සැර මත්පැන් භාවිතය අධෛර්යමත් කිරීමටය. එමෙන්ම මධ්‍යසාර ප්‍රතිශතය හා සමානුපාතිකව බදු අය කෙරේ. මධ්‍යසාර අඩංගුවන ප්‍රමාණය හා වර්ගය පාදක වූ සූත්‍රයක් මත අපගේ බදු ව්‍යුහය යථාවත් කෙරේ. එසේම, මත්පැන් මත ජාතිය ගොඩනැගීමේ බද්ද 2018 අප්‍රේල් 01 දින සිට පැනවීමට කටයුතු කරනවා.

**නිවාසලාභී සමාජයක් සහ නාගරික කේන්ද්‍ර**

215. ගරු කථානායකතුමනි, සියළුම පුරවැසියන් නිවාසලාභීන් බවට කිරීම අපගේ දැක්ම වේ. ඒ අනුව, අඩු හා මධ්‍යම ආදායම්ලාභී කණ්ඩායම් එනම් වතු ආශ්‍රිත ප්‍රජාව, නායයෑම්වලින් අවතැන්වූවන් සහ උතුරු නැගෙනහිර ගැටුම්වලින් අවතැන්වූ පුරවැසියන් නැවත පදිංචි කිරීම සඳහා විවිධ වැඩසටහන් අප විසින් දැනටමත් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, මේ සම්බන්ධයෙන් පහත කරුණු වෙත අවධානය යොමු කෙරේ.

216. රටේ අඩු ආදායම් කණ්ඩායම් වෙනුවෙන් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ වසර 2020 වන විට නිවාස ඒකක 20,000 ක් ලබා දෙනවා. 2017 වසරේදී එයින් ඒකක 5,856 ක් සම්පූර්ණ කරනවා. මේ සඳහා වූ රජයේ බැඳීම් තහවුරු කරමින්, ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා 2018 වර්ෂය වෙනුවෙන් රුපියල් බිලියන 17.5 වෙන් කෙරේ. දැනටමත් අංගොඩ, කොලොන්නාව, මාලිගාවත්ත සහ දෙමටගොඩ ප්‍රදේශයන්හි මෙම ව්‍යාපෘති ආරම්භ කර ඇත. රු. මිලි. 17,500

217. ගැටුම් හේතුවෙන් අවතැන්වූ උතුරු නැගෙනහිර පළාත්වල ජනතාව යලි පදිංචි කිරීමේදී එම ප්‍රදේශවල ප්‍රමාණවත් නිවාස පහසුකම් නොමැතිවීමේ ගැටළුව රජයේ ප්‍රමුඛ අවධානයට ලක්වූ කරුණකි. ඒ සඳහා ආරම්භ කර ඇති නිවාස ඉදිකිරීමේ වැඩසටහන 2018 සිට 2020 වසර දක්වා ක්‍රියාත්මක කෙරේ. රු. මිලි. 3,000

218. සමස්ත අපනයන ආදායමට වැඩිම දායකත්වය ලබාදෙන අංශයක් වන වැවිලි කර්මාන්තය තවදුරටත් එම දායකත්වය නොකඩවා ලබා දෙනවා. එනමුත් වැවිලි කර්මාන්තයේ නියැළී සිටින අයගේ ජීවන තත්ත්වය තවමත් පවතින්නේ පහත් මට්ටමකයි. එය පිටු දැකීමට ලයින් කාමර වලින් ඉවත්වීම සඳහා නිවාස 25,000 ක් ඉදිකිරීමේ මධ්‍යකාලීන වැඩ පිළිවෙල සඳහා අප විසින් පහසුකම් සලසනවා. රු. මිලි. 2,000

219. ග්‍රාමීය නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා අයිතිකරුවන් විසින්ම ඉදිකරන නිවාස ව්‍යාපෘති පිළිබඳ අවධානය යොමු කරන අතරම නිවාස වැඩිදියුණු කිරීම සඳහා ද අවශ්‍ය සහාය ලබා දෙනවා. රු. මිලි. 7,000

220. විශේෂයෙන්ම රටේ මැදි ආදායම් කණ්ඩායම්වල සීඝ්‍ර වර්ධනය හේතුවෙන් නැගී එන නාගරික මධ්‍යස්ථානයන්හි සාධාරණ මිලකට නිවාස මිලදී ගැනීම සඳහා වන ඉල්ලීම සපුරාලීම සඳහා රජයේ මැදිහත්වීම අවශ්‍යවී ඇත. මේ වෙනුවෙන් දැනටමත් ව්‍යාපෘති ගණනාවක් නාගරික සංවර්ධන අධිකාරිය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් බොරැල්ල, කොට්ටාව, වාද්දුව, හෝමාගම හා රාගම ප්‍රදේශවල ආරම්භ කර ඇති අතර මෙම වැඩසටහන් තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කෙරේ. විශේෂයෙන් ප්‍රථම වරට නිවසක් මිල දී ගන්නා අය සඳහා අඩු පොළී මත ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා ආධාර ලබා දෙනවා. රු. මිලි. 500

221. ඒකාබද්ධ ගංවතුර පාලන ක්‍රමවේදයක් මගින් කොළඹ නගර සීමා සහ එහි තදාසන්න නගර සංවර්ධනය කිරීම අවශ්‍යයි. ඒ සඳහා වේරස්ගඟ ව්‍යාපෘතිය, මැනින් වෙළඳපොල පැලියගොඩ ප්‍රදේශයේ ස්ථානගත කිරීම, පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය, කොළඹ වරාය නගර ඒකාබද්ධ යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය, බේරේ වැව ප්‍රතිසංස්කරණය හා ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය සහ හෝමාගම තාක්ෂණ නගරයේ මාර්ග යටිතල පහසුකම් ද ඇතුලත් බහුකාර්ය ව්‍යාපෘතිය ආරම්භ කරනවා. තිරසාර සංවර්ධන හා නවීන තිරසාර නාගරික කේන්ද්‍ර බිහිකිරීමේ ක්‍රියාදාමය සඳහා අප රජය බැඳී සිටිනවා. ඒ යටතේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා රුපියල් බිලියන 24 ක මුදලක් වෙන් කරනවා. රු. මිලි. 24,000

222. ගරු කථානායක තුමනි, අපගේ සංවර්ධන ආකෘතිය කොළඹ දිස්ත්‍රික්කයට හා එහි තදාසන්න නගරවලට සීමා නොවුනු රටේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන සමස්ත සංවර්ධන ක්‍රමෝපායකි. ඒ අනුව, ආරම්භයේදී මහනුවර, අනුරාධපුර, ගාල්ල සහ යාපන දිස්ත්‍රික්කයන්, නාගරික සහ ක්‍රමෝපායික නගර සංවර්ධන වැඩසටහන යටතේ ආවරණය කෙරේ. රු. මිලි. 12,000

223. මහ කල්මුණේ සහ සමන්තුරෙයි සඳහා වන සැලැස්ම මේ වන විට සකස්කර ඇති අතර හඳුනාගෙන ඇති මූලික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අපගේ සහාය තවදුරටත් ලබාදෙනු ඇත. විශේෂයෙන්ම රටේ අඩු පහසුකම් සහිත ප්‍රදේශවල කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ නගර, නවීන පොදු පහසුකම් සහිතව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් වෙන් කරනවා. රු. මිලි. 2,000

224. මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් සඳහා මූල්‍ය පහසුකම් සලසා දීමට කටයුතු කෙරේ. රු. මිලි. 10,000

225. සමස්ත රටම ආවරණය වන පරිදි ග්‍රාමීය මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සඳහා අප විසින් ආයෝජනය කරනු ඇත. ගංවතුර හා නාය යාම්වලින් විනාශ වූ මාර්ග වැඩිදියුණු කිරීමටද කටයුතු කෙරේ. රු. මිලි. 4,000

226. නියමු ව්‍යාපෘතියක් ලෙස කරන ලද 'සැරිසර' නැතහොත් පෙර ගෙවුම් ඉලෙක්ට්‍රොනික කාඩ් පත් වැඩසටහනේ (Touch Travel Pass Program) සාර්ථකත්වය සලකා පෞද්ගලික අංශය ද ඇතුලත් වන පරිදි මෙම වැඩසටහන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් මෙහෙයවීමට සහාය ලබා දෙනවා. එසේම, බස් රථ ධාවනයේ දී ඒකාබද්ධ කාලසටහනක් ක්‍රියාත්මක කරනවා.

### සැමට ආරක්ෂාව

227. ගරු කථානායකතුමනි, රටේ ආරක්ෂාව තහවුරු කිරීමේදී සයිබර් ත්‍රස්තවාදය, මූල්‍ය අපරාධ, මත්ද්‍රව්‍ය හා මිනිස් වෙළඳාම, අසමමිතික තර්ජනයන් ලෙස හඳුනාගෙන

ඇත. අපගේ ආරක්ෂක බලඇණි අදාළ උපකරණ ඇතුලු යටිතල පහසුකම්වලින් සමන්විත විය යුතුය. එපමණක් නොව තොරතුරු හා තාක්ෂණික දැනුම ඇතුලු පහසුකම් පූර්ණව සැපයීමේ වගකීමක් අප වෙත පැවරී ඇත. එහිදී ජනතාවගේ පෞද්ගලිකත්වය සහ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන පරිදි තොරතුරු විග්‍රහ කිරීමත්, එම තොරතුරු සම්බන්ධයෙන් රට තුල මෙන්ම අසල්වැසි රාජ්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ වගකීම ද අපට තිබෙනවා. ඒ නිසා පහත දැක්වෙන පරිදි අදාළ සම්පත් වෙන් කෙරේ.

228. ජනතා හිතෛෂී නීති බලාත්මක කිරීමේ වෘත්තීයමය ආයතනයක් ලෙස ක්‍රියාකිරීම සඳහා හඳුනාගත් ප්‍රජා පොලිස් කටයුතු, පොලිස් ප්‍රතිසංවිධාන කාර්යයේ මූලික අංගයක් ඉදිරිපත් කෙරේ. රු. මිලි. 100

229. ගරු අග්‍රාමාත්‍යතුමාගේ අදහසක් අනුව පොලිස් සහ අපරාධ කටයුතු පිළිබඳ විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කෙරේ. මෙහිදී මානව හිමිකම්, ජාත්‍යන්තර නීතිය හා ආරක්ෂාව, අපරාධ විද්‍යාව, අධිකරණ සහ විමර්ෂන සහ බුද්ධිමය විෂ්ලේෂණ ක්‍රම ආදී ක්ෂේත්‍ර පිලිබඳ මූලික අවධානයක් යොමු කෙරේ. රු. මිලි. 125

230. නූතන අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතීන් වැඩි දියුණු කරමින් ශ්‍රී ලංකා පොලිසියේ, අන්තර්ජාල අපරාධ විමර්ශන අංශය ශක්තිමත් කෙරේ. රු. මිලි. 440

231. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අපගේ සාමසාධක හමුදාවන් පිලිබඳ ප්‍රශංසාත්මකව සඳහන් කරමින් ඒ සඳහා සහභාගිත්වය වැඩිකරන ලෙස ශ්‍රී ලංකාවෙන් ඉල්ලා ඇත. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා සහභාගිවන ශ්‍රී ලංකා සොල්දාදුවන් වෙනුවෙන් විශේෂිත පුහුණු හා සංවර්ධන පාඨමාලාවන් ක්‍රියාත්මක කෙරේ. රු. මිලි. 750

**නීති ප්‍රතිසංස්කරණ**

232. ගරු කථානායකතුමනි, විනිශ්චයකාරවරුන් හා කාර්ය මණ්ඩල හිඟය මෙන්ම භෞතික සම්පත්වල හිඟයද අපගේ අධිකරණයන්හි නඩු ගොඩගැසීමට හේතුවී ඇත. ආරවුල් සමථකරණය ප්‍රමාදවීම සිවිල් සමාජයේ කලකිරීමකට පමණක් නොව වාණිජ කොන්ත්‍රාත් බලාත්මක කිරීමට ද බලපා ඇත. එනිසා රටතුල ව්‍යාපාර පවත්වාගෙන යාමේ පිරිවැය ඉහල යාමට ද හේතුවී ඇත. එවැනි අධිකරණයන්හි යටිතල පහසුකම් නංවාලිය යුතුය. මෙම පසුබිම තුළ පහත යෝජනා ඉදිරිපත් කෙරේ.

233. අපගේ අධිකරණ තුල ගොඩගැසී ඇති මූල්‍ය අපරාධ, දූෂණ හා සංවිධානාත්මක අපරාධ ඇතුලත්ව, විසඳීමට තිබෙන අතිවිශාල නඩු ඉක්මනින් විසඳීම සඳහා විශේෂිත මහාධිකරණයක් ස්ථාපිත කිරීමට ආධාර දෙනු ඇත. මෙම අධිකරණ පරිපාලන කටයුතු වේගවත් කිරීම සඳහා නවීන ශ්‍රව්‍ය හා දෘශ්‍ය පටිගත කිරීමේ පද්ධතියක් ස්ථාපිත කෙරෙනු ඇත. රු. මිලි. 25

234. ස්වයංක්‍රීය නඩු කළමනාකරණ යාන්ත්‍රණයක් ද, අපි විසින් හඳුන්වා දීමට කටයුතු කරන්නෙමු. රු. මිලි. 50

235. රත්නපුර හා වැලිමඩ අධිකරණ ගොඩනැගිලි පහසුවෙන් නායයාමට ලක්විය හැකි ස්ථානවල පිහිටා ඇති බවට හඳුනාගෙන ඇත. එහෙයින් මෙම අධිකරණ සංකීර්ණ දෙක වෙනත් ස්ථානවල ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙනවා. රු. මිලි. 500

236. කිලිනොච්චිය, තෙල්දෙණිය, පූගොඩ සහ කන්තලේ අධිකරණ සංකීර්ණයන්හි පවතින තදබදය හේතුවෙන් ද ඒවායෙහි පවතින අඩු පහසුකම් හේතුවෙන් ද මෙම රු. මිලි. 400

අධිකරණ සංකීර්ණයන් වෙනත් ස්ථානවල ස්ථානගත කිරීම හා පුළුල් කිරීමට කටයුතු කරනවා.

237. බාල අපරාධකරුවන් සහ වින්දිතයන් උසාවි සඳහා රැගෙන යාමේදී වැඩිහිටි වරදකරුවන්ද සමඟ ප්‍රවාහනය කිරීම තුලින් බාලවයස්කරුවන් විවිධ අපහසුතාවයන්ට ලක්වන බව හඳුනාගෙන ඇත. මේ සඳහා පිලියමක් ලෙස බාල අපරාධකරුවන් සහ වින්දිතයන් වෙන්ව ප්‍රවාහනය කිරීම සඳහාම වූ වාහන ලබා දීමට කටයුතු කෙරේ. රු. මිලි. 50

## ප්‍රාග්ධන වෙළඳපල ශක්තිමත් කිරීම

238. අපගේ ප්‍රාග්ධන වෙළඳපල තවමත් උපරිම ලෙස භාවිතයට ගෙන නොමැත. ප්‍රාග්ධන වෙළඳපොල තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව සහ ප්‍රතිපත්ති වාතාවරණය තහවුරු කිරීමට අප විසින් කටයුතු කරනු ඇත. මේ පදනම මත උපාය මාර්ගික නොවන ව්‍යාපාරවලට අපගේ බැඳියාව ලිහිල් කරනු ඇත. එය කොටස් වෙළඳපල ප්‍රසාරණය වීමට හේතු වනු ඇත. වර්ධනීය හැකියාවක් සහිත ව්‍යාපාර සඳහා දීර්ඝකාලීන අරමුදල් අඩු පිරිවැයකට ලබාගැනීමට ඉඩ සැකසෙන පරිදි අපේ ප්‍රාග්ධන වෙළඳපල වර්ධනය වේගවත් කළ යුතු වනවා.

239. 2019 වසර වන විට බාසල් III (Basel III) අවශ්‍යතා අනුව අපගේ බැංකු ක්ෂේත්‍රයේ සපුරා ගත යුතු ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය වශයෙන් වැදගත්කමක් ඇති බැංකු 6 ක් හඳුනාගෙන ඇති අතර ඒවායින් 3 ක් එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, රාජ්‍ය බැංකු වන අතර ඒවා සියල්ලම ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ගෙන් පෙලෙන බැංකුවේ. ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකු තමන්ගේ ශේෂ පත්‍රයන්හි ශක්තිය මත ප්‍රාග්ධන වෙළඳපලින් මුදල් ලබාගැනීමට තරම් පරිණතබවක් ප්‍රදර්ශනය කරමින් අන්තර්ජාතික වෙළඳපල වෙත තමන්ගේ මූලධන අවශ්‍යතා සපුරා ගැනීමට සාර්ථක ලෙස ප්‍රවේශ වී ඇත. මෙම තත්ත්වය තුළ, අප ලංකා බැංකුවට සහ මහජන බැංකුවට ණය සහ ස්කන්ධ ප්‍රාග්ධනය ලබාගැනීමට අවස්ථාව ලබා දීමට කටයුතු කරනවා. ස්කන්ධ ප්‍රාග්ධනය උපයා ගැනීමේදී රජය තම පාලන අයිතිය අත්නොහරින නමුත් තැන්පත් කරුවන්ට සහ සේවකයන්ට, කොටස් හිමියන් වීමේ අවස්ථාව ලබා දෙනවා. කෙසේ වුවද, අතරමැදි පියවරක් ලෙස 2017 වර්ෂයේ ලංකා බැංකුව සඳහා රු.බිලියන 5 ක් ද 2018 වර්ෂයේදී තවත් රුපියල් බිලියන 5 ක් ද, ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස ලබා දෙනවා. එමෙන්ම 2017 වර්ෂයේදී රුපියල් බිලියන 2.5 ක් ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ලබා දෙනවා. රු. මිලි. 5,000

## උරුමය හා සංස්කෘතිය

240. ගරු කථානායකතුමනි, අප සතුව පොහොසත් ජාතික උරුමයක් ඇත. මෙම පොහොසත් බවේ අත්දැකීම මීලඟ පරම්පරාවන් වෙත ලබා දීමට එය ආරක්ෂා කර ගැනීම අප විසින් කල යුතුය. ආගමික ස්ථාන සහ පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුත් ස්ථාන විධිමත් ලෙස ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සහතික කිරීමට ද අප රජය උනන්දුවෙන් කටයුතු කර ඇත. එසේම අපගේ කලාව සහ කලා ශිල්පීන් ද ආරක්ෂා කිරීමට තවදුරටත් කටයුතු කරනවා. ඒ අනුව පහත සඳහන් යෝජනා ඉදිරිපත් කෙරේ.

241. මහජන පුස්තකාලයේ සහාය ඇතිව අප විසින් බෞද්ධ පුස්තකාලයක් ආරම්භ කරනවා. රු. මිලි. 50

242. රටපුරා ඇති අපගේ පුරාණ විහාර සහ පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන මෙන්ම හින්දු, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් විස්වාසයන්ට අයත් එවැනි ස්ථාන ප්‍රතිස්ථාපනය හා ප්‍රතිසංස්කරණය සඳහා ආධාර කරනු ලබනවා. රු. මිලි. 250

243. අනුරාධපුරය, ශ්‍රීපාදය, මඩු, කෝනේස්වරම්, මුන්නේශ්වරම් සහ නල්ලූර් ප්‍රදේශවල වන්දනාකරුවන් සඳහා විශ්‍රාම ශාලා ඇති කිරීමට කටයුතු කෙරේ. රු. මිලි. 100

244. රිටිගල හා රජගලතැන්න පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂාකොට සංරක්ෂණ කටයුතු කිරීම තවදුරටත් ක්‍රියාත්මක කෙරේ. රු. මිලි. 25

245. රේස්කෝස් ගොඩනැගිල්ල කලා, කැටයම් හා නවීන මෝස්තර සඳහා වූ ජාතික මධ්‍යස්ථානය ලෙසට පරිවර්ථනය කෙරෙනු ඇත. මෙය පාරම්පරික මෙන්ම නූතන කලාකරුවන් සහ කැටයම් ශිල්පීන් හා මෝස්තර කරුවන් සඳහා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කෙරෙන අතරම එය ප්‍රදර්ශන ස්ථානයකට සීමා නොවී වෙළඳපලට සම්බන්ධ කෙරෙනු ඇත. කලාකරුවන් හා මෝස්තරකරුවන්ට තම සහජ හැකියාවන් දේශීයව මෙන්ම විදේශීයව එළිදක්වීමට ද මේ යටතේ අවස්ථාව ලැබෙනවා. රු. මිලි. 250

246. නැඟී එන මැදි හා ඉහල මැදි ආදායම් සහිත ජනතාව සඳහා එම ජනතාව ජීවත්වන නගර ආශ්‍රිතව විනෝදාත්මක පහසුකම් සැපයීමේ ප්‍රබල අවශ්‍යතාවයක් මතුව ඇත. ඒ අනුව නූතන කලා කටයුතු සංවර්ධනය දිරිගැන්වීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ සෞන්දර්ය කලා රංගායතනයක් මොරටුව ප්‍රදේශයේ ඉදිකරනු ඇත. රු. මිලි. 600

247. මන්නාරමෙහි තාල්වුපාඩු සංස්කෘතික ශාලාව ප්‍රතිසංස්කරණය කෙරේ. රු. මිලි. 25

248. ජනාධිපති සුභසාධක අරමුදල සහ ටවර්හෝල් පදනමේ සහයෝගය ඇතිව කලාකරුවන් සඳහා හදිසි සහ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනවා. රු. මිලි. 10

**රාජ්‍ය අංශය**

249. ගරු කථානායකතුමනි, ලෝකයේ වෙනත් රටවල සිදුවන අයුරින්ම, අපගේ රාජ්‍ය අංශයේද කාර්යක්ෂමතාවය නැංවීමට හා ප්‍රතිසංස්කරණයන් සිදුකිරීමට පීඩනයක් ඇත. කාර්යක්ෂම හා ඵලදායී සේවා සැපයීමකට බාධා ඇතිකරමින් අපගේ නිලබල ව්‍යුහය වසර ගණනාවක් තිස්සේ අභියෝගයට සහ පරීක්ෂාවට ලක් වී නැත. තරගකාරිත්වය තහවුරු කිරීම සඳහා වන දැඩි අවශ්‍යතාවය ඒකාන්තයෙන්ම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සඳහා වන වැදගත් යාන්ත්‍රණයකි. නව තාක්ෂණය භාවිත කිරීම හා නීතියේ හා රෙගුලාසිවල වෙනස්වීම් ද මේ සඳහා අවශ්‍යයය. රාජ්‍ය සේවකයන් බලගැන්වීම මෙහිදී වඩාත් වැදගත්ය. මෙම සන්දර්භය තුළ පහත යෝජනා ඉදිරිපත් කෙරේ.

250. ඩිජිටල්කරණය තුලින් රජයේ ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සහ තාක්ෂණික යෙදවීම් හරහා සේවා ඉහළ තත්ත්වයකට නැංවීම තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයට පවරා දී ඇත. දැනට ක්‍රියාත්මක කාර්යයන් සඳහා සහ ආයතනයේ මෙහෙයුම් වියදම් සඳහා රු.මිලියන 2,000 ක මුදලක් වෙන් කරනවා. රු. මිලි. 2,000

251. ජාතික ආර්ථික සභාව විසින් සම්බන්ධීකරණ ප්‍රවේශයක් මත රජයේ සංවර්ධන ප්‍රතිපත්ති සැකසීම සහතික කෙරේ. රු. මිලි. 300

252. භාණ්ඩාගාරයේ සියළු දෙපාර්තමේන්තු සම්බන්ධ කරමින් ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉතා මෑතකදී දියත් කරන ලදි. ITMIS වැඩසටහන මගින් දියුණු භාණ්ඩාගාර කළමනාකරණයක් සඳහා පහසුකම් සලසයි. එමගින් විශේෂයෙන්ම බාහිරව පිහිටි විදයම් ඒකකයන් හි ධාරිතා වර්ධනය සඳහා ද යටිතල රු. මිලි. 500

පහසුකම් සංවර්ධනය සඳහා ද ආධාර කෙරේ. නව ගිණුම් වැඩසටහනක් ITMIS යටතේ ක්‍රියාත්මක කෙරේ.

253. රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා පොදු වැටුප් ගෙවීම් ක්‍රමවේදයක් හඳුන්වා දෙනවා.

254. ඉදිරි වසර 10 තුලදී දැනට ක්‍රියාත්මක වන වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරනු ලබන ගිණුම්කරණ ක්‍රමවේදය, උපචිත ගිණුම්කරණ ක්‍රමවේදයට මාරු කරනු ඇත. මෙමඟින් වගවීම හා විනිවිදභාවය තහවුරු කරමින් රටේ ශේෂ පත්‍රය වැඩි දියුණු කෙරේ.

255. තවදුරටත් සිදු කරන ආයෝජන මගින් පළාත් පාලන ආයතනවල ශක්තිය සහ ධාරිතාවය වර්ධනය කිරීමට කටයුතු කෙරේ. රු. මිලි. 150

256. රටේ විනිවිදභාවය, වගවීම සහ තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම තහවුරු කිරීම සඳහා ජාතික ඇගයීම් ප්‍රතිපත්ති හා ඇගයීම් පද්ධතියක් හඳුන්වා දෙනවා.

257. රාජ්‍ය අංශයේ වැටුප් විෂමතා පිළිබඳ පරිපූර්ණ අධ්‍යයනයක් කිරීමට සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂමෙන් ඉල්ලා සිටිනවා.

258. පුද්ගලික අංශයේද සහයෝගය සහිතව රාජ්‍ය ආයතනවල සේවකයන්ගේ දරුවන් රැකබලා ගැනීමට ළමා සුරැකුම් පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය වැඩසටහන් ආරම්භ කරනු ඇත. මෙහිදී සේවකයන් 500 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින රජයේ ආයතනවල හෝ ආයතන කිහිපයක් එක්ව ගත් විට 500 ට වැඩිවන ආයතනවල මෙවැනි ළමා සුරැකුම් පහසුකම් ඇතිකරනු ඇත. රජය විසින් මෙම පහසුකම් පුද්ගලික අංශය වෙතින් ලබා ගැනීමට කටයුතු කෙරේ. රු. මිලි. 50

259. 2016 න් පසුව විශ්‍රාම ගත් විශ්‍රාමිකයින්ට ජීවිත කාලය පුරාවටම අග්‍රහාර ආවරණය ලබා දී ඇත. මෙම සහනය සෑම විශ්‍රාමිකයෙකු සඳහාම ඔවුන් විසින් දායකත්ව වාරික ගෙවීමේ පදනම මත ජීවිත කාලය පුරාම ලබා දීමට කටයුතු කරනවා. රු. මිලි. 50

260. උපරිම මුදල්මය සීමාවක් ඇතුලත් වන පරිදි රජයේ සේවකයින් සඳහා ක්‍රියාත්මක වන සහනදායී වාහන යෝජනා ක්‍රමය මගින් ලබාදෙන බදු සහනය තවදුරටත් ක්‍රියාත්මක කෙරේ.

261. රජයේ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන සේවා සඳහා අයකරනු ලබන ගාස්තු වසර කීපයකින් සංශෝධනය කර නොමැත. එබැවින්, වර්තමාන ආර්ථික දර්ශකයන් නිරූපනය වන පරිදි කාලීනව ගාස්තු සංශෝධනය කළ යුතුය. එම නිසා, පසුගිය වර්ෂ 03 ඇතුලත සංශෝධනය කර නොමැති එවැනි ගාස්තු සියයට 15 කින් වැඩිකිරීමට යෝජනා කෙරේ.

**සංහිඳියාව**

262. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව දියුණු ආර්ථිකයක් බවට පත්වීමේ අරමුණට ළඟාවීමට නම්, අපේ අනාගත සැලසුම් ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව යන ශක්තිමත් පදනම් මත ගොඩනැගීම අත්‍යවශ්‍යයි. ජාතියක් වශයෙන් අතීතයේදී අපි මුහුණදුන් ශෝචනීය ව්‍යසනයන් නැවත ඇති නොවීමට අපි වගබලා ගත යුතුයි. 2025 දී පොහොසත් රටක් බවට පත්වීමේ අභිලාශය අත්කර ගැනීමට නම්, අප රටේ විවිධත්වය මත පදනම් වූ සංහිඳියාව සහ ජාතික ඒකාග්‍රතාවය තිබීම අවශ්‍යම වේ. එමනිසා, සියලු ජනවර්ග එකතුකර කටයුතු කිරීමට රජය දිගින් දිගටම කැපවී කටයුතු කරනවා. යුද්ධය දිනුවත් සාමය ලබා ගැනීමට තවමත් කටයුතු කර නැහැ. ඒ සඳහා යුද්ධය පැවති ප්‍රදේශවල ජීවත් වූ අයගේ හදවත් දිනා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ඔවුනගේ ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කළ යුතුය. ආර්ථික සංවර්ධන ප්‍රතිලාභ ඔවුනට අත්කර දිය යුතුය.

263. අතිගරු ජනාධිපතිතුමා විසින් යෝජනා කල පරිදි උතුරු හා නැගෙනහිර පළාත්වල නිවාස 50,000 ක් ඉදිකිරීමට කටයුතු කෙරේ. මෙම මුදල වෙන්කර ඇත්තේ අනිකුත් අමාත්‍යාංශවලට වෙන්කරන ලද මුදල්වලට අමතර වශයෙනි. රු. මිලි. 750

264. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය, සහ වැසි ජලය එකතු කිරීම මෙන්ම බිඳීති ජල වාරික්‍රමය ඇතුලත් ප්‍රාදේශීය වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් හා ක්‍රියාකාරකම් සඳහා රජය ආධාර ලබා දෙනවා. රු. මිලි. 2,000

265. සහජීවනය අරමුණුකොට ගත් ජීවනෝපාය සංවර්ධනය, ආර්ථික බලගැන්වීම සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කෙරේ. එසේම, වෙනස් වූ හැකියාවන් සහිත උතුරේ වෙසෙන කාන්තාවන් සඳහා විශේෂ නිවස්නයන් ඉදිකිරීම ද මෙයට ඇතුලත් වෙනවා. රු. මිලි. 2,750

266. ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් ඇති කරන ලද ග්‍රාමීය ණයගැතිභාවය බරපතල ගැටළුවක් බවට පත් වී තිබෙනවා. කාරක ප්‍රාග්ධනය සහ ස්කන්ධ ප්‍රාග්ධනය යන සාධක අවම වීම මත උතුරු පළාතේ ඇති කුඩා කර්මාන්ත පවත්වාගෙන යාමට නොහැකි වී තිබෙනවා. ඒ වෙනුවෙන් පහත සඳහන් යෝජනාවන් කරනවා.

267. ණයගැතිභාවයට පත් වූ අයට සහනයක් සැලසීම සඳහා ප්‍රදාන සහ අඩු පොලී සහිත ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනවා. සමූපකාර ග්‍රාමීය බැංකු සහ සකසුරුවම් සහ ණය දෙන සමූපකාර සංගම් හරහා මෙම ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට රජයේ සහය ලබාදෙනවා. එමගින් ණය උගුලෙන් බේරීමට සහයා වනවා. මෙම යෝජනා ක්‍රමය උතුරු සහ උතුරු මැද පළාත් තුල නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනවා. රු. මිලි. 1,000

268. 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' ණය යෝජනා ක්‍රමය යටතේ දැනට ක්‍රියාත්මක වන සහනදායී ණය යෝජනා ක්‍රම මගින් පවත්නා කුඩා කර්මාන්තවල නිෂ්පාදනය වැඩිකිරීම සහ වෙළඳපොළ සම්බන්ධතාවය ඇතිකර ගැනීම සඳහා පහසුකම් ලබාදෙනවා.

269. ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති ජාලය බලගැන්වීමෙන් උතුරු පළාත තුළ තෝරාගත් කුඩා කර්මාන්ත දියුණුව සඳහා ප්‍රදානයන් ලබා දෙනවා. රු. මිලි. 1,000

270. ප්‍රධාන වශයෙන් ශාක යුෂ පාදක නිෂ්පාදන වන තල් හකුරු, තල් පළතුරු සහ තල් අල සහ අල වර්ග මත පදනම් වන ආහාර සැකසුම් මධ්‍යස්ථාන 02 ක් පිළිවෙලින් ඩෙල්ෆ්ට් දූපතේ සහ කිලිනොච්චිවල පිහිටුවනවා. රු. මිලි. 40

271. යුද්ධය හේතුකොටගෙන ජීවනෝපාය අහිමි වූවන් ඔවුන්ගේ මුල් ඉඩම්වල පදිංචි කොට නැවත ඔවුනගේ මුල් රැකියාවල යෙදවීම සඳහා මයිලඩි වරාය ධීවර වරායක් ලෙස සංවර්ධනය කරනවා. ධීවරයන්ට ඔවුනගේ මාළු අස්වැන්න ගබඩා කිරීමට හැකිවන පරිදි, ශීතාගාර හා ගබඩා පහසුකම් ස්ථාපිත කිරීමට අප කටයුතු කරනු ලබනවා. රු. මිලි. 150

272. අච්චුවේලි කර්මාන්ත කලාපයෙන් සියයට 50 ක් පමණ දැනට භාවිතයට ගනු ලබයි. එම කලාපයේ ස්ථාපිත කරනු ලබන සමාගම්වල ඉදිරි වසර 2 ක කාලය තුල විදුලි වියදමින් සියයට 50 ක් රජය විසින් දැරීමට මා යෝජනා කරනවා. එසේම, අච්චුවේලි කර්මාන්ත කලාපයේ පහසුකම් වැඩිදියුණු කිරීමට ද කටයුතු කරනවා. රු. මිලි. 100

273. යාපනයේ නවීන ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු කරන අතර එම මධ්‍යස්ථානය දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය සහ කොළඹ සමග සම්බන්ධ කරනු ලබනවා. | රු. මිලි. 100

274. ස්වාධීන රූපවාහිනී සේවයේ වසන්තම් නාලිකාවේ සේවය වැඩිදියුණු කිරීමට ආධාර ලබා දෙනවා. | රු. මිලි. 50

275. ජාතික භාෂා සංවර්ධන වැඩසටහන සහ ජාතික සහජීවන වැඩසටහන තුලින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් වෙන්කර දීමට කටයුතු කරනු ලබනවා. | රු. මිලි. 200

276. ජීවනෝපාය පහසුකම් සැලසීම තුලින් යුද්ධය සහ ගැටුම් නිසා අවතැන්වූ වැන්දඹුවන් සහ පුනරුත්ථාපනය කරන ලද හිටපු සටන්කාමීන් සමාජයේ ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ග්‍රහනය කර ගැනීම අවශ්‍ය වී ඇත.

277. යුද්ධය නිසා බලපෑමට ලක්වූ කාන්තාවන් විසින් ක්‍රියාත්මක කරන සුළු වෙළඳ ව්‍යාපාර සංකල්පයක් වන "අම්මච්චි" සංකල්පය අගය කරන අතර එම ව්‍යාපාර සඳහා තවදුරටත් පහසුකම් සලසනු ලබනවා. | රු. මිලි. 25

278. පුනරුත්ථාපනය කරන ලද හිටපු සටන්කාමීන් 12,600 කට ස්ථාවර ජීවනෝපායක් සැලසීම ද අත්‍යවශ්‍ය වේ. එසේ වුවද, ඔවුන් සතුව නිපුනතාවයන් තිබුන ද, වැඩි දෙනෙකු සඳහා කිසිදු විධිමත් සුදුසුකමක් නැහැ. ඔවුනට රැකියාවක් ලබා ගැනීමට හැකිවන පරිදි ඔවුනගේ නිපුනතාවයට සරිලන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ජංගම සේවයක් මගින් ක්‍රියාත්මක කරනු ලබනවා. මෙම පහසුකම යුද්ධය පැවැති කාලයේ අධ්‍යාපනය කඩාකප්පල් වූ උතුරු නැගෙනහිර අයට ද ලබා දෙනවා. | රු. මිලි. 25

279. එමනිසා, පුනරුත්ථාපනය වූ හිටපු සටන්කාමීන් 05 දෙනෙකු බඳවාගන්නා පෞද්ගලික අංශයේ ආයතනවලට, මාසිකව වැටුප රුපියල් 10,000 ක උපරිමයකට යටත්ව එක් පුද්ගලයකු සඳහා සියයට 50 ක වැටුප් සහනාධාරයක් මාස 12 ක් දක්වා ක්‍රියාත්මක වන පරිදි ලබා දෙනවා. | රු. මිලි. 250

280. 1990 මුල් භාගයේ දී උතුරු ප්‍රදේශයේ ජීවත්වූ සියලුම මුස්ලිම් ජාතිකයන් LTTE සංවිධානය විසින් එම ප්‍රදේශවලින් බලහත්කාරයෙන් ඉවත් කරන ලදි. එම කාලයේ සිට වැඩිදෙනෙකු අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයන් ලෙස ජීවත් වෙනවා. එසේ, අවතැන් වූ පුද්ගලයින්ගේ නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 2,500 ක් වෙන්කරනු ලබනවා. සිලාවතුර ප්‍රදේශයේ නගර සංවර්ධන වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කිරීමත්, මන්නාරම නගර ප්‍රදේශය පුනරුත්ථාපනය කිරීමත් ඇතුළුව නැවත පදිංචි කිරීමේ වැඩසටහන වේගවත් කිරීම සඳහා මෙම මුදල් වෙන් කරනු ලබනවා. | රු. මිලි. 2,750

281. මෙම සභාව විසින් අනුමත කරන ලද අතුරුදහන් වූවන්ගේ කාර්යාලයේ මෙහෙයුම් කටයුතු 2018 වර්ෂයේ සිට ආරම්භ කරනවා. | රු. මිලි. 1,400

282. කාලය දීර්ඝ කරනු ලැබූ සංහිඳියා යාන්ත්‍රණය සඳහා වන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ කටයුතු සඳහා ආධාර ලබා දෙනවා. | රු. මිලි. 180

**ජීවන වියදම සඳහා සහාය**

283. මෙම වර්ෂයේ ඇතිවූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනවල විශාල අඩුවීමක් ඇතිවුනා. විශේෂයෙන් සහල් සහ පොල් නිෂ්පාදනයට මෙය දැඩි ලෙස බලපෑවා. මෙහි ප්‍රතිඵලයක් ලෙස අත්‍යවශ්‍ය ආහාර මිල ගණන් වලට ඍජු බලපෑමක් ඇති වුනා. ජීවන වියදමේ බලපෑම අවම කිරීම සඳහා මෑතදී අප

විසින් ක්‍රියාමාර්ග කීපයක් ගනු ලැබුවා. එම පියවරයන් අතරට ඒයේ සිට ක්‍රියාත්මක වූ බී ලූනු, අර්තාපල්, පරිප්පු, කරවල , හාල්මැස්සන් සහ එළවළු තෙල් සඳහා ආනයන බදු අඩුකිරීම ද ඇතුලත් වෙනවා.

284. රජය විසින් ගාස්තුවකින් තොරව ලබාදෙන පොදු ස්ථානවල සාධාරණ මිලට භාණ්ඩ අලෙවිකරන සිල්ලර වෙළඳසැල් පිහිටුවීම මගින් මෙම කාර්යය තව දුරටත් ශක්තිමත් කරනවා. පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ ලැබෙන සේ වෙළඳපල මිලට වඩා අඩු මිලකට පාරිභෝගික ද්‍රව්‍ය ලබාදීමට මෙම වෙළඳසැල් හිමිකරුවන් බැඳී සිටිනවා.

285. භාණ්ඩවල ගුණාත්මක භාවය සහ මිල වෙනස් කිරීම් මගින් සිදුකරන අකටයුතුකම් වලින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට පාරිභෝගික සේවා අධිකාරිය ශක්තිමත් කරනු ලබනවා.

**ණය ආපසු ගෙවීමේ විශේෂ බද්ද**

286. ගරු කථානායකතුමනි, රුපියල් බිලියන 7,000 ක ණය ආපසු ගෙවීමට ඇති බැවින් ඉදිරි වසර තුන ඉතා බැරෑරුම් කාලයක් වනු ඇත. මෙයට රුපියල් බිලියන 600 ක් තරම් වූ සෑම වසරකම කල් පිරෙන ස්වෛරී අන්තර්ජාතික බැඳුම්කර ආපසු ගෙවීම් ද ඇතුලත්ය. රාජ්‍ය මූල්‍ය තත්ත්වය කෙරෙහි මෙම ණය අධික බලපෑමක් ඇතිකරනු ලබයි. 2018 වර්ෂය සඳහා පමණක් ණය ආපසු ගෙවීම සඳහා රුපියල් බිලියන 1,970 ක් අවශ්‍යවේ. පසුගිය වසර දෙක තුළ ද සිදු කළ පරිදි මතුව ඇති ණය අර්බුදය තුල වුවද, 2018 වර්ෂය සඳහා සිදුකිරීමට නියමිත රාජ්‍ය ආයෝජනයන් අප අඩු කළේ නැහැ. කෙසේ නමුත්, අපට සහාය අවශ්‍ය වෙනවා. එමනිසා 2018.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු මගින් සිදුකරනු ලබන සියළු ගනුදෙනු සඳහා රුපියල් 1,000 කට ශත 20 ක් වන අනුපාතයක් අනුව ණය ආපසු ගෙවීම සඳහා වූ විශේෂ බද්දක් අයකිරීමට යෝජනා කරනවා. මෙය ඉදිරි වසර 03 සඳහා පමණක් අදාල වන අතර මෙය ගනුදෙනුකරුවන්ගෙන් අයකිරීමට ඉඩ දෙන්නේ නැහැ.

**ආදායම් පරිපාලනය**

**රේගුව**

287. අවශ්‍ය ආරක්ෂණ පියවර සමඟ නිර්බාධක වෙළඳාම දිරිමත් කිරීමට අප ලබා දුන් එකඟතාවයට අනුව වසර 148 ක් පැරණි රේගු ආඥා පනත වෙනුවට නව නීති පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කරනවා. ලියකියවිලි රහිතව භාණ්ඩ නිශ්කාශනය කිරීමේ ක්‍රමවේදය තහවුරු කිරීමේ අපේක්ෂාවට අනුකුලවන පරිදි, ඩිජිටල් අත්සන් පිළිගත් විද්‍යුත් ලියකියවිලවලට යොදන ක්‍රමවේදය ඉතා කඩිනමින් ක්‍රියාත්මක කරනු ලබනවා.

288. 2017.11.10 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ලෝක රේගු සංවිධානය විසින් පලකරන ලද රේගු සංයෝජිත වෙළඳ භාණ්ඩ සවිස්තරණ සහ සංයෝජිත වර්ගීකරණ සංකේතයන්හි 2017 සංස්කරණය ශ්‍රී ලංකාවද යොදා ගනු ලබනවා.

289. 2018 ජනවාරි මස 01 දින සිට ආනයනයට අදාල සියළු ලියකියවිලි මෙහෙයවීම ස්වයංක්‍රීයව සිදුකිරීමට කටයුතු කරනවා.

290. ආදායම් කාන්දුවීම ප්‍රධාන මාර්ගයක් බවට නීති විරෝධීව ගෙන්වනු ලබන සිගරට් දේශීය වෙළඳපලට ගලායෑම හේතුවක් වී ඇත. නීති විරෝධීව විශාල වශයෙන් ගෙන්වනු ලබන දුම්වැටි අධෛර්ය කිරීම සඳහා ආනයනය කරනු ලබන දුම්වැටි සහ සුරුට්ටු සඳහා බලපත්‍ර නිකුත් කරනවා. මෙය මෙම ගැටළුව සඳහා ක්‍රියාත්මක කරනු ලබන එක් ක්‍රමවේදයක් පමණයි.

291. 2018 ජනවාරි මස 01 දින සිට මෝටර් වාහන ආනයනය කිරීමේදී භාවිතා කරන කාලීන ණයවර ලිපි (Usance LC) පහසුකම් සඳහා අවසර ලබා නොදේ.

**දේශීය ආදායම්**

292. දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා රැමිස් (RAMIS) ව්‍යාපෘතිය සුදුසු ආකාරයට වෙනස් කරනු ලබනවා. රු. මිලි. 500

**සුරාබදු**

293. වර්තමාන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි, 1912 සුරාබදු ආඥාපනත නැවත සකස් කිරීමට අවශ්‍යවේ. දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණයේ භාවිතය අවම මට්ටමක පවතිනවා. ඒ නිසා සුරාබදු ආදායම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙනු ලබනවා. රු. මිලි. 50

294. මත්පැන් නිෂ්පාදනය අධීක්ෂණය පිණිසත් තහනම් මත්පැන් නිෂ්පාදනය අවම කිරීමට සහායවීම පිණිසත්, ප්‍රමාණය මත පදනම්ව එතනෝල් නිෂ්පාදනයට භාවිතා කරන අමුද්‍රව්‍ය මත සුරාබද්දක් පැනවීමට කටයුතු කරනවා. පානීය නොවන මධ්‍යසාර සඳහා ලීටරයකට රුපියල් 15 ක් වන සුරා බද්දක් පැනවීමට ද මා යෝජනා කරනවා. අද මධ්‍යම රාත්‍රියේ සිට මෙම යෝජනා ක්‍රියාත්මක වෙනවා.

295. ගරු කථානායකතුමනි, පසුගිය වර්ෂ දෙක තුල බදු පදනම පුළුල් කිරීම සඳහාත් බදු අයකිරීමේ වියදම් අවම කිරීම සඳහාත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හඳුන්වා දෙන ලදි. මෙම ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් වැට් බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බදුවලට අනුකූල නිදහස් කිරීම් යථාවත් කරනවා. බදු පරිපාලනය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව ආර්ථික සේවා ගාස්තු, මුද්දර බද්ද හා අනිකුත් බදු නීතිවල අවශ්‍ය වෙනස්කම් සිදු කෙරේ. යෝජිත වෙනස්කම් තාක්ෂණික සටහනේ ඇතුලත් කර ඇත.

**කෙටි පණිවිඩ මගින් සිදුකරන ප්‍රචාරණය මත බදු**

296. ගරු කථානායකතුමනි, 2018 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වන පරිදි කෙටි පණිවිඩ මගින් සිදුකරනු ලබන අලෙවි ප්‍රචාරණයන් සඳහා එක් පණිවිඩයකට ශත 25 ක ගාස්තුවක් අයකිරීමට යෝජනා කරනවා.

297. අයවැය යෝජනා සාර්ථකව අධීක්ෂණය කිරීම සඳහා මගේ අමාත්‍යාංශයේ පසුවිපරම් කිරීමේ ඒකකයක් පිහිටුවීමට කටයුතු කරනවා.

298. 2018 මුදල් වර්ෂය සඳහා 2017 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පතෙහි ණය ගැනීමේ සීමාවට අදාල සංශෝධන ඇමුණුම් III හි සඳහන් වේ. වියදම් යෝජනා ඇමුණුම් II හි දැක්වෙන අතර ආදායම් යෝජනා ඇමුණුම් I හි දක්වා ඇත. අදාල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව ඇමුණුම් IV හි ඉදිරිපත් කර ඇත. අයවැය 2 වන වර කියවීමේදී ඉදිරිපත් කල යුතු 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය වගකීම් පනත අනුව ඉදිරිපත් කල යුතු ලේඛනය ද මේ සමඟ ඉදිරිපත් කර ඇත.

299. ගරු කථානායකතුමනි, අයවැය සකස් කිරීමේ දී සිදු කරන ලද මඟ පෙන්වීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් මගේ ස්තුතිය පළ කරනවා. එමෙන්ම මගේ රාජ්‍ය අමාත්‍ය ගරු එරාන් වික්‍රමරත්න සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහත්වරුන්ට ද ඔවුන් ලබාදෙන ලද සහයෝගය පිළිබඳව ස්තුති කිරීමට කැමතියි. මෙම අයවැයට මඟපෙන්වීමක් සිදුකළ, අයවැය යෝජනා ඉදිරිපත් කළ සියල්ලන්ටම මා ස්තුති කිරීමට කැමතියි. අමාත්‍ය මණ්ඩලයේ මගේ සහෝදරයන්ටත් සහ පාර්ලිමේන්තුවේ දෙපාර්ශවයේ සිටින සියළු දෙනාම ලබා දුන් සහයෝගය වෙනුවෙනුත් ස්තුති කිරීමට කැමතියි. මගේ කථාව අවසන් කිරීමට

පෙර මෙම අයවැය සකස් කිරීමට දායක වූ මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා සහ සියලුම නිලධාරීන්ට මා ස්තුති කිරීමට කැමතියි.

300. ගරු කථානායකතුමනි, ඉදිරි දින 26 තුළ සිදුවන විවාදයේ දී ආර්ථික සංවර්ධන ප්‍රශ්න පමණක් සාකච්ඡා වන්නේ නැහැ. රටේ හැඩතලය නිර්මාණය කිරීමටත්, අපගේ දරුවන්ගේ අනාගතය තීරණය කිරීමටත්, අදාල හර පද්ධතීන් පිළිබඳව ද මෙහි දී සාකච්ඡා කරනවා. නොබෙදුණු උතුම් ජාතියත්, සැමට අයිතිවාසිකම් සහ අභිමානයත්, නීතියේ ආධිපත්‍යයත්, සවිමත් ආයතන පද්ධතියත් ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාවේ ප්‍රබල අත්තිවාරම මත ගොඩනඟන ආර්ථික සෞභාග්‍යයත් පිළිබඳව එක පාර්ශවයක් විවාද කරනවා. අනෙක් අතට, බිය, සැකය, අවිශ්වාසය, ආධානග්‍රාහීත්වය, අන් මත නොඉවසීම යන හර පද්ධතීන් පදනම් කරගෙන තවත් අය විවාදයට එකතුවන බව අවසාන වශයෙන් සඳහන් කිරීමට කැමතියි.

301. එබැවින්, ගරු කථානායකතුමනි, අපි ඉතිහාසයේ සංධිස්ථානයකට පැමිණ ඇත. නිදහස සහ සෞභාග්‍ය පිරි නව යුගයක් කරා විවිධත්වයෙන් එක්සත්ව ඉදිරියට යනවා ද? නොඑසේ නම්, අතීත අඳුරු යුගයකට ආපසු යනවාද? අප විසින් ඒ තෝරා ගැනීම කළ යුතුයි.

ස්තුතියි !

ඇමුණුම 1

**ආදායම් යෝජනා - 2018**

| | **යෝජනා** | **රු.මිලියන** |
|---|---|---|
| 1 | මධ්‍යසාර සඳහා වන බදු සංශෝධන | 10,000 |
| 2 | මෝටර් රථ නිෂ්පාදන බදු සහ සුඛෝපභෝගී වාහන සඳහා වන බදු සංශෝධන | 25,000 |
| 3 | සෙස්, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සහ වරාය හා ගුවන් තොටුපල බදු සංශෝධන | (5,000) |
| 4 | පැණි රස පාන වර්ග සඳහා වන සීනි බදු | 5,000 |
| 5 | පානීය නොවන මධ්‍යසාර සහ එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය සඳහා වන නිෂ්පාදන බදු | 3,000 |
| 6 | ප්ලාස්ටික් රෙසීන සඳහා වන නිෂ්පාදන බදු | 2,000 |
| 7 | එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සංශෝධන | 25,000 |
| 8 | සංනිවේදන කුළුණු සහ කෙටි වෙළඳ පණිවිඩ බදු | 15,000 |
| 9 | ණය ආපසු ගෙවීමේ බදු | 20,000 |
| 10 | රථ වාහන සඳහා වන කාබන් බදු | 2,500 |
| 11 | ගාස්තු හා අයකිරීම් සංශෝධන | 7,500 |
| | **එකතුව** | **110,000** |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.*

*සටහන: 2017 වර්ෂයේ නොවැම්බර් මස ක්‍රියාත්මක වීමට නියමිත අයවැය යෝජනාවල ආදායම් දැනටමත් 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර ඇත.*

**වියදම් යෝජනා -2018** **ඇමුණුම II**

(රු. මිලියන)

| | අයවැය යෝජනා | වගකීම දරන රාජ්‍ය ආයතනය | අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| | **නීල - හරිත ආර්ථිකය** | | | |
| 01. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ ඇණියට විද්‍යුත් බස් රථ හඳුන්වා දීම | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 500 |
| 02. | කෘෂි කර්මාන්තය, බිංදු ජල සම්පාදනය ඇතුලත් කෘෂි සැකසුම් කර්මාන්ත, කුකුළු පාලනය, ටින් කිරීම, වැවිලි කර්මාන්ත සහ හෝටල් කර්මාන්තයේ යෙදෙන සමාගම්හට තම විදුලිබල අවශ්‍යතාවය සපුරා ගැනීමට සූර්ය බලයෙන් විදුලි බලය නිෂ්පාදනය කිරීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. *(දැනටමත්රු. මිලියන 800 ක් වෙන්කර ඇත.)* | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 5,300 |
| 03. | දැනටමත් පොලිතීන් නිෂ්පාදනයේ යෙදී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පොලිතීන් වෙනුවට පරිසර හිතකාමී විකල්පයන් නිෂ්පාදනය කිරීමට යොමු වීමේදී ඔවුන් විසින් උපකරණ හා යන්ත්‍රෝපකරණ සඳහා වියදම් කර ඇති ආයෝජන වියදමෙන් 50% ක් සපයා දීම. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 25 |
| 04. | ජෛව හායන ද්‍රව්‍යයන් භාවිත කරමින් බෑග්, ඇසුරුම් ද්‍රව්‍යයන් යනාදිය නිෂ්පාදනයේ යෙදෙන නිෂ්පාදකයින්හට සහනදායී ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 50 |
| 05. | අරුවක්කාලුහි කැලිකසළ ප්‍රතිචක්‍රීකරණ සහ කළමනාකරණ ප්‍රදේශයක් සංවර්ධනය කිරීම. *(දැනටමත්රු. මිලියන 2,500 ක් වෙන්කර ඇත.)* | මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 3,000 |
| 06. | ඝන අපද්‍රව්‍ය ගැටලුව විසඳීම සඳහා පළාත් රාජ්‍ය නියෝජිතායතනවලට සහාය දීම. | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| 07. | කැළණි ගං ඉවුර ශක්තිමත් කිරීම සඳහා කොන්ක්‍රීට්මය ආරක්ෂක බැම්මක් ඉදිකිරීම. | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 400 |
| | වී ඔය, නවාත, හොලොම්බුව සහ රූකාසල් සහ අනෙකුත් බහුවාර්ෂික ගංගාවන්හි ඉහළ ප්‍රදේශයන්හි ජලාශයන් ඉදිකිරීම මගින් නගරබද ගංවතුර උවදුර වැළැක්වීම.*(දැනටමත්රු. මිලියන 4,100 ක් වෙන්කර ඇත.)* | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 4,500 |
| 08. | භූගත ජල සම්පත අධීක්ෂණයට සහය දීම.*(දැනටමත්රු. මිලියන 1,180 ක් වෙන්කර ඇත.)* | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1500 |
| 09. | කම්හල් සහ කර්මාන්තශාලා වලින් අපද්‍රව්‍ය ජල මාර්ගවලට බැහැර කිරීම නතර කිරීම උදෙසා "පවිත්‍ර ගංගා" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම - ඊ-මිතුරු චක්‍රීය ණය පහසුකම -*(රු. මිලියන 750 ක් චක්‍රීය අරමුදලෙන් ලබාදේ.)* | මහවැලි සංවර්ධන හා පරිසර සංවර්ධන අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 750 |
| 10. | සෑම ප්‍රාදේශීය සභා කොට්ඨාශයකම රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස හරිත උයනක් ඉදිකිරීම. | මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,500 |
| 11. | තිල්වලා එළිය ආදර්ශ උද්‍යානය*(දැනටමත්රු. මිලියන 1,000 ක් වෙන්කර ඇත.)* | මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,500 |
| 12. | දෙහිවල සත්වෝද්‍යානය සඳහා "එළිමහන් සත්වෝද්‍යාන" සංකල්පය ක්‍රියාත්මක කිරීම. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 75 |
| 13. | පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන් සඳහා යදම් රහිත නිදහස් පරිසරයක් ඇති කිරීම. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 75 |

| | | | | |
|---|---|---|---|---|
| 14. | වනජීවී සංරක්ෂණ අරමුදල මගින් ඇත්ගොව්වන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පන්නල ප්‍රදේශයේ ස්ථාපිත කිරීම. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - |
| 15. | ආවේණික සත්ත්ව විශේෂයන් සංරක්ෂණය කිරීම. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 20 |
| | **නීල ආර්ථිකය** | | | |
| 16. | ඒකාබද්ධ වෙරළබඩ කලාප කළමනාකරණ ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 17. | වෙරළ යථාවත් කිරීමේ ව්‍යාපෘතිය | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 400 |
| 18. | මීගමුවේ සිට මාරවිල දක්වා වූ වෙරළබඩ තීරය ආරක්ෂා කිරීම.(*දැනටමත්වෙන්කර ඇත.*) | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 800 |
| 19. | කලපු 10 ක් පවිත්‍ර කිරීම. | ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,000 |
| 20. | හෝටල් සහ කර්මාන්තශාලාවලින් කලපුවලට අපද්‍රව්‍ය බැහැර කිරීම නතර කිරීම සඳහා පොළී සහනදායී ණය සපයා දීම - ඊ මිතුරු යෝජනා ක්‍රමය (*චක්‍රීය අරමුදල මගින් ප්‍රතිපාදන ලබාදේ.*) | මහවැලි සංවර්ධන හා පරිසර සංවර්ධන අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 250 |
| 21. | මහාද්වීපික තටාකය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 22. | නීල හරිත ආර්ථිකය සඳහා නාමික(Virtual) ආයතනයක් ස්ථාපිත කිරීම. | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| | **තිරසර කෘෂි සහ ධීවර ආයෝජන අවස්ථා දිරිගැන්වීම** | | | |
| 23. | පරිසර හිතකාමීසහතිකකරණ වැඩසටහනක් හඳුන්වාදීම. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 24. | කුඩා සහ මධ්‍ය පරිමාණ වැව්වල රොන්මඩ ඉවත් කිරීම | කෘෂිකර්ම අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,000 |
| 25. | ගබඩා මධ්‍යස්ථාන 3 ක් අලුතින් ඉදිකිරීම සහ පවතින ගබඩා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.(*දැනටමත්රු. මිලියන 200 ක් වෙන්කර ඇත.*) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 250 |
| 26. | ගොවීන් සඳහා දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.(*රු. මිලියන 800 ක් වගාබදු මගින් ලබා දේ.*) | කෘෂිකර්ම අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 3,000 |
| 27. | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වැඩිදියුණු කිරීම. | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 200 |
| 28. | නිසරු පස වැඩිදියුණු කිරීම. | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය - ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය / කාර්මික තාක්ෂණ ආයතනය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| 29. | බහුදින යාත්‍රාවල මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ වියදමෙන් 50% ක් ලබාදීම. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 175 |
| 30. | අඩි 55 ට වඩා දිගැති බහුදින යාත්‍රා මිලදී ගැනීම.(*දැනටමත්රු. මිලියන 157 ක් වෙන්කර ඇත.*) | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 400 |
| 31. | ධීවර වරායවල්වල නැංගුරම්ලන ස්ථාන සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම.(*දැනටමත්රු. මිලියන 1,633 ක් වෙන්කර ඇත.*) | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,750 |
| 32. | ගන්දර ධීවර වරාය සංවර්ධනය කිරීම සහ වැල්ලමංකර නව ධීවර වරායක් සංවර්ධනය කිරීම. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 200 |
| 33. | "වැවක් සහිත ගමක් වැඩසටහන" (*දැනටමත්වෙන්කර ඇත.*) | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 450 |

| | | | | |
|---|---|---|---|---|
| 34. | වේක්ක මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් සහ කරදිය විසිතුරු මසුන් අභිජනන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 35. | මඩකලපුව දිස්ත්‍රික්කයේ ජලජීවී වගා කාර්මික උද්‍යානයක් ස්ථාපිත කිරීම. (*දැනටමත්රු. මිලියන 100 ක් වෙන්කර ඇත.)* | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 250 |
| **ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයන්** | | | | |
| 36. | සංවර්ධන බැංකුවක් ස්ථාපිත කිරීම | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 10,000 |
| 37. | ණය යෝජනා ක්‍රම 8 ක් ශක්තිමත් කිරීම.(*දැනටමත්වෙන්කර ඇත.)* | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 750 |
| 38. | ග්‍රාම ශක්ති සහ දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන (*දැනටමත්වෙන්කර ඇත.*) | ජනාධිපති ලේකම් කාර්යාලය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 2,000 |
| 39. | ග්‍රාමීය අංශය සඳහා සංවර්ධන වැඩසටහන් හඳුන්වාදීම. | ජනාධිපති ලේකම් කාර්යාලය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 200 |
| 40. | "ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික" මූලාරම්භයන් | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 500 |
| 41. | කාන්තා ව්‍යවසායකයින් සඳහා සහනාධාර | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 50 |
| 42. | වෙනස් හැකියාවන්ගෙන් සමන්විත වූ පුද්ගලයන් සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 15 |
| 43. | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සදහා ඇපකර අරමුදලක් ස්ථාපිත කිරීම. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 500 |
| 44. | "ඇරඹුම" ණය යෝජනා ක්‍රමය | අපනයන සංවර්ධන මණ්ඩලය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 25 |
| 45. | "තොරතුරු තාක්ෂණ මූලාරම්භය"ස්ථාපිත කිරීම. | අපනයන සංවර්ධන මණ්ඩලය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 300 |
| **දේශීය ව්‍යවසායකයින් තුළින් ගෝලීය නායකයින් බිහිකිරීම.** | | | | |
| 46. | අපනයන වෙළෙඳපොළ ප්‍රවේශය සඳහා සහය වැඩසටහන් | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 800 |
| 47. | කාර්මික තාක්ෂණික ආයතනය (ITI), ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය (SLSI), ජාතික නිරෝධායන මධ්‍යස්ථානය(NQC) සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනවලය (NARA) පරීක්ෂණ පහසුකම් ජාත්‍යන්තර මට්ටමට වැඩිදියුණු කිරීම.(ITI-50, SLSI-150, NARA-25 & NQC-25) | කාර්මික තාක්ෂණික ආයතනය/ ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය/ ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය/ ජාතික නිරෝධායන මධ්‍යස්ථානය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 250 |
| 48. | බුද්ධිමය දේපල කාර්යාලය අලුත්වැඩියා කිරීම. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| 49. | බහුජාතික සමාගම් ආයෝජන සඳහා ආකර්ෂණය කරගැනීමේ වැඩසටහන | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| 50. | ඒකීය වෙළෙඳ ද්වාරයක් ස්ථාපිත කිරීම. | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය | තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව | 25 |
| 51. | ජාතික විද්‍යාව, තාක්ෂණය සහනව්‍යකරණ සඳහා සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය, ජාතික විද්‍යා, තාක්ෂණික නවෝත්පාදන අධිකාරිය බවට පත් කිරීම. | විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| 52. | කාර්මික මූලාරම්භයන් සඳහා නවෝත්පාදකයින්(I2I) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 25 |
| 53. | යන්ත්‍ර ඉලෙක්ට්‍රෝන විද්‍යාව මගින් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI) යටතේ නිෂ්පාදන නිර්මාණකරණ ඉංජිනේරු විද්‍යාව (PDE) සඳහාසහාය දීම. හවුල් සේවා සපයන ප්‍රමිතීන් පිළිබඳ පුහුණුව, මූලාකෘතිකරණ පරීක්ෂණ පහසුකම් (SPTF 250) සහ දිගුකාලීන ණය පහසුකම (LTLF 100)(*දැනටමත් රු. මිලියන 100 ක් වෙන් කර ඇත.)* | විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 350 |
| 54. | රොබෝ තාක්ෂණික මධ්‍යස්ථානශක්තිමත් කිරීම. (25)<br>නවෝත්පාදනය සඳහාමහජන ප්‍රවේශයට ඇති ඉඩකඩ පුළුල් කිරීම සඳහා සහාය දීම.(25) | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| 55. | බෝට්ටු නිෂ්පාදනය සඳහාම වෙන් වූ කාර්මික කලාප ඇති කිරීම. | අපනයන සංවර්ධන මණ්ඩලය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 56. | කුරුඳු හා ගම්මිරිස් රෝපණ ද්‍රව්‍යයන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා පැළ තවාන් දහසක් | අපනයන සංවර්ධන මණ්ඩලය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 50 |
| 57. | කුරුඳු කර්මාන්තය පිළිබඳ පුහුණු විද්‍යාලය ශක්තිමත් කිරීම. | අපනයන සංවර්ධන මණ්ඩලය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 50 |
| 58. | කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදන ඵලදායීතාවය වැඩිදියුණු කිරිමට අවශ්‍ය සහය ලබාදීම. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 250 |
| 59. | පොල් පර්යේෂණ ආයතනය මගින් දෙමුහුන් පොල් පැළ ලබාදීම. | පොල් පර්යේෂණ ආයතනය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| 60. | රබර් වගාව ආශ්‍රිත ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 50 |
| 61. | හොරණ සහ මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානයන්හි ඉහළ ඵලදායීතාවයෙන් යුතු කෙසෙල් සහ අන්නාසි පැළ නිෂ්පාදනය කිරීම සඳහා වූ පර්යේෂණ ව්‍යාප්ත කිරීම. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| 62. | කොළඹ විශ්ව විද්‍යාලයේ කෘෂි තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යා ආයතනය සඳහා සහාය දීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| 63. | වයඹ විශ්ව විද්‍යාලයේ ආහාර, තාක්ෂණය, පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා සහාය දීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 75 |
| 64. | මල්වගා කර්මාන්තය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සලසාදීම. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 10 |
| 65. | දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන නිර්මාණකරණය සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම. | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| **සංචාරක** | | | | |
| 66. | සංචාරක කර්මාන්තයේසත්කාරක නිවාස(Home stay) වැඩසටහන සඳහා පොළී සහනාධාර | සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 10 |
| 67. | පැරණි බලකොටු 6 ක් සංවර්ධනය කිරීම. | සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමිකකටයුතු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 250 |
| 68. | දුම්රිය ස්ථානයන් වැඩිදියුණු කොට පුරාවිද්‍යාත්මක ප්‍රදේශ ලෙසට ප්‍රකාශ කිරීම. | සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 75 |
| 69. | මාදුරු ඔය සහ ගල් ඔය ජාතික උද්‍යාන, සෆාරි උද්‍යාන ලෙසට දියුණු කිරීම. | තිරසාර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 75 |
| 70. | සංචාරක සංවර්ධන අරමුදල හරහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය/ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් වෙරළ ආශ්‍රිත ජීවිත ආරක්ෂණ ස්ථාන 25 ක් ඇති කිරීම. | සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය / ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | |
| 71. | ශ්‍රී ලංකා පොලීසිය මගින් සංචාරක පොලිස් ස්ථාන 20 ක් ඇති කිරීම. | නීතිය, සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 30 |
| 72. | සංචාරක සංවර්ධන අරමුදල ( TDL)තුළින් "ශ්‍රී ලාංකික ආහාර සඳහා සන්නාම නාමයක් ලබාදීම" | සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | - |
| 73. | 70 වන නිදහස් දිනය සැමරීම සඳහා විදේශීය තානාපති කාර්යාල වලට සහායදීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| 74. | සංචාරක හිතැති ත්‍රීරෝද රථ වැඩසටහන | සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 50 |
| 75. | ත්‍රීරෝද රථ සඳහා නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීම ත්‍රීරෝද රථ සඳහා සහ මීටර් භාවිතය අත්‍යවශ්‍ය කිරීම. | ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 25 |
| **විදේශ ආයෝජන සවිබල ගන්වන පරිසරයක් නිර්මාණය කිරීම.** | | | | |
| 76. | ව්‍යාපාර ලියාපදිංචියට අදාල සියලු කටයුතු එකම ස්ථානයකින් සිදු කරනු ලබන මධ්‍යස්ථානයක් ඇති කිරීම - සමාගම් ලියාපදිංචි කිරීමේ අරමුදල් | සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | - |

| | | | | |
|---|---|---|---|---|
| 77. | පළාත් පාලන ආයතන සඳහා ඊ-රාජ්‍ය ක්‍රමයක් හඳුන්වාදීම. | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 25 |
| 78. | ඒකාබද්ධ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය (eLR) | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 150 |
| 79. | ජාතික තනි කවුළුව (Single Window)වැඩසටහන ආයතන 31 ක් සම්බන්ධ කිරීම | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 325 |
| 80. | මිල්ලනිය රෝජන කර්මාන්ත උද්‍යානය සඳහා යටිතල පහසුකම් ලබාදීම. | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 2,000 |
| 81. | බිංගිරිය සහ වැලිගම ප්‍රදේශවල කර්මාන්තපුර ඇති කිරීම. | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 500 |
| 82. | පිටිපන, මහහේනවත්ත ප්‍රදේශයෙහි අධි තාක්ෂණික නවෝත්පාදන උද්‍යානයක් ස්ථාපිත කිරීම. | විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 83. | රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ඒකකයන්හි ක්‍රියාකාරකම් | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - | 50 |
| **තරුණ ව්‍යවසායකයින් සන්නද්ධ කිරීම** | | | | |
| 84. | "රැකියා සඳහා සූදානම් කිරීමේ අරමුදල" ඇති කිරීම. | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 2,500 |
| 85. | යොවුන් සේනාංක හරහා කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය දීම.*(දැනටමත් රු. මිලියන 1,500 ක් වෙන්කර ඇත.)* | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 2,000 |
| 86. | ස්විට්සර්ලන්ත සහ ජර්මානු රජයන්ගේ අනුග්‍රහය ඇතිව ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය හා සම්බන්ධ කාර්මික විද්‍යාල 5 ක් ඇති කිරීම. | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 1,000 |
| 87. | කින්නියාහි විශ්ව විද්‍යාලයක්ස්ථාපිත කිරීම. | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| **අධ්‍යාපන** | | | | |
| 88. | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ*(දැනටමත් රු. මිලියන 1,000 ක් වෙන්කර ඇත.)* | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 3,500 |
| 89. | ජාත්‍යන්තර ශිෂ්‍ය ඇගයුම් වැඩසටහනක් (PISA)හඳුන්වා දීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| 90. | ගුරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්*(දැනටමත් වෙන්කර ඇත.)* | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 1,200 |
| 91. | "Smart Classroom" සංකල්පය ශක්තිමත් කිරීම, ඩිජිටල්කරණය හා ඊ-පෙළ පොත් සංවර්ධනය කිරීම. *(දැනටමත් රු. මිලියන 748 ක් වෙන්කර ඇත.)* | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 755 |
| 92. | මහරගම ගුරු පුහුණු පාසලට අනුබද්ධව ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් පුහුණු කරන මධ්‍යස්ථානයක් ඇති කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 50 |
| 93. | හාපිටිගම සහ අඩලච්චේන අධ්‍යාපන විද්‍යාල සඳහා විශේෂ අවශ්‍යතා පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 25 |
| 94. | ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සිසුන් සඳහා රු. 5000 ක මාසික දීමනාවක් ලබාදීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| **උසස් අධ්‍යාපන** | | | | |
| 95. | වයඹ, සබරගමුව සහ මොරටුව විශ්ව විද්‍යාල සඳහා වෛද්‍ය පීඨ ඇති කිරීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,250 |
| 96. | කරාපිටිය රෝහල සඳහා මහාචාර්ය ඒකකයක් ස්ථාපිත කිරීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| 97. | තාක්ෂණික විෂය ධාරාව ව්‍යාප්ත කිරීම සඳහා නව තාක්ෂණික පීඨ 7 ක් ඇති කිරීම.*(දැනටමත් රු. මිලියන 3,450 ක් වෙන්කර ඇත.)* | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 5,000 |

| | | | | |
|---|---|---|---|---|
| 98. | රුහුණු විශ්ව විද්‍යාලයෙහි නාවික අධ්‍යාපනය සඳහා මධ්‍යස්ථානයක් ඇතිකිරීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 250 |
| 99. | කොළඹ විශ්ව විද්‍යාලයේ දත්ත විද්‍යාව සහ විශාල දත්ත විශ්ලේෂණය, ආයු ගණක අධ්‍යයනය සහ ව්‍යාපාර විශ්ලේෂණය වැනි නව විෂය ධාරා හඳුන්වා දීමට සහය වීම. (සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව) | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 250 |
| 100. | වවුනියාව විශ්ව විද්‍යාලය සතු කලා පුස්තකාල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 200 |
| 101. | උසස් අධ්‍යාපනයෙහි ස්වාධීන තත්ත්ව සහතික කිරීමක් සහ පිළිගැනීමක් ඇති කරන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 102. | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙහි කළමනාකරණ පීඨයට ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ උසස් අධ්‍යාපන සංගමයේ (AACSB) පිළිගැනීම ලබාගැනීම සඳහා අවශ්‍ය සහය ලබාදීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 103. | දේශීය වෛද්‍ය විද්‍යාව සඳහා පශ්චාත් උපාධි පීඨයක් ඇති කිරීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 40 |
| 104. | මහපොළ ශිෂ්‍යත්ව අරමුදල සඳහා සුදුසුකම් ලබන කුටුම්භ වාර්ෂික ආදායම් සීමාව රු. ලක්ෂ 3 සිට රු. ලක්ෂ 5 දක්වා ඉහළ දැමීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 75 |
| 105. | සියලුම විශ්ව විද්‍යාල සිසුන්ට රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| | **ක්‍රීඩා** | | | |
| 106. | රටපුරා ග්‍රාමීය ක්‍රීඩා පිටි 100 ක් වැඩිදියුණු කිරීම මගින් ප්‍රජා ක්‍රීඩා සංකල්පය හඳුන්වා දීමසහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසාදීම. | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 107. | පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩාංගන වැඩිදියුණු කිරීම - දිගන ක්‍රීඩා සංකීර්ණය, පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩාංගනය සහ කල්මුණේ ක්‍රීඩා සංකීර්ණය | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 300 |
| 108. | මාතලේ හොකී ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම. | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 109. | දියගම ප්‍රදේශයේ ක්‍රීඩා පාසලක් සහ ඇකඩමියක් ස්ථාපිත කිරීම සහ 2020 දකුණු ආසියානු ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා සංකීර්ණයක් පිළියෙළ කිරීම.*(දැනටමත් රු. මිලියන 100 ක් වෙන්කර ඇත.)* | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,500 |
| 110. | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය නවීකරණය කොට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස කළමනාකරණය කිරීම. | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 111. | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය නඟා සිටුවීම.*(දැනටමත් රු. මිලියන 700 ක් වෙන්කර ඇත.)* | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,200 |
| 112. | මානව කාර්යසාධන පර්යේෂණාගාරයක් ඇති කිරීම. | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 75 |
| 113. | උත්තේජක මර්දනය සම්බන්ධයෙන් ජාතික දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ ඖෂධ පරීක්ෂා කිරීමේ පර්යේෂණාගාරයක් ස්ථාපිත කිරීම. | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 114. | වෙනස් හැකියාවන්ගෙන් යුක්ත කෘතහස්ත මළල ක්‍රීඩකයින්ගේ සහභාගිත්වය දිරිගැන්වීම. | ක්‍රීඩා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| | **සෞඛ්‍යය** | | | |
| 115. | විශේෂිත වකුගඩු ඒකක ස්ථාපිත කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 150 |
| 116. | අනුරාධපුරය, පොළොන්නරුව සහ යාපනය මූලික රෝහල් සඳහා කම්පන තරංග ආශ්‍රිතයෙන් වකුගඩු ගල් කුඩා කැබලි වලට කැඩීමේ යන්ත්‍ර (Extracorporeal Shock Wave Lithotripsy ESWL machine) ලබාදීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 300 |
| 117. | නිදන්ගත වකුගඩු රෝගය වැනි බෝ නොවන රෝගවලට එරෙහිව සෞඛ්‍ය අධ්‍යාපන කාර්යංශයේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| 118. | නිදන්ගත වකුගඩු රෝග, තැලසීමියාව, සහ එච්.අයි.වී. ඒඩ්ස් වැනි රෝග හඳුනාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |

| | | | | |
|---|---|---|---|---|
| 119. | කරාපිටිය - පිළිකා රෝග ඒකකය ශක්තිමත් කිරීම. (දැනටමත් ලබා දී ඇත). | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 150 |
| 120. | මඩකලපුව සහ රත්නපුර රෝහල්වල පිළිකා රෝගීන්ට ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රතිකාර සැපයීමේ ඒකක ස්ථාපිත කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 150 |
| 121. | රාජ්‍ය ඖෂධ සංස්ථා ශක්තිමත් කිරීම තුළින් ප්‍රාථමික සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 122. | කාසල් වීදියේ කාන්තා රෝහලේ ප්‍රජනන සෞඛ්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරිම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 75 |
| 123. | කොළඹ, නුවර සහ අනුරාධපුර ප්‍රදේශවල විශේෂිත ප්‍රසව විශේෂඥ මධ්‍යස්ථාන 3 ක් ස්ථාපිත කිරිම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 200 |
| 124. | පොළොන්නරුව රෝහලේ මාතෘ හා නව දරු උපත් සංකීර්ණයක් ඉදිකිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| 125. | රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද හා දැඩිසත්කාර ඒකකයක් සහ හෘද රෝග පිළිබඳ ශල්‍යාගාරයක් ඉදිකිරීම. (දැනටමත් ලබා දී ඇත). | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 400 |
| 126. | මොරටුව ප්‍රාදේශීය රෝහල පුළුල් කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 150 |
| 127. | දෙනියාය ප්‍රාදේශීය රෝහල පුළුල් කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 128. | බේරුවල මූලික රෝහල පුළුල් කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 200 |
| 129. | මාතර දිස්ත්‍රික් නව මහ රෝහලේ මාතෘ, ළමා, වෛද්‍ය සහ පරිපාලන ඒකක කඹුරුගමුව වෙත මාරු කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 150 |
| 130. | ආහාරවල පිරිසිදුකම හා ආහාර සුරක්ෂිතතාව ඇතිකිරීමේ පුළුල් ක්‍රමවේදයක් ඇතිකිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 131. | හෙද පුහුණු පාසැල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම. (දැනටමත් රු. මිලියන 200 ක් වෙන්කර ඇත.) | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 300 |
| 132. | මානසික සහ ස්නායු රෝග පිළිබඳ සෞඛ්‍ය අංශ ශක්තිමත් කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 133. | මහරගම දන්ත සෞඛ්‍ය ආයතනය සංවර්ධනය කිරීම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 134. | රත්නපුර දිස්ත්‍රික් රෝහලේ මුඛ සෞඛ්‍ය ඒකකය වැඩිදියුණු කිරීම. *(දැනටමත් වෙන්කර ඇත.)* | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 200 |
| 135. | ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග සහ එච්.අයි.වී. ඒඩ්ස් සඳහා වෙන් වු ඒකකයක් ස්ථාපිත කිරිම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 136. | "සුව සැරිය" මූලාරම්භයන් සවිමත් කිරීම.*(රු. මිලියන 683 ක් දැනටමත් වෙන්කර ඇත.)* | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 750 |
| 137. | ජාතික සෞඛ්‍ය හා අනුබද්ධිත පර්යේෂණ ශක්තිමත් කිරිම. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 75 |
| **නිවාස, නාගරික හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය** | | | | |
| 138. | 2020 වනවිට අඩු ආදායම්ලාභීන් සඳහා නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ නිවාස 20,000 ක් ලබාදීම. (රු. මිලියන 13,300 ක් දැනටමත් වෙන්කර ඇත.) | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 17,500 |
| 139. | උතුරු නැගෙනහිර පළාත්වල නිවාස ඉදිකිරීම. (රු. මිලියන | නිවාස හා ඉදිකිරීම් | ජාතික අයවැය | 3,000 |

| | | | | |
|---|---|---|---|---|
| | 3,000 ක් දැනටමත් වෙන්කර ඇත.) | අමාත්‍යාංශය | දෙපාර්තමේන්තුව | |
| 140. | වැව්ලි ක්ෂේත්‍රය ආශ්‍රිතව නිවාස ඉදිකිරීම. (දැනටමත් වෙන්කර ඇත.) | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 2,000 |
| 141. | නිවාස හිමියන්ගේ නිවාස යෝජනා ක්‍රමය සහ ග්‍රාමීය අංශයේ දැනට පවතින නිවාස වැඩිදියුණු කිරීම සඳහා සහාය දීම. (රු. මිලියන 6,188 ක් දැනටමත් වෙන්කර ඇත.) | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 7,000 |
| 142. | මැදි ආදායම් ලබන නිවාස ගැනුම්කරුවන් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් අඩු පොළී ණය යෝජනා ක්‍රමය. | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 500 |
| 143. | නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතිය (රු. මිලියන 20,017 ක් දැනටමත් වෙන්කර ඇත.) | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 24,000 |
| 144. | නගර සංවර්ධනය සහ මහනුවර, අනුරාධපුරය, ගාල්ල, යාපනය යන දිස්ත්‍රික්කයන්හි උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන (රු. මිලියන 10,347 ක් දැනටමත් වෙන්කර ඇත.) | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 12,000 |
| 145. | කල්මුණේ සහ සමන්තුරෙයි නගර සංවර්ධනය සඳහා වන ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීම සහ පසුගාමී කලාප වල නගර සංවර්ධනය කිරීම. | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 2,000 |
| 146. | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 10,000 |
| 147. | ග්‍රාමීය මාර්ග ජාලය වැඩිදියුණු කිරීම. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය(දැනටමත් රු. මිලියන 1,500 ක් වෙන්කර ඇත.) | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 2,500 |
| | | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | | 500 |
| 148. | ගංවතුර හා නායයෑම් හේතුවෙන් අපදාවට පත් වූ මාර්ග පුනරුත්ථාපනය කිරීම. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,000 |
| | **සැමට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම.** | | | |
| 149. | පොලිස් ප්‍රතිසංස්කරණ සහ ප්‍රජා පොලිස් සංකල්පය හඳුන්වා දීම. | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 150 |
| 150. | පොලිස් හා අපරාධ යුක්තිය සම්බන්ධයෙන්වන විශ්ව විද්‍යාලයක් පිහිටුවීම. | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 125 |
| 151. | අන්තර්ජාල අපරාධ විමර්ශන ඒකකය නවීකරණය කිරීම. | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 40 |
| 152. | පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම. (PICS) | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 400 |
| 153. | එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා ශ්‍රී ලාංකික සෙබළුන් පුහුණුව හා සංවර්ධනය. | ආරක්ෂක අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 750 |
| | **නීති ප්‍රතිසංස්කරණ** | | | |
| 154. | ශ්‍රව්‍ය හා දෘශ්‍ය පටිගත කිරීමේ ක්‍රමවේදයක් සහිත විශේෂිතඅධිකරණයක් ස්ථාපිත කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 155. | ස්වයංක්‍රීයව නඩු කළමනාකරණය කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ අදාල අධිකරණයේ මුල් පැමිණිලි විද්‍යුත් මාධ්‍යය මගින් ගොනු කිරීමේ හැකියාව ගවේෂණය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 50 |
| 156. | නායයාම් වලට ගොදුරුවීමේ අවදානම හේතුවෙන් රත්නපුර සහ වැලිමඩ උසාවි නැවත ස්ථානගත කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 500 |
| 157. | කිලිනොච්චිය, තෙල්දෙනිය, පූගොඩ සහ කන්තලේ උසාවි සංකීර්ණ පුළුල් කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 400 |
| 158. | බාල අපරාධකරුවන් සහ වින්දිතයින් ප්‍රවාහනය කිරීම සඳහා | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, | ජාතික අයවැය | 50 |

| | | | | |
|---|---|---|---|---|
| | වාහන මිලදී ගැනීම. | පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | දෙපාර්තමේන්තුව | |
| | **ප්‍රාග්ධන වෙළෙඳපොළ ශක්තිමත් කිරීම** | | | |
| 159. | ලංකා බැංකුව සඳහා ප්‍රාග්ධන පහසුකම් සැපයීම | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 5,000 |
| | **ජාතික උරුමය, සංස්කෘතිය හා සෞන්දර්යය** | | | |
| 160. | බෞද්ධ පුස්තකාලයක් ස්ථාපිත කිරීම | ජනාධිපති ලේකම් කාර්යාලය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 50 |
| 161. | පුරාවිද්‍යා වටිනාකමක් සහිත පුරාණ රජමහ විහාර සහ එවැනි පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම හා අලුත්වැඩියා කිරීම | බුද්ධ ශාසන අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 250 |
| 162. | වන්දනාකරුවන් සඳහා තානායම් ඉදිකිරීම | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 100 |
| 163. | රිටිගල සහ රජගලතැන්න පුරා විද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 164. | තුරඟ තරඟ පිටිය ගොඩනැගිල්ල කලා, ශිල්ප හා නවීන නිර්මාණ සඳහා වූ ජාතික මධ්‍යස්ථානයක් බවට පත් කිරීම | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 250 |
| 165. | මොරටුව ප්‍රදේශයේ කලා සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 600 |
| 166. | මන්නාරම, තාල්වුපාඩු ප්‍රදේශයේ සංස්කෘතික ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 167. | ජනාධිපති සුභසාධක අරමුදල හා ටවර් හෝල් පදනමේඅනුග්‍රහය ඇතිව කලාකරුවන්ට හදිසි අනතුරු සහ වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 10 |
| | **රාජ්‍ය අංශයේ සේවා සැපයීම** | | | |
| 168. | තාක්ෂණය හා ඩිජිටල්කරණය තුළින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආයතනයේ සේවා සැපයීම වැඩිදියුණු කිරීම (පුනරාවර්තන වියදම රු. මිලියන 500) | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 2,000 |
| 169. | ජාතික ආර්ථික සභාව පිහිටුවීම (පුනරාවර්තන වියදම රුපියල් මිලියන 270) | ජනාධිපති ලේකම් කාර්යාලය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 300 |
| 170. | ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය වියදම් ඒකක දක්වා ව්‍යාප්ත කිරීම | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 500 |
| 171. | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 150 |
| 172. | රජයේ කාර්යාලයක රාජ්‍ය සේවකයින් 500 කට වැඩි සංඛ්‍යාවක් හෝ කාර්යාල කිහිපයක රාජ්‍ය සේවකයින්ගේ එකතුව 500 ක් පමණ එකම සේවා ස්ථානයක පිහිටි කාර්යාලවල ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම (කුලියට හෝ ගාස්තු මත) | ළමා හා කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 50 |
| 173. | විශ්‍රාමිකයින් සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 50 |
| | **සංහිඳියාව** | | | |
| 174. | උතුර හා නැගෙනහිර ප්‍රදේශවල ගඩොලින් හා සිමෙන්තියෙන් බැඳි නිවාස 50,000 ක් ඉදිකිරීම (පොළී ගෙවීම්) | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 750 |

| | | | | |
|---|---|---|---|---|
| 175. | ග්‍රාමීය වාරිමාර්ග සංවර්ධන, වැසි ජලයරැස්කිරීම හා ඒකාබද්ධ ගම්මාන සංවර්ධන වැඩසටහන් සඳහා සහය වීම (ONUR) (රුපියල් මිලියන 1,500 ක් දැනටමත් වෙන්කර ඇත.) | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය-ONUR | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 2,000 |
| 176. | සංහිඳියාව ශක්තිමත් කරමින් ආර්ථිකය සවිබල ගැන්වීම හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීම සහ උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනස් හැකියාවන් සහිත කාන්තාවන්ගේ අවශ්‍යතා සපුරාලීමට විශේෂ වැඩසටහන් | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය–1,750<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය–1000 (දැනටමත් රු. මිලියන 750 ක් වෙන්කර ඇත.) | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 2,750 |
| 177. | ණය සමූපකාර සමිති හරහා උතුරු හා උතුරුමැද පළාත්වල ණයගැති ජනයාට සහය ලබාදීම | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 1,000 |
| 178. | නිෂ්පාදන සමූපකාර හරහා උතුරු පළාතේ තෝරාගත් කුඩා කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 1,000 |
| 179. | ප්‍රධාන වශයෙන් කිළිනොච්චිය හා ඩෙල්ෆ් දූපත්හිතල් ආහාර සැකසුම් මධ්‍යස්ථාන 2 ක් ස්ථාපිත කිරීම | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 40 |
| 180. | මයිලිට්ටි වරාය ධීවර වරායක් බවට සංවර්ධනය කර ශීතාගාර සහ ගබඩා පහසුකම් ස්ථාපිත කිරීම | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 150 |
| 181. | අච්චුවේලි කර්මාන්ත කලාපයේ පහසුකම් වැඩි දියුණු කිරීම සහ එහි ස්ථාපිත සමාගම්වල විදුලි පිරිවැයෙන් 50% ක් වසර 2 ක කාලයක් සඳහා රජය විසින් දැරීම | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 100 |
| 182. | දඹුල්ල හා කොළඹ ආර්ථික මධ්‍යස්ථාන හා සම්බන්ධිත නවීන ආර්ථික මධ්‍යස්ථානයක් යාපනයේ ඉදිකිරීම | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 100 |
| 183. | වසන්තම් රූපවාහිනී නාලිකාවේ සේවය වැඩි දියුණු කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ලබාදීම | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | *30* |
| 184. | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ ජාතික සහජීවනය ගොඩනැගීමේ අරමුණින් භාෂා ප්‍රවීනතාව, භාෂා පරිවර්තන කටයුතු වැඩිදියුණු කිරීම් ආදිය ක්‍රියාත්මක කිරීම | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 200 |
| 185. | "අම්මාච්චි" සංකල්පය ක්‍රියාත්මක වීම | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය– උතුරුපළාත් සභාව | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 186. | හිටපු රණවිරුවන්ට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පිළිගැනීම ලබාදීම | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 25 |
| 187. | හිටපු රණවිරුවන් සහ යුධ වැන්දඹුවන් බඳවාගන්නා පෞද්ගලික ආයතන සඳහා මසකට රුපියල් 10,000 ක් හෝ 50% ක වැටුප් සහනාධාරලබාදීම | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 250 |
| 188. | මුස්ලිම් අවතැන් වූවන් නැවත පදිංචි කිරීම - නිවාස සහ යටිතල පහසුකම් සැපයීම (රුපියල් මිලියන 750 ක් දැනටමත් වෙන්කර ඇත.) | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 2,500 |
| 189. | නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට සාප්පු සංකීර්ණ සහ බස්නැවතුම්පළ ඇතුළුව මන්නාරම නගරය පුනරුත්ථාපනය කිරීම සහ සිලාවතුර නගර සංවර්ධන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | *250* |
| 190. | සංහිඳියාව ඇතිකිරීමේ යාන්ත්‍රණය සම්බන්ධීකරණය සඳහා ලේකම් කාර්යාලක් පිහිටුවීම (SCRM) (පුනරාවර්තන වියදම රුපියල් මිලියන 177 ) | අග්‍රාමාත්‍ය කාර්යාලය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 180 |
| 191. | අතුරුදහන්වූ පුද්ගලයින් සඳහා කාර්යාලයක් පිහිටුවීම සඳහා සහයවීම (පුනරාවර්තන වියදම රුපියල් මිලියන 650) | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 1,400 |
| 192. | ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව | 500 |
| 193. | සුරාබදු ආදායම් කළමනාකරණ පද්ධතිය (EDSL) ක්‍රියාත්මක කිරීම. | සුරාබදු දෙපාර්තමේන්තුව | තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව | 50 |

ඇමුණුම III

**දළ ණය ගැනීමේ අවශ්‍යතා - 2018**

**(ගිණුම්කරණ කටයුතු සඳහා ප්‍රතිපාදන)**

| **අයිතමය** | **රු.බිලියන** |
|---|---|
| මුළු ආදායම් ලැබීම් හා ප්‍රදාන | 2,260 |
| ණය ආපසු ගෙවීම් ද ඇතුළත්ව මුළු ගෙවීම් | 4,079 |
| අත්තිකාරම් ගිනුම් කටයුතු සඳහා ප්‍රතිපාදන | 6 |
| ලැබීම් හා ගෙවීම් වෙනසේ අවදානම සඳහා වෙන් කිරීම | 40 |
| දේශීය ණය සුරැකුම් පත්වල පොත් අගය සඳහා ගැලපුම් | 30 |
| රාජ්‍ය ගිණුම් සඳහා මුළු ණය ගැනීමේ අවශ්‍යතාව | 1,895 |
| එයින් සමස්ත ණය ආපසු ගෙවීම් | 1,150 |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.*

## [1]අයවැය සාරාංශය -(2014-2018)

රු. බිලියන

| අයිතමය | 2014 | 2015 | 2016 | 2017 සංශෝධි | 2018 අයවැය |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම් සහ ප්‍රදාන** | **1,264** | **1,534** | **1,774** | **1,997** | **2,326** |
| **මුළු ආදායම** | **1,255** | **1,528** | **1,766** | **1,989** | **2,316** |
| **බදු ආදායම** | **1,050** | **1,356** | **1,464** | **1,749** | **2,034** |
| ආදායම් බදු | 198 | 263 | 259 | 308 | 375 |
| භාණ්ඩ හා සේවා මත බදු | 616 | 804 | 842 | 1,054 | 1,239 |
| විදේශ වෙළඳාම මත බදු | 236 | 289 | 363 | 387 | 420 |
| **බදු නොවන ආදායම** | **145** | **99** | **222** | **152** | **184** |
| **පළාත් සභා බදු ආදායම (රජයේ ආදායම් පැවරුම් ද ඇතුළත්ය)** | **59** | **73** | **80** | **88** | **98** |
| **ප්‍රදාන** | **9** | **6** | **7** | **8** | **10** |
| **මුළු වියදම** | **1,855** | **2,363** | **2,414** | **2,677** | **3,001** |
| **වර්තන වියදම** | **1,382** | **1,775** | **1,838** | **2,053** | **2,250** |
| වැටුප් හා වේතන (පළාත් සභා ද ඇතුළත්ව) | 487 | 618 | 633 | 663 | 705 |
| වෙනත් භාණ්ඩ හා සේවා (පළාත් සභා ද ඇතුළත්ව) | 142 | 201 | 170 | 198 | 218 |
| පොළී ගෙවීම් | 436 | 527 | 611 | 725 | 820 |
| සහනාධාර හා පැවරුම් | 318 | 428 | 425 | 467 | 507 |
| **රාජ්‍ය ආයෝජන** | **487** | **603** | **594** | **633** | **761** |
| අනෙකුත් | (14) | (14) | (18) | (9) | (10) |
| **ආදායම් අතිරික්තය (+)/හිඟය (-)** | **(128)** | **(247)** | **(72)** | **(64)** | **66** |
| **ප්‍රාථමික අතිරික්තය (+)/හිඟය (-)** | **(155)** | **(302)** | **(29)** | **45** | **145** |
| **අයවැය අතිරික්තය (+)/හිඟය (-)** | **(591)** | **(830)** | **(640)** | **(680)** | **(675)** |
| **මුළු මූල්‍යනය** | **591** | **830** | **640** | **680** | **675** |
| **මුළු විදේශ මූල්‍යනය** | **316** | **369** | **429** | **330** | **300** |
| දළ විදේශ ණය ගැනීම් | 423 | 556 | 574 | 550 | 580 |
| ව්‍යාපෘති සහ වැඩසටහන් ණය | 173 | 173 | 208 | 230 | 240 |
| විදේශ වාණිජ ණය | 250 | 383 | 366 | 320 | 340 |
| ණය ආපසු ගෙවීම් | (107) | (187) | (145) | (220) | (280) |
| **මුළු දේශීය මූල්‍යනය** | **276** | **460** | **211** | **350** | **375** |
| බැංකු නොවන මූල්‍යනය | 193 | 197 | 399 | 110 | 195 |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මත විදේශ ආයෝජනය | 21 | 223 | (121) | 70 | 60 |
| බැංකු ණය ගැනීම් | 62 | 41 | (67) | 170 | 120 |
| **මුළු ආදායම් සහ ප්‍රදාන/ද.දේ.නි. (%)** | **12.2** | **14.0** | **15.0** | **15.4** | **16.4** |
| **මුළු ආදායම/ද.දේ.නි. (%)** | **12.1** | **14.0** | **14.9** | **15.3** | **16.3** |
| බදු ආදායම/ද.දේ.නි. (%) | 10.1 | 12.4 | 12.4 | 13.5 | 14.3 |
| බදු නොවන ආදායම/ද.දේ.නි. (%) | 1.4 | 0.9 | 1.9 | 1.2 | 1.3 |
| පළාත් සභා බදු ආදායම (රජයේ ආදායම් පැවරුම් ද ඇතුළත්ව)ද.දේ.නි. (%) | 0.6 | 0.7 | 0.7 | 0.7 | 0.7 |
| **ප්‍රදාන /ද.දේ.නි. (%)** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** |
| **මුළු වියදම /ද.දේ.නි. (%)** | **17.9** | **21.6** | **20.4** | **20.6** | **21.1** |
| වර්තන වියදම්/ද.දේ.නි. (%) | 13.3 | 16.2 | 15.5 | 15.8 | 15.8 |
| පොළී නොවන/ද.දේ.නි. (%) | 9.1 | 11.4 | 10.4 | 10.2 | 10.1 |
| පොළී/ද.දේ.නි. (%) | 4.2 | 4.8 | 5.2 | 5.6 | 5.8 |
| රාජ්‍ය ආයොජන /ද.දේ.නි. (%) | 4.7 | 5.5 | 5.0 | 4.9 | 5.4 |
| ආදායම් අතිරික්තය (+)/හිඟය (-)/ද.දේ.නි.(%) | (1.2) | (2.3) | (0.6) | (0.5) | 0.5 |
| ප්‍රාථමික අතිරික්තය (+)/හිඟය (-)/ද.දේ.නි.(%) | (1.5) | (2.8) | (0.2) | 0.3 | 1.0 |
| **අයවැය අතිරික්තය (+)/හිඟය (-)/ද.දේ.නි.(%)** | **(5.7)** | **(7.6)** | **(5.4)** | **(5.2)** | **(4.8)** |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකසන ලදී.*

*ආසන්නතම අගයට වැටයීම හේතුවෙන් අවසාන අගයන්ගේ සුළු වෙනස්කම් සිදුවිය හැකි බව කාරුණිකව සළකන්න.*

*[1] පළාත් සභාවලට පැවරූ ආදායම් සහ වියදම් ද ඇතුළත්ව*

ඇමුණුම V

## [1]කාර්තුමය අයවැය ඇස්තමේන්තුව - 2018

රු.බිලියන

| අයිතමය | කා.1 | කා.2 | කා.3 | කා.4 | එකතුව |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම් සහ ප්‍රදාන** | **515** | **527** | **608** | **676** | **2,326** |
| **මුළු ආදායම** | **514** | **525** | **605** | **672** | **2,316** |
| **බදු ආදායම** | **457** | **465** | **531** | **581** | **2,034** |
| ආදායම් බදු | 78 | 79 | 110 | 108 | 375 |
| භාණ්ඩ හා සේවා මත බදු | 277 | 290 | 316 | 356 | 1,239 |
| විදේශ වෙළඳාම මත බදු | 102 | 96 | 105 | 117 | 420 |
| **බදු නොවන ආදායම** | **37** | **38** | **48** | **61** | **184** |
| **පළාත් සභා බදු ආදායම (රජයේ ආදායම් පැවරුම් ද ඇතුළත්ය)** | **20** | **22** | **26** | **30** | **98** |
| **ප්‍රදාන** | **1** | **2** | **3** | **4** | **10** |
| **මුළු වියදම** | **710** | **678** | **805** | **808** | **3,001** |
| **වර්තන වියදම** | **543** | **521** | **608** | **578** | **2,250** |
| වැටුප් හා වේතන (පළාත් සභා ද ඇතුළත්ව) | 169 | 172 | 180 | 184 | 705 |
| වෙනත් භාණ්ඩ හා සේවා (පළාත් සභා ද ඇතුළත්ව) | 40 | 43 | 60 | 75 | 218 |
| පොළී ගෙවීම් | 210 | 181 | 242 | 187 | 820 |
| සහනාධාර හා පැවරුම් | 124 | 125 | 126 | 132 | 507 |
| **රාජ්‍ය ආයෝජන** | **167** | **159** | **201** | **234** | **761** |
| අනෙකුත් | - | (2) | (4) | (4) | (10) |
| **ආදායම් අතිරික්තය (+)/හිඟය (-)** | **(29)** | **4** | **(3)** | **94** | **66** |
| **ප්‍රාථමික අතිරික්තය (+)/හිඟය (-)** | **15** | **30** | **45** | **55** | **145** |
| **අයවැය අතිරික්තය (+)/හිඟය (-)** | **(195)** | **(151)** | **(197)** | **(132)** | **(675)** |
| **මුළු මූල්‍යනය** | **195** | **151** | **197** | **132** | **675** |
| **මුළු විදේශ මූල්‍යනය (ශුද්ධ)** | **5** | **4** | **160** | **131** | **300** |
| දළ ණය ගැනීම් | 60 | 80 | 250 | 190 | 580 |
| ණය ආපසු ගෙවීම් | (55) | (76) | (90) | (59) | (280) |
| **මුළු දේශීය මූල්‍යනය (ශුද්ධ)** | **190** | **147** | **37** | **1** | **375** |
| බැංකු නොවන මූල්‍යනය | 70 | 80 | 54 | (9) | 195 |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජනය | 40 | 7 | 10 | 3 | 60 |
| බැංකු ණය ගැනීම් | 80 | 60 | (27) | 7 | 120 |
| **මුළු ආදායම් සහ ප්‍රදාන/ද.දේ.නි. (%)** | **3.6** | **3.7** | **4.3** | **4.8** | **16.4** |
| **මුළු ආදායම/ද.දේ.නි. (%)** | **3.6** | **3.7** | **4.3** | **4.7** | **16.3** |
| බදු ආදායම/ද.දේ.නි. (%) | 3.2 | 3.3 | 3.7 | 4.1 | 14.3 |
| බදු නොවන ආදායම/ද.දේ.නි. (%) | 0.3 | 0.3 | 0.3 | 0.4 | 1.3 |
| පළාත් සභා බදු ආදායම (රජයේ ආදායම් පැවරුම් ද ඇතුළත්ව)ද.දේ.නි.(%) | 0.1 | 0.2 | 0.2 | 0.2 | 0.7 |
| **ප්‍රදාන /ද.දේ.නි. (%)** | **0.0** | **0.0** | **0.0** | **0.0** | **0.1** |
| **මුළු වියදම /ද.දේ.නි. (%)** | **5.0** | **4.8** | **5.7** | **5.7** | **21.1** |
| වර්තන වියදම්/ද.දේ.නි. (%) | 3.8 | 3.7 | 4.3 | 4.1 | 15.8 |
| පොළී නොවන/ද.දේ.නි. (%) | 2.3 | 2.4 | 2.6 | 2.8 | 10.1 |
| පොළී/ද.දේ.නි. (%) | 1.5 | 1.3 | 1.7 | 1.3 | 5.8 |
| රාජ්‍ය ආයොජන /ද.දේ.නි. (%) | 1.2 | 1.1 | 1.4 | 1.6 | 5.4 |
| ආදායම් අතිරික්තය (+)/හිඟය (-)/ද.දේ.නි.(%) | (0.2) | 0.0 | (0.0) | 0.7 | 0.5 |
| ප්‍රාථමික අතිරික්තය (+)/හිඟය (-)/ද.දේ.නි.(%) | 0.1 | 0.2 | 0.3 | 0.4 | 1.0 |
| **අයවැය අතිරික්තය (+)/හිඟය (-)/ද.දේ.නි.(%)** | **(1.4)** | **(1.1)** | **(1.4)** | **(0.9)** | **(4.8)** |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකසන ලදී.*

*ආසන්නතම අගයට වැටයීම හේතුවෙන් අවසාන අගයන්ගේ සුළු වෙනස්කම් සිදුවිය හැකි බව කාරුණිකව සළකන්න.*

*[1] පළාත් සභාවලට පැවරූ ආදායම් සහ වියදම් ද ඇතුළත්ව*

**<u>බදු වියදම් ප්‍රකාශය</u>**

රාජ්‍ය බදු වියදම යනු විශේෂ බදු බැර ලබාදීම්, වාසි සහගත බදු අනුපාත ලබාදීම් හෝ බදු බැදියාව අත්හිටුවීම සඳහා බදු පදනම ඉවත් කිරීම, නිදහස් කිරීම හෝ අඩු කිරීම ලෙසින් පුළුල් ලෙස අර්ථ දැක්විය හැකිය.

මෙම ප්‍රකාශය මගින් ඉහත පරිදි ලබා දී ඇති නිදහස් කිරීම් සහ ඉවත්කිරීම් පිළිබඳව සංක්ෂිප්ත අදහසක් සපයනු ලබයි. යහපාලනය, වගවීම සහ විනිවිදභාවය යන මූලධර්ම පදනම් කරගනිමින් මෙවැනි ප්‍රකාශයක් ශ්‍රී ලංකාවේ අයවැය වාර්තාවට ඇතුලත් කර ඇත. එසේම මෙවැනි ප්‍රකාශයක් අයවැය වාර්තාවන්හි ඇතුලත් කිරීම ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයක් වන අතර ඒ අනුව යමින් ජාත්‍යන්තරව අරමුදල් සපයන ආයතන වෙත සහතිකයක් ලබාදෙයි.

**උපකල්පන**

මෙම බදු වියදම් වාර්තාව පහත සඳහන් උපකල්පන මත සකසා ඇත.

අ). ආදායම් බදු වාර්තා අනුකූලතාවය 100% ලෙස සලකා මෙම ගණනය කිරීම් සිදුකර ඇත.

ආ). තක්සේරු කිරීමේ ගැටලු, කාර්ය පටිපාටිගත දෝෂ, පැවරුම් මිල සහ බදු අනුකූලතාව හේතුවෙන් බදු පදනම දුර්වලවීම මත වන ආදායම අඩුවීම නොසලකා ඇත.

ඇ). බදු අනුපාත වෙනස්වීම්, බදු නිදහස් කිරීම්, ඉවත්කිරීම් සහ 2018 වර්ෂයේ අයවැයෙහි දී සලකා බලන ලද අනෙකුත් අභිමතානුසාරී යෝජනා සඳහා ගැලපීම් සිදුකර ඇත.

ඈ). විදේශ වෙළෙඳාම සම්බන්ධ බදු වියදම විවිධ වෙළෙඳ ගිවිසුම් සමග සම්බන්ධ වන බැවින් වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධනය සඳහා වන බදු, සෙස් බදු, ආනයන බදු යනාදිය බදු වියදම ගණනය කිරීමේ දී සලකනු නොලබයි.

ඉ). පළාත් සභා වලට පවරා ඇති පිරිවැටුම් බදු වෙනුවෙන් හඳුන්වා දුන් ජාතිය ගොඩ නැගීමේ බද්ද පළාත් සභා සමග හුවමාරු කර ගන්නා බැවින් එය බදු වියදම ගණනය කිරීම සඳහා යොදා නොගන්නා ලදී.

ඊ). ආර්ථික සේවා ගාස්තුව ආදායම් බදු සඳහා හිලවු කෙරෙන බැවින් ආර්ථික සේවා ගාස්තුව බදු වියදම ගණනය කිරීමේදී නොසලකා හැර ඇත.

උ). රජය මගින් නොමිලයේ සපයන සේවා සඳහා වන බදු වියදම ගණනයන් සඳහා ඇතුලත් කර නොමැත.

ඌ). 2016 වර්ෂයේ බදු වාර්තාවන්හි ඇතුලත් දත්ත, 2017 අපේක්ෂිත දත්ත සහ වර්ෂයේ 2018 වසර සඳහා ආර්ථික පුරෝකථනයන් මෙම ගණනය කිරීම් සඳහා පදනම් ව ඇත.

එ). නව දේශීය ආදායම් බදු පනතෙහි අන්තර්ගත පහත සඳහන් උපලේඛනවල ඇතුලත් බදු අනුපාත, බදු සහන, බදු නිදහස් කිරීම්, සුදුසුකම් ලබන නිදහස් කිරීම් සහ ක්ෂය දීමනා බදු වියදම් ලෙස නොසලකන ලදී. එම උපලේඛන වලින් බැහැරවීම් බදු වියදම් ලෙස සලකා ඇත.

i. පළමු උප ලේඛනය - බදු අනුපාත
ii. දෙවන උප ලේඛනය - ආයෝජන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය
iii. තුන්වන උප ලේඛනය - නිදහස් කිරීම්
iv. හතරවන උප ලේඛනය - සුදුසුකම් ලබන නිදහස්කිරීම්
v. පස්වන උප ලේඛනය - ක්ෂයදීමනා

ඉහත උපලේඛන වලින් බැහැරවීම් නව දේශීය ආදායම් බදු පනතෙහි හයවන උපලේඛනයේ දක්වා ඇති අතර එවැනි බැහැරවීම් ආදායම් බදු සඳහා බදු වියදම ලෙස සලකා ඇත.

**බදු වියදම්**

ඇ). **ආදායම් බදු**

නව දේශීය ආදායම් පනතේ හයවන උප ලේඛනය මගින් පහත සඳහන් බදු සහන සීමිත කාලයක් සඳහා ලබා දී ඇත. මෙම සහන ආදායම් බදු සඳහා බදු වියදම ලෙස සලකා ඇත.

i. 2018.04.01 දින සිට වසර 4 ක් තුළ තක්සේරු වර්ෂයකදී සිදුකරන ඇමරිකානු ඩොලර් මිලියන 3 දක්වා වන ක්ෂය වන වත්කම් මත වන (අස්පෘෂ්‍ය වත්කම් හැර) නව ආයෝජනයන් වැඩිදියුණු කළ ක්ෂය දීමනා සඳහා සුදුසුකම් ලබයි.
එම ආයෝජන සඳහා වන ආදායම් බදු සහනය උතුරු පළාත සඳහා 200% වන අතර අනෙකුත් පළාත් සඳහා එය 100% කි.

ii. ලාභයට දායක වන ජීවිත රක්ෂණ ඔප්පුහිමියන්ට බෙදා හැරෙන අතිරික්ත අරමුදල් සඳහා වසර තුනක කාලයකට 50% ක බදු සහනයක් හිමිවේ.

iii. තොරතුරු තාක්ෂණ ව්‍යාපාර සඳහා සේවකයින්ට (අධ්‍යක්ෂවරු හැර) කරනු ලබන ගෙවීම්වලින් 135% ක් වසර තුනක කාලයක් සඳහා බදු අයවන ආදායමට එරෙහිව අඩුකිරීමට ඉඩදේ.

iv. පර්යේෂණ සහ සංවර්ධන වියදම් සඳහා 200%ක අඩුකිරීමක් වසර තුනක් දක්වා හිමිවේ.

v. ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කෙරෙන ජාත්‍යන්තර ජාලයේ ආයතනයක මූලස්ථානයක් සඳහා වසර තුනක් දක්වා බදු නිදහසක් හිමි වේ.

vi. පුනර්ජනනීය බලශක්ති අංශය වසර හතරක් 50% ක බදු සහනයක් හිමි වේ.

iv. හයවන උපලේඛනය යටතේ වන ආදායම් බදු පිළිබඳ බදු වියදම පහත වගුවේ දක්වා ඇත.

වගුව I

රු. මිලියන

| | පිරිවැටුම | බදුවන ආදායම | බදු වියදම |
|---|---|---|---|
| • ජීවිත රක්ෂණ | 120,000 | 8,000 | 1,120 |
| • තොරතුරු තාක්ෂණ ව්‍යාපාර | 18,000 | 2,000 | 2,000 |
| • පුනර්ජනනීය බලශක්තිය | 40,000 | 2,000 | 280 |
| • පර්යේෂණ සහ සංවර්ධන | - | - | - |
| • ඇමරිකානු ඩොලර් මිලියන 3 අඩු නව ආයෝජන | - | - | - |
| • ජාත්‍යන්තර ජාලයේ ආයතනයක මූලස්ථානයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය | - | - | - |
| එකතුව | 178,000 | 12,000 | 3,400 |
| ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස බදු වියදම | | | 0.02% |

ආ). **එකතු කළ අගය මත බදු**

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ එකතු කළ අගය මත බදු පනවනු ලබයි. එකතු කළ අගය මත බදු වලින් නිදහස් , විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත් අයිතම සහ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දට යටත් අයිතම බදු වියදම ගණනය කිරීම සඳහා අදාළ කර නොගන්නා ලද අතර, එයට හේතු වන්නේ මෙම බදු එකතු කළ අගය මත බදු වෙනුවට පනවා ඇති හෙයිනි. බැංකු සහ මූල්‍ය සේවා අංශයන් මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අයකරන බැවින්, බදු වියදම ගණනය කිරීමේදී එය යොදා නොගනී.

එකතු කළ අගය මත බදු වියදම පිළිබඳ විස්තර වගුව 2 හි දැක්වේ.

වගුව 2

රු.මිලියන

| අයිතමය | බදු කළ හැකි අගය පදනම් වර්ෂය 2016 | බදු වියදම | |
|---|---|---|---|
| | | 2017 | 2018 |
| **දේශීය** | **450,000** | **74,048** | **75,815** |
| විදුලිය | 200,000 | 32,910 | 36,102 |
| කෘෂිකර්මය | 80,000 | 13,164 | 14,441 |
| ප්‍රවාහනය | 60,000 | 9,873 | 10,831 |
| නිදහස් සෞඛ්‍ය සේවා | 40,000 | 6,582 | 7,220 |
| අධ්‍යාපනය | 20,000 | 3,291 | 3,610 |
| ආහාර හා වෙනත් | 20,000 | 3,291 | 3,610 |
| සහාධිපත්‍ය නිවාස ඒකක විකිණීම | 30,000 | 4,937 | - |
| **ආනයන** | **575,000** | **94,616** | **84,660** |
| බොර තෙල් | 75,000 | 12,341 | 13,538 |
| නූල්/ රෙදි | 65,000 | 10,696 | - |
| වටිනා ලෝහ | 60,000 | 9,873 | 10,831 |
| ගෑස්/ භූමි තෙල්/ තාර/ දැවි තෙල් | 70,000 | 11,519 | 12,636 |
| කෘෂිකර්ම/ කිරි/ වෛද්‍ය/ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ | 60,000 | 9,873 | 10,831 |
| ඖෂධ | 60,000 | 9,873 | 10,831 |
| පරිගණක/ මුද්‍රිත පොත් | 40,000 | 6,582 | 7,220 |
| පොහොර | 20,000 | 3,291 | 3,610 |
| ට්‍රැක්ටර්/ මගී බස් | 16,000 | 2,633 | 2,888 |
| තිරිඟු/ තිරිඟු පිටි | 35,000 | 5,759 | 6,318 |
| විදුලිභාණ්ඩ | 25,000 | 4,114 | - |
| දැව සහ දැව භාණ්ඩ | 9,000 | 1,481 | - |
| කෘෂිකර්ම/ ජල ජීවී බීජ | 2,500 | 411 | 451 |
| ඩයි වර්ග | 2,000 | 329 | - |
| කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍ර | 2,000 | 329 | 361 |
| ළදරු කිරිපිටි | 1,500 | 247 | 271 |
| LED- පහන් | 1,500 | 247 | - |
| ක්‍රීඩා භාණ්ඩ | 1,500 | 247 | - |
| කාර්මික රාක්ක | 1,000 | 165 | - |
| ගුවන්යානා සහ අමතර කොටස් | 1,000 | 165 | - |
| වෙනත් | 27,000 | 4,443 | 4,874 |
| **එකතුව** | **1,025,000** | **168,664** | **160,475** |
| ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස බදු වියදම | | 1.3% | 1.1% |

**රාජ්‍ය ව්‍යවසායයන්හි ඇස්තමේන්තුගත වාණිජමය නොවන බැඳීම්**

පාරිභෝගිකයා වෙත භාණ්ඩ හෝ සේවාවන් ඒවායේ පිරිවැයට වඩා අඩුවෙන් සැපයීම වාණිජමය නොවන බැඳීම් වශයෙන් හැඳින්විය හැකිය. රජය විසින් පාලනය කරන ලද මිල ගණන් මත පදනම්ව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඇතැම් නිෂ්පාදන හා සේවාවන් සහනදායි මිල ගණන් යටතේ විකිණීම සිදු කරයි. යහපාලන ප්‍රතිපත්ති, විනිවිදභාවය හා ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්වලට අනුකූල වෙමින් මෙවැනි ආයතනයන්හි වාණිජමය නොවන බැඳීම් හඳුනා ගැනිම සඳහා සහ එවැනි බැඳීම් රජයේ වියදමක් වන බැවින් ඒවා ජාතික අයවැයේ අනුකූලක අංගයක් ලෙස ඉදිරිපත් කිරීමට ද රජය විසින් පියවර ගෙන ඇත.

ඒ අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ 2017 සහ 2018 වර්ෂයන් සඳහා වන වාණිජමය නොවන බැඳීම් වගුව i හා iii හි පිළිවෙලින් හඳුනාගෙන ඇත. උපකල්පනයන් මත පදනම්ව හා 2017 වසරේ පළමු මාස 09 හි තත්‍ය තොරතුරුවලට අනුව 2017 වසර සඳහා ගණනය කරන ලද ලාභ පුරෝකථනය හා 2018 වසර සඳහා වන ඇස්තමේන්තුවලට අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් තුළින් ලාභදායී තත්ත්වයන් අපේක්ෂා කරන බැවින් ඒ හා සම්බන්ධ වාණිජමය නොවන බැඳීම් හඳුනාගෙන නැත.

කෙසේ වෙතත්, එම පදනම මත ලංකා විදුලිබල මණ්ඩලය 2017 වර්ෂය තුළ රු. මිලියන 35,141 ක සහ 2018 වර්ෂය තුළ රු. මිලියන 16,507 ක අලාභයක් උත්පාදනය කරනු ලබයි.

වාණිජමය නොවන බැඳීම් ගණනය කිරීමේදී යොදා ගන්නා උපකල්පනයන් පහත පරිදි වේ.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථනයන්වලට අනුව ජාත්‍යන්තර වෙළෙඳපොළ බොරතෙල් මිල ගණන් 2017 වර්ෂයේ ඉදිරි කාල පරිච්ඡේදය සඳහා සහ 2018 වර්ෂය සඳහා බැරලයකට ඇ.ඩො 48.6 මට්ටමේ නොවෙනස්ව පැවතීම.
- ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මිල ගණන් අවබෝධතා ගිවිසුම් ප්‍රකාශනය මත පදනම් වීම.
- දේශීය වෙළෙඳපොළේ ඉල්ලුම් රටාව අතීත ස්වභාවයෙන් විශාල ලෙස වෙනස් නොවීම.

**අ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව**

වගුව I

**ආදායම් ප්‍රකාශය**

රු.මිලියන

| විස්තරය | 2017 | 2018 ඇස්තමේන්තුගත |
|---|---|---|
| විකුණුම් පිරිවැටුම[1] | 527,865 | 534,051 |
| පිරිවැටුම් බදු | (72,605) | (74,977) |
| **ශුද්ධ පිරිවැටුම** | **455,260** | **459,073** |
| විකුණුම් පිරිවැය | (412,229) | (423,304) |
| **දළ ලාභය** | **43,031** | **35,770** |
| අනෙකුත් ආදායම් | 202 | 225 |
| විතුණුම් හා බෙදාහැරීම් වියදම | (15,555) | (17,030) |
| පරිපාලන වියදම් | (4,782) | (5,880) |
| **මෙහෙයුම් ලාභය** | **22,896** | **13,085** |
| විනිමය අනුපාත විචලනය | (7,185) | (4,000) |
| මූල්‍ය ආදායම | 9,823 | 5,318 |
| මූල්‍ය වියදම | (11,130) | (11,606) |
| **බදු පෙර ශුද්ධ ලාභය** | **14,404** | **2,796** |

වගුව II

[1] නිෂ්පාදනවල ලාභදායීත්වයේ ප්‍රමුඛතා

| නිෂ්පාදන | ලීටරයකට රුපියල් | | | වාර්ෂික ලාභය/(අලාභය) |
|---|---|---|---|---|
| | විකුණුම් මිල | මුළු පිරිවැය | ලාභය/(අලාභය) | රු.මිලියන |
| සුපිරි පෙට්‍රල් (ඔක්ටේන් 92) | 117.00 | 124.56 | (7.56) | (10,409) |
| ද්‍රවීකෘත පෙට්‍රල් (ඔක්ටේන් 95) | 128.00 | 132.06 | (4.06) | (961) |
| ඔටෝ ඩීසල් | 95.00 | 98.61 | (3.61) | (6,823) |
| දැවි තෙල් | 80.00 | 55.38 | 24.62 | 12,695 |
| අවම සල්ෆර් | 80.00 | 60.40 | 19.60 | 6,395 |
| ජෙට් ඒ 1 | 73.96 | 68.13 | 5.83 | 3,590 |
| භූමිතෙල් - කාර්මික | 88.00 | 63.30 | 24.70 | 173 |
| භූමිතෙල් - ගෘහස්ත | 44.00 | 70.38 | (26.38) | (5,171) |

**(ආ) ලංකා විදුලිබල මණ්ඩලය** වගුව III

**ආදායම් ප්‍රකාශය**

රු.මිලියන

| විස්තරය | අයවැයගත | |
|---|---|---|
| | **2017** | **2018** |
| **ආදායම** | **216,640** | **243,074** |
| *විකුණන ලද ඒකක ප්‍රමාණය (ඒකක මිලියන)* | *13,540* | *13,811* |
| *ඒකකයකට ආදායම රුපියල්* | *16* | *18* |
| විදුලිය මිලදී ගැනීමේ පිරිවැය | 172,394 | 166,648 |
| වෙනත් සෘජු පිරිවැය | 83,664 | 92,473 |
| **මෙහෙයුම් ලාභය** | **(39,418)** | **(16,047)** |
| වෙනත් ආදායම් | 9,098 | 9,966 |
| **පොළී පෙර ශුද්ධ ලාභය** | **(30,320)** | **(6,081)** |
| මූල්‍ය පිරිවැය | 4,822 | 10,426 |
| **බදු පෙර ශුද්ධ ලාභය** | **(35,141)** | **(16,507)** |

ඇමුණුම VIII

## තාක්ෂණික සටහන්

**අයවැය යෝජනා - 2018**

**I කොටස - බදුකරණය**

**1.** **සුරා බදු ආඥා පනත යටතේ වන සුරා බදු,**

**1.1** **මත්පැන්**

පහත සඳහන් පරිදි මත්පැන් වර්ගය අනුව මධ්‍යසාර පරිමාව පදනම් කරගෙන සුරාබදු හඳුන්වා දීම සිදුකෙරේ:

| | | | |
|---|---|---|---|
| i. | සැර මත්පැන් | - | මධ්‍යසාර ලීටරයට රු. 3,300/- |
| ii. | බියර් | - | මධ්‍යසාර ලීටරයට රු. 2,400/- |
| iii. | වයින් | - | මධ්‍යසාර ලීටරයට රු. 2,400/- |

**1.2** **පානීය නොවන මධ්‍යසාර**

පානීය නොවන මධ්‍යසාර ආනයනය මත කිලෝ ග්‍රෑමයට රු. 15/- ක සුරාබද්දක් පැනවේ.

**1.3** **එතනෝල් නිෂ්පාදනය සඳහා යොදාගැනෙන අමුද්‍රව්‍ය**

පහත සඳහන් පරිදි එතනෝල් නිෂ්පාදනය සඳහා යොදාගැනෙන අමුද්‍රව්‍ය මත සුරාබදු පැනවේ:

| **අමුද්‍රව්‍ය වර්ගය** | **යෝජිත බද්ද රු.** |
|---|---|
| රා | ලීටරයට රු. 5/- |
| මොලෑෂස්/ඉරිඟු/සහල්/පලතුරු | කිලෝ ග්‍රෑමයට රු. 10/- |

**1.4** **මත්පැන් බලපත්‍ර**

**1.4.1** මත්පැන් බලපත්‍ර වලට අදාළගාස්තු ව්‍යුහය 2018.01.01 දින සිට සරල කෙරේ.

**1.4.2** සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා නව මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කෙරේ.

**1.5** සුරාබද්ද සඳහා සිදුකරන වෙනස්කම් ගැසට් මගින් ප්‍රසිද්ධ කෙරේ.

**2** **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද**

**2.1** **කැන් බීර**

කැන් බීර මත අදාළ වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද ඉවත් කෙරේ.

**2.2** **පැණිරස කාරක පාන වර්ග මත සීනි බද්ද**

2.2.1 එකතුකළ සීනි සහිත පාන වර්ග සඳහා ඒවායේ අඩංගු සීනි ප්‍රමාණය මත පදනම්ව නිෂ්පාදන බදු හඳුන්වා දෙනු ලැබේ.

2.2.2 සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 22.02 යටතේ වන පාන වර්ග සඳහා මෙම බද්ද අදාළ වේ.

2.2.3 බදු අනුපාතය සීනි ග්‍රෑමයකට ශත 50 කි.

**2.3** **ප්ලාස්ටික් රෙසින**

2.3.1 ප්ලාස්ටික් රෙසින මත කිලෝ ග්‍රෑමයට රු.10 ක නිෂ්පාදන බද්දක් හඳුන්වා දෙනු ලැබේ.

2.3.2 සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 3901.10, 3901.20, 3902.10, 3903.11 සහ 3904.10 සඳහා මෙම බද්ද අදාළ වේ.

**2.4** **මෝටර් වාහන**

2.4.1 මෝටර් වාහන මත අයකළ වටිනාකම පදනම් වූනිෂ්පාදන බද්ද ඉවත් කෙරේ.

2.4.2 පෙට්‍රල් සහ ඩීසල් භාවිත කෙරෙන මෝටර් වාහන සඳහා එංජින් ධාරිතාව මතපමණක් (ඝණ සෙන්ටිමීටර ($cm^3$)) පදනම්ව නිෂ්පාදන බදු අදාළ කෙරේ.

2.4.3 විද්‍යුත් වාහන සඳහා නිෂ්පාදන බදු පදනම වන්නේ එහි එංජිමේ යාන්ත්‍රික බලය වේ. (කිලෝ වොට් (Kw))

2.4.4 පෙට්‍රල් ඉන්ධන සහපෙට්‍රල් දෙමුහුන් මෝටර් කාර් සඳහා එංජින් ධාරිතාව මතනිෂ්පාදන බදු අනුපාත පහත පරිදි වේ.

| එංජින් ධාරිතාව | පෙට්‍රල් ඉන්ධන (ඝණ සෙන්ටිමීටරයට රු.) | පෙට්‍රල් දෙමුහුන් (ඝණ සෙන්ටිමීටරයට රු.) |
|---|---:|---:|
| $\leq 1000cm^3$ | 1,750 | 1,250 |
| $1000cm^3 < x \leq 1300\ cm^3$ | 2,750 | 2,000 |
| $1300cm^3 < x \leq 1500\ cm^3$ | 3,250 | 2,500 |
| $1500cm^3 < x \leq 1600\ cm^3$ | 4,000 | 3,500 |
| $1600cm^3 < x \leq 1800\ cm^3$ | 5,000 | 4,500 |
| $1800cm^3 < x \leq 2000\ cm^3$ | 6,000 | 5,000 |
| $2000cm^3 < x \leq 2500\ cm^3$ | 7,000 | 6,000 |
| $2500cm^3 < x \leq 2750\ cm^3$ | 8,000 | 7,000 |
| $2750cm^3 < x \leq 3000\ cm^3$ | 9,000 | 8,000 |
| $3000cm^3 < x \leq 4000\ cm^3$ | 10,000 | 9,000 |
| $4000\ cm^3 <$ | 11,000 | 10,000 |

2.4.5 ඩීසල් ඉන්ධන සහ ඩීසල් දෙමුහුන් මෝටර් රථ සඳහා එංජින් ධාරිතාව මත නිෂ්පාදන බදු අනුපාත පහත පරිදි වේ.

| එංජින් ධාරිතාව | ඩීසල් ඉන්ධන (ඝණ සෙන්ටිමීටරයට රු.) | ඩීසල් දෙමුහුන් (ඝණ සෙන්ටිමීටරයට රු.) |
|---|---:|---:|
| $\leq 1500cm^3$ | 4,000 | 3,000 |
| $1500cm^3 < x \leq 1600\ cm^3$ | 5,000 | 4,000 |
| $1600cm^3 < x \leq 1800\ cm^3$ | 6,000 | 5,000 |
